# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2379/02 - 2024 අප්‍රේල් මස 08 වැනි සඳුදා - 2024.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/2007(II)

**1961 අංක 31 දරන ආයුර්වේද පනත**

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7(උ), 10 සහ 77 වන වගන්ති සහ VI වැනි කොටස සමග කියවිය යුතු එකී පනතේ 82 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

වෛද්‍ය රමේෂ් පතිරණ,
සෞඛ්‍ය අමාත්‍ය.

2024 අප්‍රේල් මස 03 වැනි දින.
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව සඳහා වන ආයුර්වේද සංග්‍රහය, 2024 යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර (මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2024 අප්‍රේල් 08 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**I වන කොටස**

**ආයුර්වේද ඖෂධ සහ නිෂ්පාදන නියාමන සභාව පිහිටුවීම**

2. (1) (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන), 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ කාර්ය සඳහා (මින්මතු "නියාමන සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයුර්වේද ඖෂධ හා නිෂ්පාදන නියාමන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) නියාමන සභාව (1) වන අනු නියෝගය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

1A - PG 6690 — 104 (2024/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. (මින්මතු "සංග්‍රහය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙම නියෝගවල කාර්ය සඳහා, පනතේ 77 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ඒ) ඡේදවල විධිවිධානවලට අනුකූලව -

(අ) මෙහි I වන උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ මෙයින් "ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ" ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(ආ) මෙහි I වන උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දක්වා ඇති පැළෑටි, මෙයින් "ප්‍රකාශිත ඖෂධීය පැළෑටි" ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

4. නියාමන සභාවේ අරමුණු පහත පරිදි විය යුතු ය:-

(අ) ප්‍රකාශිත ඖෂධීය පැළෑටි වගා කිරීම හා සම්බන්ධ සියලු කාරණා සහ,

(i) ආයුර්වේද වෛද්‍ය කර්මයේ සහ ශල්‍ය කර්මයේ භාවිතා කරනු ලබන්නා වූ; හෝ

(ii) බෙහෙත් වට්ටෝරුවකින් තොරව ඍජුව මිලදී ගත හැකි වන්නා වූ,

යම් ආයුර්වේද නිෂ්පාදනයක් හෝ යම් ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම, සැකසීම, ආනයනය, අපනයනය, මිලදී ගැනීම, ගබඩා කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය, ප්‍රවාහනය, සැපයීම සහ තත්ත්ව පාලනයට සම්බන්ධ සියලු කාරණා නියාමනය කිරීම;

(ආ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවට අවශ්‍ය තාක් දුරට -

(i) ප්‍රකාශිත ඖෂධීය පැළෑටි වගා කිරීම; හෝ

(ii) කංසා, අබිං සහ විෂ වර්ග, ඛනිජ, සත්ත්වජ ද්‍රව්‍ය, භාණ්ඩ හෝ නියාමන සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් අන්තරායකර ඖෂධ නිෂ්පාදනය කිරීමට, සකස් කිරීමට, ආනයනයට (කංසා හැර), අපනයනයට, මිලදී ගැනීමට, ගබඩා කිරීමට, බෙදා හැරීමට, විකිණීමට, ප්‍රචාරණයට, ප්‍රවාහනයට, සැපයීමට හා තත්ත්ව පාලනයට,

අදාළ සියලු කාරණා නියාමනය කිරීම;

(ඇ) ඉහත (අ) හෝ (ආ) ඡේද යටතේ සඳහන් කර ඇති එම ක්‍රියාකාරකම් සිදු කිරීමට, අවශ්‍ය, අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචි කිරීම්, අනුමතය ලබා ගැනීම් හෝ සහතිකපත්‍ර හෝ බලපත්‍ර හෝ අවසරපත්‍ර පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට යටත් ව හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූලව ලබා ගැනීමට සම්බන්ධ සියලු කාරණා හෝ ලියාපදිංචි කිරීමකට, අනුමතයකට අදාළ වන්නා වූ හෝ එවැනි බලපත්‍රයක, සහතිකපත්‍රයක හෝ අවසරපත්‍රයක නිශ්චිතව දක්වා ඇති නියම හෝ කොන්දේසිවලට යටත් ව නිකුත් කිරීමට සම්බන්ධ සියලු කාරණා නියාමනය කිරීම;

(ඈ) ඉහත (ඇ) ඡේදයේ සඳහන් වන ලියාපදිංචිය හෝ අනුමතය ලබාගත් තැනැත්තන් හෝ බලපත්‍ර, සහතිකපත්‍ර සහ අවසරපත්‍ර දරන්නන් විසින් සපයනු ලබන නිෂ්පාදන සහ සේවාවල ප්‍රමිති පවත්වාගෙන යාමේ අරමුණින් ඔවුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පසු විපරම් කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඉ) මෙම කොටස යටතේ ස්ථාපිත -

(i) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව;

(ii) ආයුර්වේද නිෂ්පාදනාගාර සහ ගබඩා ඇගයීමේ කමිටුව;

(iii) ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළඳපල විමර්ශන කමිටුව; හෝ

(iv) ඖෂධීය පැළෑටි ඇගයීම සඳහා වූ නිලධාරීන්ගේ කමිටුව;

ද ඇතුළුව සහ යම් අධිකාරියක් වෙත මෙම සංග්‍රහයේ විෂය පථය යටතේ වන ඕනෑම කරුණක් යොමු කිරීම හා ඒ සඳහා නිර්දේශ ලබා ගැනීම;

(ඊ) වෙළෙඳපොලේ ඇති ඕනෑම ප්‍රකාශිත ආයුර්වේද භාණ්ඩයක, ද්‍රව්‍යයක, ඖෂධයක හෝ ආයුර්වේද නිෂ්පාදනයක ගුණාත්මකභාවය, නිරුපද්‍රිතතාව සහ අහිතකර බලපෑම් පිළිබඳ සමීක්ෂණ සිදුකිරීම;

(උ) නියාමන සභාව විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන සියලුම අනුමත කිරීම්, ලියාපදිංචි කිරීම්, අවසරපත්‍ර, සහතිකපත්‍ර සහ බලපත්‍රවලට අදාළ තොරතුරු ලේඛනගත කිරීම,

වේ.

5. නියාමන සභාව පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන්, එනම් -

(i) (මෙහි මින්මතු "කොමසාරිස්-ජනරාල්" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයුර්වේද කොමසාරිස්-ජනරාල්; සහ

(ii) පනතේ 3 වැනි වගන්තියේ (2) උපවගන්තිය යටතේ පත් කරන ලද ආයුර්වේද අතිරේක කොමසාරිස්-ජනරාල් (ශිල්පීය)ගෙන්; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන්, එනම්-

(i) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අනුයුක්ත පිළිවෙළින් ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා අංශවලින් සුදුසුකම් ලද ආයුර්වේද වෛද්‍යවරුන් සිවුදෙනකුගෙන්;

(ii) ආයුර්වේද, සිද්ධ සහ යුනානි අංශවලින් ද්‍රව්‍ය ගුණ විඥාණය හෝ ආයුර්වේද ඖෂධවේදය යන විෂයයන් සඳහා පිළිගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයක මහාචාර්යවරුන් හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථයින් තිදෙනකුගෙන්;

(iii) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සිවුදෙනකුගෙන්; සහ

(iv) පිළිවෙලින් නීතිය, ගිණුම්කරණය, කළමනාකරණය සහ රසායන විද්‍යාව යන ක්ෂේත්‍ර නියෝජනය කරන හා ඒවායේ විශිෂ්ටත්වය දැක් වූ තැනැත්තන් සිවුදෙනකුගෙන්.

6. (1) කොමසාරිස්-ජනරාල්වරයා නියාමන සභාවේ සභාපතිවරයා විය යුතු ය.

(2) නියාමන සභාවේ සාමාජිකයින් විසින්, ඔවුන් අතරින් එක් සාමාජිකයකු නියාමන සභාවේ උපසභාපතිවරයා ලෙස තෝරා පත් කර ගත යුතු ය.

(3) නියාමන සභාවේ සභාපතිවරයා හෝ ඔහු නොමැති අවස්ථාවක, නියාමන සභාවේ උප සභාපතිවරයා නියාමන සභාවේ යම් රැස්වීමක මුලසුන දැරිය යුතු ය.

(4) නියාමන සභාවේ සභාපතිවරයා සහ උප සභාපතිවරයා සභාවේ යම් රැස්වීමකට පැමිණ නොමැති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයින් විසින්, ඔවුන් අතරින් තෝරා පත් කර ගනු ලැබූ යම් සාමාජිකයකු නියාමන සභාවේ එකී රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

7. නියාමන සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් නව දෙනෙකු විය යුතු ය.

8. (1) ආයුර්වේද අතිරේක කොමසාරිස්-ජනරාල් (ශිල්පීය) නියාමන සභාවේ ලේකම්වරයා විය යුතු අතර ඔහු, නියාමන සභාවේ සාමාන්‍ය විධානයට යටත්ව, නියාමන සභාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(2) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ශිල්පීය අංශයේ නිලධාරීන් සහ සේවකයින්, අවශ්‍ය පරිදි, පනත යටතේ නියාමන සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ ලා නියාමන සභාවට සහාය විය යුතු ය.

9. යම් තැනැත්තකු -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකු වීම අවසන් වන්නේ නම්;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත්වන්නේ නම්;

(ඇ) නියාමන සභාවේ සාමාජිකයකු වශයෙන් ඔහු විසින් ඉටු කළ යුතු කර්තව්‍ය ඉටු කිරීමට බලපෑ හැකි ආකාරයේ යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවයක් එම තැනැත්තාට පවතින්නේ නම්;

(ඈ) ඖෂධ නිෂ්පාදන කර්මාන්තයේ නියැළි ආයතනයක හිමිකාරිත්වයක් දරන්නේ නම්;

(ඉ) පෞද්ගලික ඖෂධ නිෂ්පාදන කර්මාන්තයේ නියැලි, රාජ්‍ය නොවන යම් ආයතනයක යම් සේවයක නියුක්ත හෝ උපදේශන සේවාවක නිරතව සිටින්නේ නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන යම් නීතියක් යටතේ සිහිවිකල් හෝ සිහිමද තැනැත්තකු බවට හෝ ප්‍රකාශ කර ඇත්නම්;

(උ) එකී තැනැත්තා නිදහස් නොකළ බුන්වත්භාවයට පත්වූවෙක් ලෙස නම් කර ඇත්නම්; හෝ

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අධිකරණයක් විසින් පනවනු ලැබූ සිර දඬුවමක් විඳිමින් සිටින හෝ සිරදඬුවම් විඳින ලද තැනැත්තකු නම්,

නියාමන සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ කටයුතු කිරීමට එකී තැනැත්තා නුසුදුස්සකු වනු ඇත.

10. නියාමන සභාවට පත් කරන ලද සෑම සාමාජිකයකු ම, මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, වසර තුනක කාලයක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර ධුරයෙන් ඉවත් නොකළහොත් මිස, අනුයාත හෝ අන්‍යාකාරයෙන් වන තවත් එක් වරකට නොවැඩි වාරයකට නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

11. (1) නියාමන සභාවට පත් කරන ලද යම් සාමාජිකයකුට, ඕනෑම අවස්ථාවක, අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගත් දින සිට බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරන ලද ඕනෑම සාමාජිකයකු හේතු දක්වා, එකී තනතුරෙන් ඉවත් කළ හැකි ය. තනතුරෙන් ඉවත් කරන ලද එවැනි සාමාජිකයකු නියාමන සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත්කිරීමට හෝ වෙනත් කිසිදු තනතුරකින් නියාමන සභාවේ සේවය කිරීමට සුදුසුකම් නොලබන්නේ ය.

(3) පත් කරන ලද යම් සාමාජිකයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් පුරප්පාඩු වන ධුරයට අමාත්‍යවරයා විසින්, 5 (ආ) ඡේදය අනුව, එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කළ හැකි අතර එසේ පත්කරනු ලබන තැනැත්තා එකී අනුප්‍රාප්ත වන්නා වූ තැනැත්තාගේ නොගෙවී ඇති ධුර කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

(4) නියාමන සභාවට පත් කරන ලද කිසියම් සාමාජිකයකුට රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් මත තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ මාස තුනකට නො අඩු කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර වන්නේ නම්, අමාත්‍යවරයා විසින් 5 වන නියෝගයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, එම සාමාජිකයා නොමැති කාලය තුළ ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් යම් පුද්ගලයකු පත් කළ යුතු ය.

(5) නියාමන සභාවට පත් කරන ලද කිසියම් සාමාජිකයකු සභාපතිවරයාට නොදන්වා සභාවේ අනුයාත රැස්වීම් තුනකට සහභාගී වීමට අපොහොසත් වන්නේ නම්, එකී සාමාජිකයා නොපැමිණෙන එකී තුන්වන අනුයාත රැස්වීම අවසානයේ ඔහු ධුරය හිස් කළා සේ සලකනු ලැබිය යුතු අතර, එසේ පුරප්පාඩු වූ ධුරයට අමාත්‍යවරයා විසින්, 5 වන නියෝගයේ සලසා ඇති ආකාරයට වෙනත් අයෙකු පත්කරනු ලැබිය යුතු ය.

12. (1) පනතේ විධිවිධානවලට යටත්ව, නියාමන සභාව විසින් නියාමන සභාවේ කටයුතු පරිපාලනයට අදාළව, පහත කාරණා ද ඇතුළුව යම් කාරණාවක් සම්බන්ධයෙන් රීති සම්පාදනය කළ හැකි ය :-

(අ) නියාමන සභාවේ රැස්වීම් සහ එකී රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් නියාමන සභාවේ කාර්ය පටිපාටිය විධිමත් කිරීම;

(ආ) (i) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව;

(ii) ආයුර්වේද නිෂ්පාදනාගාර සහ ගබඩා ඇගයීමේ කමිටුව;

(iii) ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළඳපොළ විමර්ශන කමිටුව; සහ

(iv) ඖෂධීය පැළෑටි ඇගයීම සඳහා වූ නිලධාරීන්ගේ කමිටුව,

වෙත යොමු කරනු ලබන යම් කාරණයකට අදාළ කාර්ය පටිපාටිය විධිමත් කිරීම.

(2) නියාමන සභාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම පනතේ 49 වැනි වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් විය යුතු ය.

13. නියාමන සභාවේ බලතල සහ කර්තව්‍ය පහත පරිදි විය යුතු ය:-

(අ) (i) ප්‍රකාශිත ඖෂධීය පැළෑටි වගා කිරීම සහ මෙහි ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම, සකස් කිරීම, මිලදී ගැනීම, ගබඩා කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය, ප්‍රවාහනය, සැපයීම සහ සංයෝජනය කිරීම;

(ii) ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් ආනයනය කිරීම සහ අපනයනය කිරීම;

(iii) කංසා වගා කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම ද වෙනත් පනතකින් හෝ නීතියකින් වගා කිරීම, ආනයනය, අපනයනය, ප්‍රවාහනය, විකිණීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම සීමා කර ඇත්තා වූ කංසා යෙදූ ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ සහ ආයුර්වේද නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීම, අපනයනය, ගබඩාකිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය සහ විකිණීම; සහ

(iv) වෙනත් පනතක් හෝ නීතියක් මගින් ආනයනය, අපනයනය, විකිණීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම සීමා කර ඇති අබිං ඇතුළු ඕනෑම අන්තරායකර ඖෂධයක්, නිස්සාරණය කරන ලද පරිපාක ස්ප්‍රීතු හෝ ඕනෑම විෂ වර්ගයක්, ඛනිජ ද්‍රව්‍ය හෝ සත්ත්වජ ද්‍රව්‍යයක්, අවස්ථාවෝචිත පරිදි, ආනයනය, අපනයනය, විකිණීම, ගබඩාකිරීම හෝ බෙදා හැරීම;

(v) ආයුර්වේද නිෂ්පාදනයක් හෝ ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යක් හෝ ඖෂධයක් ඍජුවම හෝ වක්‍රව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විවෘත වෙළෙඳපොළ හරහා අලෙවි කළ හැකි ආයුර්වේද නිෂ්පාදනයක්, හෝ ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් පිළිබඳ සමාජ මාධ්‍ය ඇතුළු මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යවල ප්‍රචාරණය කිරීම,

ඇතුළුව පනතේ 77(1) වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති අනුමත කිරීම්, ලියාපදිංචි කිරීම් හෝ සහතිකපත්‍ර හෝ බලපත්‍ර හෝ අවසරපත්‍ර අවශ්‍ය වන කාරණා සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, අනුමත කිරීම් හෝ ලියාපදිංචි කිරීම සිදු කිරීම හෝ සහතිකපත්‍ර, බලපත්‍ර හෝ අවසරපත්‍ර නිකුත් කිරීම;

(ආ) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුවේ සහ ආයුර්වේද නිෂ්පාදනාගාර සහ ගබඩා ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ අරමුණු සඳහා -

(i) ආයුර්වේද පනත යටතේ යම් ආයුර්වේද නිෂ්පාදනයක්;

(ii) ආයුර්වේද පනත යටතේ යම් ආයුර්වේද නිෂ්පාදනාගාරයක්;

(iii) ආයුර්වේද පනත යටතේ යම් ආයුර්වේද ඔසුසලක්;

(iv) ආයුර්වේද පනත යටතේ වන ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් බෙදාහරින්නකු; හෝ

(v) ආයුර්වේද පනත යටතේ වන ආයුර්වේද ගබඩාවක්,

ලියාපදිංචි කිරීම;

(ඇ) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත, වෛද්‍ය නිර්දේශයකින් තොරව විවෘත වෙළෙඳපොලෙන් ලබාගත හැකි යම් ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් මිනිස් පරිභෝජනයට යොදාගැනීම සුදුසු වන බවට දක්වාලීම සඳහා වන උපදෙස්, මාර්ගෝපදේශ සහ රීති පැනවීම;

(ඈ) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත, ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ භාවිතා කරන ප්‍රකාශිත ඖෂධ පැළෑටි වගා කිරීම සඳහා සහ ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හා ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදන ආනයනය, අපනයනය, ගබඩා කිරීම, ප්‍රවාහනය, විකිණීම, බෙදා හැරීම සහ සංයෝජනය කිරීම සඳහා උපදෙස්, මාර්ගෝපදේශ සහ රීති පැනවීම;

(ඉ) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත, මෙහි ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ භාවිතා කරන ප්‍රකාශිත පැළෑටි වගා කිරීම සහ අබිං, කංසා, නිස්සාරණය කරන ලද පරිපාක ස්ප්‍රීතු, අන්තරායකර ඖෂධ, විෂ වර්ග , ඛනිජ සහ සත්ත්වජ ද්‍රව්‍ය ඇතුළු ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හා ඖෂධ සහ ආයුර්වේද නිෂ්පාදන, ආනයනය, අපනයනය, ගබඩා කිරීම, ප්‍රවාහනය, විකිණීම, බෙදා හැරීම සහ සංයෝජනය කිරීම සඳහා උපදෙස්, මාර්ගෝපදේශ සහ රීති පැනවීම;

(ඊ) ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධවලට අදාළ ප්‍රමිති සකස් කිරීම, ඒකාබද්ධ කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම;

(උ) මෙම සංග්‍රහය යටතේ ලියාපදිංචි කිරීම, අනුමත කිරීම හෝ සහතික පත්‍ර, බලපත්‍ර හෝ අවසරපත්‍ර නිකුත් කිරීම් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ, රීති සහ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඌ) (i) නිෂ්පාදනාගාර සහ ගබඩා පරීක්ෂා කිරීම; සහ

(ii) නියාමන සභාව විසින් නිර්දේශ කරනු ලබන තත්ත්ව සහ ප්‍රමිති පවත්වාගෙන යාම සහතික කිරීමට වෙළෙඳපොලේ ඇති ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදනවල තත්ත්ව සහ ප්‍රමිති පරීක්ෂා කිරීම,

සඳහා ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව, ආයුර්වේද නිෂ්පාදනාගාර සහ ගබඩා ඇගයීම් කමිටුව හෝ ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළෙඳපොළ විමර්ශන කමිටුව වෙත උපදෙස් නිකුත් කිරීම;

(එ) (i) වගා බිම් සහ ගබඩා පරීක්ෂා කිරීම; සහ

(ii) නියාමන සභාව විසින් නිර්දේශ කරනු ලබන තත්ත්ව සහ ප්‍රමිති පවත්වාගෙන යාම සහතික කිරීමට ප්‍රකාශිත ඖෂධීය පැළෑටි, බෝග වගා කරනු ලබන ක්ෂේත්‍රවල සහ එම බෝග වලින් සාදන ලද ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදනවල තත්ත්වය සහ ප්‍රමිති පරීක්ෂා කිරීම,

සඳහා ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව, ආයුර්වේද නිෂ්පාදනාගාර සහ ගබඩා ඇගයීමේ කමිටුව හෝ ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළඳපල විමර්ශන කමිටුව හෝ ඖෂධීය පැළෑටි ඇගයීම සඳහා වූ නිලධාරීන්ගේ කමිටුව වෙත උපදෙස් නිකුත් කිරීම;

(ඒ) ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළඳපල විමර්ශන කමිටුවේ යම් වාර්තාවක් අනුව කරන ලද අනුමත කිරීම්, ලියාපදිංචි කිරීම් හෝ නිකුත් කරන ලද සහතිකපත්‍ර, බලපත්‍ර හෝ අවසරපත්‍ර තාවකාලිකව අත්හිටුවීම හෝ අවලංගු කිරීම;

(ඔ) විවෘත වෙළඳපොලේ විකිණීමට ඇති ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධවල මිනිස් පරිභෝජනයට අවශ්‍ය නිරුපද්‍රිත ක්‍රියාකාරිත්වය, තත්ත්වය සහ ස්ථාවරත්වය පිළිබඳව විමසීමට පියවර ගැනීමෙන් පසු, ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළෙඳපල විමර්ශන කමිටුව විසින් කරන ලද නිර්දේශයන්ට අනුකූලව මහජන සෞඛ්‍යය සහතික කිරීම සහ එවැනි ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් සම්බන්ධයෙන් පළ කරනු ලබන යම් වෙළෙඳ දැන්වීම් සඳහා පූර්ව ලිඛිත අනුමැතිය ලබාදීම;

(ඔ) ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක්, දේශීය නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ආනයනය සඳහා නියාමන සභාව යටතේ ලියාපදිංචි නිෂ්පාදනාගාරයක් විසින් කරනු ලබන ඉල්ලීම මත එකී භාණ්ඩ ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කිරීම සඳහා අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිර්දේශ නිකුත් කිරීම;

(ක) ප්‍රකාශිත භාණ්ඩයක, ද්‍රව්‍යයක හෝ ඖෂධයක ප්‍රමිති, නිරූපදිත මෙහෙයුම් සහ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා සුදුසුකම් ලත් දේශීය හා විදේශීය රසායනාගාර ප්‍රකාශයට පත් කිරීම;

(ග) නියාමන සභාවේ අරමුණු ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් යම් කමිටුවක් හෝ කමිටු පත් කිරීම;

(ච) මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය සහිතව නියාමන සභාව විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු තීරණය කිරීම;

(ජ) නිෂ්පාදකයින්, ආනයනකරුවන්, අපනයනකරුවන්, තොග වෙළඳුන්, සිල්ලර ඖෂධවේදීන්, ඖෂධ නිර්දේශ කරන්නන්, බෙදාහරින්නන් සහ එක් ආයුර්වේද නිෂ්පාදනයක් හෝ නිෂ්පාදන සමූහයක හෝ මිල තීරණය කිරීමට සහාය විය හැකි ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් රටක යම් ආයුර්වේද නිෂ්පාදනයක් නිෂ්පාදනයට හෝ විකිණීමට සම්බන්ධ වෙනත් අයකු පිළිබඳ තොරතුරු සහ දත්ත ලබා ගැනීම;

(ට) ආයුර්වේද නිෂ්පාදනයක හෝ නිෂ්පාදන සමූහයක පවත්නා මිල අඩු කිරීම හෝ වැඩි කිරීම හෝ පවතින මිල පවත්වාගෙන යාමට අදාළ බලධාරීන් විමසා සාකච්ඡා කර අදාළ නිෂ්පාදනාගාර වෙත නිර්දේශ කිරීම;

(ඩ) යම් ආයුර්වේද නිෂ්පාදනයක මිල උච්චාවචනයන්, අවශ්‍ය අවස්ථාවල දී, අධීක්ෂණය කිරීම;

(ණ) ශ්‍රී ලංකාව තුළ යම් ආයුර්වේද නිෂ්පාදනයක හෝ එවැනි නිෂ්පාදන සමූහයක භාවිතය පිළිබඳ දත්ත රැස්කිරීම;

(ත) නිෂ්පාදනාගාර වෙත, යම් ආයුර්වේද නිෂ්පාදනයක් හඳුන්වාදීමේ මිල සහ උපරිම සිල්ලර මිල තීරණය කිරීමේ ක්‍රම සහ එකී නිෂ්පාදනයේ මිල සංශෝධන පිළිබඳ නිර්දේශ කිරීම සහ එකී නිෂ්පාදනයේ මිල නියම කිරීම සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව උපදෙස් ලබාදීම;

(ද) මිල සංශෝධනයට යටත් වන යම් ආයුර්වේද නිෂ්පාදනයක් පිළිබඳව කලින් කල සැලකිල්ල යොමු කිරීම;

(න) මෙම සංග්‍රහය යටතේ වගා කරන ප්‍රකාශිත ඖෂධීය පැළෑටිවල යම් ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම;

(ප) 12 වන නියෝගයේ සඳහන් කාරණා සම්බන්ධයෙන් රීති සම්පාදනය කිරීම; සහ

(බ) පොදුවේ, නියාමන සභාවෙහි කර්තව්‍යයන් යථා පරිදි ඉටු කිරීම සඳහා පහසුකම් සලසන්නා වූ පනත සහ මේ නියෝග මගින් බලය පවරන ලද වෙනත් කටයුතු සහ දේවල් ඉටුකිරීම,

වේ.

14. (1) නියාමන සභාවේ මුද්‍රාව -

(අ) නියාමන සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර නියාමන සභාව තීරණය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) නියාමන සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය; සහ

(ඇ) නියාමන සභාවේ අවසරය මත සහ තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් යම් සාධනපත්‍රයකට හෝ ලේඛනයකට අත්සන් තබනු ලැබිය යුතු වූ නියාමන සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, යම් සාධනපත්‍රයකට හෝ ලේඛනයකට හෝ නොතැබිය යුතු ය.

(2) නියාමන සභාව විසින්, නියාමන සභාවේ මුද්‍රාව තබනු ලබන සාධනපත්‍ර සහ ලේඛන පිළිබඳ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

(3) මේ නියෝග යටතේ කිසියම් ලියාපදිංචි කිරීමක්, අනුමත කිරීමක්, සහතික පත්‍රයක්, බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් නිකුත් කිරීමේ දී, නියාමන සභාවේ මුද්‍රාව, සභාපතිවරයාගේ නිල මුද්‍රාව සහ ලේකම්වරයාගේ නිල මුද්‍රාව එම බලපත්‍රයට හෝ අවසර පත්‍රයට තැබිය යුතු ය.

15. නියාමන සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු තම රාජකාරියට එළඹීමට පෙර, නියාමන සභාවේ කටයුතු හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් දැඩි රහස්‍ය භාවය රැකීමට ප්‍රතිඥා දී ප්‍රකාශයකට අත්සන් කළ යුතු අතර එකී ප්‍රකාශය මගින් -

(අ) යම් නෛතික අධිකරණය විසින් එසේ කළ යුතු යැයි නියම කරනු ලැබ ඇති විට; හෝ

(ආ) පනතේ යම් විධිවිධානයකට හෝ මේ නියෝගවලට අනුකූල වීම සඳහා,

හැර, තම කර්තව්‍ය ඉටු කිරීමේ දී දැනගන්නා යම් කරුණක් හෙළිදරවු නොකරන බවට ප්‍රතිඥා දිය යුතු ය.

16. (1) නියාමන සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) නියාමන සභාව විසින්, නියාමන සභාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලුම මූල්‍ය ගනුදෙනු පිළිබඳව නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(3) නියාමන සභාවෙහි ගිණුම් විගණනය සම්බන්ධයෙන් රාජ්‍ය සංස්ථා ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) නියාමන සභාවේ කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී දරනු ලබන සියලුම වියදම් ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු ය.

(5) නියාමන සභාව විසින් රැස් කරනු ලබන සියලුම ආදායම්, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(6) පනතේ 45 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නියාමන සභාවේ සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

17. (1) අවස්ථාවෝචිත පරිදි, ප්‍රකාශිත ඖෂධ පැළෑටි වගා කිරීම, ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් ආනයනය කිරීම, අපනයනය කිරීම, ගබඩා කිරීම, විකිණීම, බෙදාහැරීම සහ සංයෝජනය කිරීම සම්බන්ධයෙන් නියාමන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීමට වගකිව යුතු (මින් මතු "තාක්ෂණික කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය.

(2) තාක්ෂණික කමිටුව-

(අ) නිල බලයෙන් පත් විය යුතු එක් සාමාජිකයකු ආයුර්වේද අතිරේක කොමසාරිස් ජනරාල්වරයා (ශිල්පීය); සහ

(ආ) 5 (ආ) නියෝගය යටතේ නියාමන සභාවට පත් කරන ලද සාමාජිකයින් අතරින් නියාමන සභාවේ සභාපති විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් අට දෙනෙකු,

ගෙන් සමන්විත විය යුතුය.

(3) ආයුර්වේද අතිරේක කොමසාරිස්-ජනරාල්වරයා (ශිල්පීය) තාක්ෂණික කමිටුවෙහි සභාපතිවරයා විය යුතු ය. තාක්ෂණික කමිටුවෙහි සාමාජිකයින් විසින්, ඔවුන් අතරින් එක් සාමාජිකයකු, කමිටුවේ ලේකම් ලෙස තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(4) තාක්ෂණික කමිටුවෙහි යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් පස් දෙනකු විය යුතු ය.

18. තාක්ෂණික කමිටුවෙහි බලතල සහ කර්තව්‍ය වනුයේ -

(අ) ආයුර්වේද නිෂ්පාදනවල නියමිත ප්‍රමිති පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම;

(ආ) එයට යොමු කර ඇති ඉල්ලීම් ඇගයීමට ලක් කිරීම සහ සංග්‍රහය යටතේ ලියාපදිංචි කිරීම, අනුමත කිරීම, බලපත්‍ර, සහතිකපත්‍ර හෝ අවසරපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) එවැනි ලියාපදිංචි කිරීම්, අනුමත කිරීම්, බලපත්‍ර, සහතිකපත්‍ර හෝ අවසරපත්‍ර අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව නියාමන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඈ) ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධවල හා ආයුර්වේද නිෂ්පාදවල ප්‍රමිති සහ තත්ත්ව සම්බන්ධයෙන් අදාළ අංශවලින් වාර්තා ලබා ගැනීම සහ නිර්දේශ නිකුත් කිරීම; සහ

(ඉ) මෙම සංග්‍රහයේ අරමුණු සඳහා නියාමන සභාව විසින් එය වෙත යොමු කරන ලද වෙනත් යම් කාරණාවක් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

19. (1) ප්‍රකාශිත භාණ්ඩයක, ද්‍රව්‍යයක හෝ ඖෂධයක නිෂ්පාදනාගාරයකට හෝ මෙම සංග්‍රහය යටතේ ප්‍රකාශිත යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් ආනයනය හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් එකී නිෂ්පාදනාගාරය, ආනයනකරු හෝ අපනයනකරු විසින් අනුකූල විය යුතු යම් ප්‍රමිති සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමක් සිදු කිරීමට හෝ අදාළ අනුමතයක්, බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් හෝ සහතිකපත්‍රයක් ලබාදීමට ප්‍රථමයෙන්, නියාමන සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම වගකීම විය යුතු, (මෙහි මින් මතු "ඇගයීමේ කමිටුව ලෙස සඳහන් කරනු ලබන) ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සහ ගබඩා ඇගයීමේ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඇගයීමේ කමිටුව -

(අ) එහි සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු නිල බලයෙන් පත්වන ආයුර්වේද අතිරේක කොමසාරිස්-ජනරාල්වරයා (ශිල්පීය); සහ

(ආ) 5(ආ) නියෝගය යටතේ නියාමන සභාවට පත් කරන ලද සාමාජිකයින් අතරින් තෝරාගත් සාමාජිකයින් තිදෙනකු ඇතුළුව නියාමන සභාවේ නිර්දේශය මත නියාමන සභාවේ සභාපතිවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් හය දෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(3) ඇගයීමේ කමිටුව විසින්, එහි සාමාජිකයින් අතරින් එක් සාමාජිකයකු, කමිටුවේ ලේකම් ලෙස තෝරා පත්කර ගත යුතු ය.

(4) ඇගයීමේ කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් හතර දෙනකු විය යුතු ය.

20. ඇගයීමේ කමිටුවේ බලතල සහ කර්තව්‍ය වනුයේ -

(අ) ලියාපදිංචිය හෝ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර යොමු කර ඇති නිෂ්පාදනාගාරවල ස්ථානීය පරීක්ෂා සිදු කිරීම සහ ඒවා සම්බන්ධයෙන් නියාමන සභාවට නිර්දේශ නිකුත් කිරීම;

(ආ) නියාමන සභාවේ හෝ තාක්ෂණික කමිටුවේ උපදෙස් පරිදි බලපත්‍රලාභී නිෂ්පාදනාගාර වැටලීම් සහ ඒවායේ හදිසි පරීක්ෂා සිදු කිරීම; සහ

(ඇ) ස්ථාන පරීක්ෂාවක දී, වැටලීමක දී හෝ පරීක්ෂාවක දී අවධානයට ලක් වූ හෝ අනාවරණය කරගත්තා වූ බලපත්‍රලාභී නිෂ්පාදනාගාරයක ප්‍රධාන වෛද්‍ය නිලධාරියාගේ හෝ වෙනත් කාර්යමණ්ඩල සාමාජිකයකුගේ යම් විෂමාචාරයක්, පිළිබඳව නියාමන සභාවට වාර්තා කිරීම,

වේ.

21. (1) මින් මතු "විමර්ශන කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයුර්වේද නිෂ්පාදනාගාර, ගබඩා සහ වෙළෙඳපල විමර්ශනය සඳහා කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය. එය -

(අ) සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු වන නිල බලයෙන් පත්වන ආයුර්වේද අතිරේක කොමසාරිස්-ජනරාල්වරයා (ශිල්පීය); සහ

(ආ) කොමසාරිස්-ජනරාල් විසින් නාම යෝජිත ආයුර්වේද වෛද්‍යවරුන් හතර දෙනකු ඇතුළුව නියාමන සභාවේ නිර්දේශය මත නියාමන සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් හය දෙනකු,

ගෙන් සමන්විත විය යුතු ය.

(2) විමර්ශන කමිටුවේ සාමාජිකයින්, ඔවුන් අතරින් එක් සාමාජිකයකු එකී කමිටුවේ ලේකම් ලෙස තෝරා පත් කර ගත යුතු ය.

(3) විමර්ශන කමිටුවෙහි යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් හතර දෙනකු විය යුතු ය.

22. විමර්ශන කමිටුවේ බලතල සහ කර්තව්‍ය වනුයේ -

(අ) සිය මෙහෙය වීමෙන්ම හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරන ලද පැමිණිල්ලක් හෝ ඉල්ලීමක් මත -

(i) යම් ප්‍රකාශිත ඖෂධීය පැළෑටියක් වගා කිරීම;

(ii) නිෂ්පාදනාගාර, ගබඩා සහ ඔසුසල්;

(iii) ප්‍රකාශිත යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් බෙදා හැරීම, ප්‍රවාහනය, අපනයනය සහ ආනයනය;

සඳහා මෙම සංග්‍රහය යටතේ බලපත්‍රය නිකුත් කරනු ලැබූ අනුමත කිරීමක්, ලියාපදිංචි කිරීමක් හෝ නිකුත් කරනු ලැබූ අවසරපත්‍රයක්, සහතිකපත්‍රයක් හෝ බලපත්‍රයක් සම්බන්ධයෙන් එකී අනුමත කිරීම, ලියාපදිංචි කිරීම, අවසරපත්‍රය, සහතිකපත්‍රය හෝ බලපත්‍රය නිකුත් කිරීමට පෙර හෝ පසුව පරීක්ෂණ, වැටලීම් සහ විමර්ශන සිදුකිරීම;

(ආ) වෙළඳපොළෙහි ඇති ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධවල තත්ත්ව පරීක්ෂා කිරීම සහ ඒ අනුව නියාමන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

23. (1) (අ) කංසා වගා කිරීම සහ අස්වනු නෙලීම සම්බන්ධ ව්‍යාපෘති වාර්තා ඇගයීම හා නිර්දේශ කිරීම සඳහා ; සහ

(ආ) කංසා සම්බන්ධ ව්‍යාපෘතිවලට ආරක්ෂාව සැපයීමට සහ ඇගයීමට අදාළ කාරණා පිළිබඳ ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ නියාමන සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා -

(මින් මතු "ඖෂධීය පැළෑටි ඇගයීමේ කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ඖෂධීය පැළෑටි ඇගයීම සඳහා වූ නිලධාරීන්ගේ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඖෂධීය පැළෑටි ඇගයීමේ කමිටුව -

(අ) එහි සභාපතිවරයා ලෙස කටයුතු කළ යුතු ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා;

(ආ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නාමයෝජිත ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකු;

(ඇ) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ පත්කරනු ලබන සුරාබදු කොමසාරිස් ජනරාල් හෝ ඔහුගේ නාමයෝජිතයකු;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන පොලිස්පතිවරයා හෝ ඔහුගේ නාමයෝජිතයකු;

(ඉ) 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 6 වන වගන්තිය යටතේ පත් කරනු ලබන ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහුගේ නාමයෝජිතයකු;

(ඊ) ආයුර්වේද අතිරේක කොමසාරිස්-ජනරාල් (ශිල්පීය); සහ

(උ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු නියාමන සභාවේ සාමාජිකයින් තිදෙනකු,

ගෙන් සමන්විත විය යුතුය.

(3) ඖෂධීය පැළෑටි ඇගයීමේ කමිටුවෙහි යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් පස් දෙනකු විය යුතුය.

## II වන කොටස

### යම් ප්‍රකාශිත භාණ්ඩයක, ද්‍රව්‍යයක හෝ ඖෂධයක නිෂ්පාදනාගාරයක් සඳහා බලපත්‍ර

24. (1) මෙම නියෝග යටතේ නියාමන සභාව විසින් වලංගු ව්‍යාපාර ලියාපදිංචි නාමයක් යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් සහිතව මිස, ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනයේ නියැලීම සඳහා නිෂ්පාදනාගාරයක මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම හෝ එවැනි ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම හෝ කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) "ආයුර්වේද" හෝ "ඖෂධීය සාර" යන පදයක් යම් ලියාපදිංචි ව්‍යාපාර නාමයක ඇතුළත්වේ ද, එකී ව්‍යාපාරය මේ නියෝගවලට අදාළවන බලපත්‍රයක් ලබා ගැනීමට පෙරාතුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය.

(3) බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථමයෙන් අවශ්‍ය අවස්ථාවල දී, යම් නිෂ්පාදනාගාරයක් අදාළ අධිකාරීන් වෙතින් නිකුත් කරන ලද වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් (EPL), පාරිසරික බලපෑම් තක්සේරුව වාර්තාව (EIA) හෝ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව (IEE) ලබා ගත යුතු ය.

25. (1) නියමිත දිනට හෝ ඊට පසුව, ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කරනු ලබන ඕනෑම නිෂ්පාදනාගාරයක් ලියාපදිංචි කිරීම සඳහා වන සෑම ඉල්ලීමක් ම, මෙහි II වන උපලේඛනයේ A ආකෘතියෙන් නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) සෑම ඉල්ලුම්කරුවෙක් ම-

(අ) ඔහුගේ නිෂ්පාදනාගාරය-

(i) ප්‍රමාණවත් තරම් ඉඩකඩ සහ වාතාශ්‍රයෙන් යුක්ත වීම;

(ii) නිෂ්පාදන ක්‍රියාවලියේ ආරක්ෂාව සඳහා මායිම් තාප්පයකින් ආවරණය කර තිබීම;

(iii) සතුන් සහ පක්ෂීන් ඇතුළුවීම සම්පූර්ණයෙන්ම වැළැක්වීම සහ සතුන් සහ පක්ෂීන්ගෙන් ආරක්ෂා කිරීම;

(iv) ගංවතුර සහ අනෙකුත් ස්වභාවික විපත්වලට නිරන්තරයෙන් ගොදුරු විය හැකි ස්ථානයක පිහිටා නොතිබීම;

(v) විවෘත කසළ බැහැර කරන ස්ථාන සහ පොදු වැසිකිළි ආසන්නයේ නොමැති වීම;

(vi) නියාමන සභාව විසින් නිෂ්පාදනාගාර ආසන්නයේ පිහිටා තිබීමට නුසුදුසු ලෙස තීරණය කර ඇති, කර්මාන්තශාලා, කෘෂි රසායන අලෙවි ස්ථාන, රසායනික මිශ්‍ර කිරීමේ ස්ථාන, අවමංගල්‍යාගාර සහ වාහන සේවා ස්ථාන ආදී ස්ථානවලින් බැහැරව ස්ථාපිත කර තිබීම,

සහතික කරලීම සඳහා සියලු පූර්වාරක්ෂක පියවර ගත යුතු ය;

(ආ) ඔහුගේ නමින් බලයලත් ආයතනයක් මඟින් නිකුත් කරනු ලබන ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් ලබාගෙන තිබිය යුතු ය;

(ඇ) ඔහු සහ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකු අතර වසර තුනකට නොඅඩු කාලයක් සඳහා වලංගු ගිවිසුමක් ඇති කරගෙන තිබිය යුතු ය; සහ

(ඈ) නිෂ්පාදනාගාරය සම්බන්ධයෙන් නියාමන සභාව විසින් අවශ්‍ය යැයි සැලකෙන වෙනත් අනුමැතීන් ලබා ගෙන තිබිය යුතු ය.

(3) (2) වන අනුනියෝගයට අනුකූල වූ සෑම ඉල්ලුම්කරුවකුට ම, භූමි සැලැස්ම, යෝජිත ගොඩනැගිලි සැලැස්ම සහ යෝජිත නිෂ්පාදන කම්හලෙහි නිෂ්පාදනය කිරීමට අදහස් කරනු ලබන ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ පිළිබඳ විස්තර සහ යෝජිත නිෂ්පාදනාගාරයේ ඇති උප ඒකක ඇතුළුව විස්තර නියාමන සභාව විසින් කලින් කළට නිකුත් කරනු ලබන මාර්ගෝපදේශවලට අනුව සහ නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන සැකසුම් ගාස්තුවක් සහ අවශ්‍ය ලේඛන ද සමඟ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ හැකි ය.

26. (1) යෝජිත නිෂ්පාදනාගාරය අනුමත කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය ලැබීමෙන් පසු, නියාමන සභාව විසින්, එකී ඉල්ලීම ලැබීමෙන් පසු එළඹෙන ඊළඟ රැස්වීමේ දී-

(අ) නිර්දේශය සඳහා ඉල්ලීම තාක්‍ෂණික කමිටුව වෙත හෝ එම තාක්‍ෂණික කමිටුව විසින් අනුමත කරන ලද වෙනත් ආයතනයකට යොමු කිරීම; හෝ

(ආ) ඒ සඳහා හේතු දක්වා ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම,

කළ යුතුය.

(2) නියාමන සභාවට තාක්ෂණික කමිටුවේ නිර්දේශ ලැබීමෙන් පසු සහ අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක, ඉල්ලුම්කරුගෙන් එම නිර්දේශවල නිශ්චිතව දක්වා ඇති කාරණාවක් හෝ කාරණා සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකි ය.

(3) ඉල්ලුම්කරු විසින් සපයනු ලබන තොරතුරු සලකා බැලීමෙන් පසු සහ නියාමන සභාව විසින් නිර්දේශ කරන ලද යහපත් නිෂ්පාදන පිළිවෙත් සඳහා වන සියලුම මාර්ගෝපදේශවලට අනුකූලව නිෂ්පාදනාගාරය කටයුතුකර ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු, නියාමන සභාව විසින්-

(අ) (i) මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ගාස්තුව ගෙවීමෙන් පසු ලියාපදිංචි අංකයක් සහිතව ඉල්ලුම්කරුට අදාළ බලපත්‍රය නිකුත් කිරීම; හෝ

(ii) නියාමන සභාව විසින් වාර්තා කළ යුතු හේතු මත එම බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම,

කළ යුතුය;

(ආ) (අ) ඡේදයේ (i) අනුඡේදය යටතේ ඉල්ලුම්කරු වෙත බලපත්‍රයක් නිකුත් කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ නිෂ්පාදනයට සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය යම් යන්ත්‍රෝපකරණ සහ අමුද්‍රව්‍ය ලබා ගැනීමේ හෝ ආනයනය කිරීමේ කාර්යය සඳහා අදාළ බලධාරීන් වෙත නිර්දේශ සහිත යම් ලිපියක් හෝ ලිපි නිකුත් කිරීමට හැකි ය.

27. අවශ්‍යතා සම්පූර්ණකර නොතිබීම හේතුවෙන් ප්‍රතික්ෂේප වූ යම් ඉල්ලීමක් සම්බන්ධයෙන්, ඉල්ලුම්කරුට, අදාළ අවශ්‍යතා සපුරාලීමෙන් පසු බලපත්‍රයක් නිකුත් කරන ලෙස ඉල්ලා නියාමන සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

28. මෙහි 26 වන නියෝගය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම-

(අ) මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයේ පරිදි විය යුතු ය;

(ආ) නිෂ්පාදනය කරනු ලබන අයිතමය ආයුර්වේද ඖෂධයක් වන අවස්ථාවක දී 29 වන නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අතිරේකව, බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව, විය යුතුය;

(ඇ) අනුමැතිය ඉල්ලා සිටි ආයුර්වේද භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ නිෂ්පාදනය සඳහා පමණක් වලංගු වේ; සහ

(ඈ) නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා පමණක් වලංගු වේ.

29. (මින්මතු "බලපත්‍රලාභී නිෂ්පාදනාගාරයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍රයක් නිකුත්කර ඇති සෑම නිෂ්පාදනාගාරයක් ම-

(අ) පැහැදිලිව සහ ප්‍රකටව හඳුනාගත හැකි අකුරු සහ ඉලක්කම්වලින් යුක්තවන සේ ලියාපදිංචි අංකය සහ ඇමතුම් විස්තර සහිත නාම පුවරුවක් නිෂ්පාදනාගාර පිවිසුමේ ප්‍රදර්ශනය කළ යුතු ය;

(ආ) එකී බලපත්‍රය සහ බලපත්‍රය වලංගු කාලසීමාව සඳහා වලංගු වූ බලපත්‍රලාභී නිෂ්පාදකයා ගිවිසුමකට එළැඹ ඇති ආයුර්වේද වෛද්‍යවරයා වෙත ආයුර්වේද වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද, ලියාපදිංචි සහතිකය ප්‍රදර්ශනය කළ යුතු ය;

(ඇ) නියාමන සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව නියාමන සභාව විසින් නිර්දේශ කරන ලද යහපත් නිෂ්පාදන පිළිවෙත් භාවිත කළ යුතු ය;

(ඈ) එවැනි බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් නිෂ්පාදනය කිරීමට භාර ගන්නා ලද යම් ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන කාර්ය මණ්ඩලය, පරිශ්‍ර, උපකරණ සහ පහසුකම් සැපයීම සහ පවත්වාගෙන යාම සහ එම නිෂ්පාදන බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති නියමිත වෛද්‍ය අධීක්ෂණ යටතේ හා පරිශ්‍රවල හැර සිදු නොකළ යුතු ය;

(ඉ) අමුද්‍රව්‍ය සහ ඖෂධ සම්බන්ධ කටයුතු ඉටුකිරීමට සහ ගබඩාකරණය සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන කාර්ය මණ්ඩලය, පරිශ්‍රය, උපකරණ සහ පහසුකම් පවත්වාගෙන යා යුතු ය;

(ඊ) නිෂ්පාදනාගාරය භාර ප්‍රධාන වෛද්‍ය නිලධාරියාගේ අනුමැතියෙන් තොරව කිසිදු නිෂ්පාදනයක් වෙළඳපොළට නිකුත් නොකළ යුතු ය;

(උ) නිෂ්පාදනාගාරයක් වාණිජ පරිමාණයෙන් නිෂ්පාදනය කරනු ලබන එවැනි ප්‍රකාශිත භාණ්ඩය, ද්‍රව්‍යය හෝ ඖෂධය මෙම නියෝගවල විධිවිධානවලට අනුකූල බවට සහතික විය යුතු ය;

(ඌ) එකී නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනය කරනු ලබන යම් ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් සම්බන්ධයෙන් සහ එම නිෂ්පාදනයට අදාළව සිදු කරනු ලබන මෙහෙයුම් සම්බන්ධයෙන්, නියාමන සභාවට නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු සැපයීම කළ යුතු ය;

(එ) වාර්තා කිරීම, විශ්ලේෂණය සහ ප්‍රතිකර්ම පියවර ගැනීම ඇතුළුව නිෂ්පාදන සම්බන්ධ පැමිණිලි හැසිරවීමේ පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය;

(ඒ) බලපත්‍රය යටතේ භාවිත කරන පරිශ්‍රය, කර්මාන්තශාලා හෝ යන්ත්‍ර සූත්‍රවල හෝ ඒවා භාවිතා කරන මෙහෙයුම් පටිපාටිවල යම් විශේෂ වෙනසක් සිදුකිරීමට පෙර පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් නියාමන සභාව වෙත දැනුම් දිය යුතු ය:-

(i) නිෂ්පාදන මෙහෙයුම්; හෝ
(ii) නිෂ්පාදිත නිෂ්පාදනවල තත්ත්ව පාලනය සහ තත්ත්ව සහතිකය;

(ඔ) නිෂ්පාදනාගාරයේදී සකස් කරන ලද යම් ප්‍රකාශිත භාණ්ඩයක, ද්‍රව්‍යයක හෝ ඖෂධයක අදාළ කාණ්ඩයේ කල් ඉකුත් වූ දින සිට වසර පහක කාලයක් සඳහා කාණ්ඩ නිෂ්පාදන වාර්තා සහ බෙදාහැරීමේ වාර්තා ඇතුළු සියලුම වාර්තා සංරක්ෂණය කළ යුතු ය;

(ඕ) නිෂ්පාදනාගාරයේ නිෂ්පාදනය කරනු ලබන සෑම ප්‍රකාශිත භාණ්ඩයක, ද්‍රව්‍යයක හෝ ඖෂධයක එක් එක් කාණ්ඩය නිෂ්පාදනය කිරීම පිළිබඳව සහ ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ පිළිබඳ තොරතුරු ඇතුළු සියලුම වාර්තා, නියාමන සභාව හෝ ඇගයීමේ කමිටුව හෝ නියාමන සභාව විසින් නම් කරන ලද වෙනත් ඕනෑම තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා එකී වාර්තා පහසුවෙන් ලබා ගත හැකි පරිදි තැබිය යුතු ය;

(ක) ඖෂධ අලෙවි කරන, බෙදා හරින හෝ අපනයනය කරනු ලබන එක් එක් බහාලුමක දක්වාලන ආකාරයෙන් ඖෂධ කාණ්ඩ අංකනය මඟින් වාර්තා පහසුවෙන් හඳුනාගත හැකි ආකාරයට වාර්තා පවත්වාගෙන යා යුතු ය;

(ග) ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් විකිණීමෙන්, සැපයීමෙන් හෝ අපනයනයෙන් ඉවත්කර ගැනීමට හෝ ආපසු කැඳවීමට පහසුකම් සැලසෙන ආකාරයෙන් සියලුම වාර්තා තබා ගත යුතු ය.

30. (1) නියාමන සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි, බලපත්‍රලාභී නිෂ්පාදකයින්ට අදාළ යම් තොරතුරු ඇතුළත් සෑම බලපත්‍රලාභී නිෂ්පාදනයක් පිළිබඳව වූ යාවත්කාලීන ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

(2) සෑම බලපත්‍රලාභී නිෂ්පාදනාගාරයක්ම, නියාමන සභාව විසින් කලින් කල නියම කරනු ලබන යම් තොරතුරු නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර එකී තොරතුරුවල යම් වෙනසක් සිදු වූ අවස්ථාවක වහාම නියාමන සභාවට දැනුම් දිය යුතුය.

(3) (2) වන අනු නියෝගය යටතේ බලපත්‍රලාභී නිෂ්පාදන ආයතනයක් විසින් සපයනු ලබන යම් තොරතුරක් ලැබීමෙන් පසු නියාමන සභාව විසින් අදාළ ලේඛනයෙහි අවශ්‍ය සංශෝධන සිදු කළ යුතු ය: නැතහොත් සිදු කිරීමට සැලැස්විය යුතු ය.

31. (1) 26 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, එම බලපත්‍රය කල් ඉකුත්වීමේ දිනට දින අනූවකට පෙර මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "A" ආකෘතියෙන් නියාමන සභාව වෙත කරනු ලබන ඉල්ලීමක් මගින්, අලුත් කළ හැකි ය.

(2) නියාමන සභාව විසින් බලපත්‍රයක් අලුත් කරනු ලැබිය යුත්තේ බලපත්‍රලාභී නිෂ්පාදනාගාරය, නියාමන සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රමිතිවලට අනුගත වී ඇති බවට නියාමන සභාව සෑහීමකට පත්වන්නේ නම් පමණක් වන අතර, නිෂ්පාදිත අංගය ප්‍රකාශිත ඖෂධයක් වන විට 29 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලීමට අතිරේකව, පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති යම් නියම හා කොන්දේසිවලට අනුකූල වී ඇති බවට සෑහීමකට පත් විය යුතු ය.

32. 31 වන නියෝගය යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලීමක් ලැබී දින තිහක් ඇතුළත, නියාමන සභාව විසින්-

(අ) නිර්දේශය සඳහා එකී ඉල්ලීම ඇගයීමේ කමිටුව වෙත හෝ තාක්ෂණික කමිටුව විසින් අනුමත කරන ලද වෙනත් ආයතනයක් වෙත යොමු කිරීම; හෝ

(ආ) ඒ සඳහා හේතු දක්වමින් ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම,

කළ යුතුය.

33. බලපත්‍රලාභී නිෂ්පාදනාගාරයකට නිකුත් කර ඇති බලපත්‍රය අලුත් කිරීම නියාමන සභාව විසින් ප්‍රතික්ෂේපකර ඇති අවස්ථාවක, නියාමන සභාව විසින්-

(අ) එවැනි නිෂ්පාදනාගාරයක නම නිෂ්පාදනාගාර ලේඛනයෙන් ඉවත් කළ යුතු ය;

(ආ) දැනටමත් නිෂ්පාදනය කර ඇති නමුත් වෙළඳපොළට නිකුත් නොකළ අයිතම සහ තවමත් නිෂ්පාදනය කරමින් පවතින අයිතම සම්බන්ධයෙන් සුදුසු යැයි හැඟෙන පියවරක් ගත යුතු ය.

34. (1) බලපත්‍රලාභී නිෂ්පාදකයා පනතේ හෝ, ඒ යටතේ සාදන ලද නියෝගයක හෝ රීතියක හෝ එම බලපත්‍රයේ යම් නියම සහ කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට නියාමන සභාව සෑහීමකට පත්වේ නම්, 24 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට නියාමන සභාවට හැකි ය.

(2) බලපත්‍රයක් අත්හිටුවා ඇති අවස්ථාවක, නියාමන සභාව විසින්, එම අත්හිටුවීමෙන් දින දාහතරක් ඇතුළත, විමර්ශනය සහ නිර්දේශ ලබාගැනීම සඳහා එම කාරණය විමර්ශන කමිටුව වෙත යොමු කළ යුතු ය.

(3) විමර්ශන කමිටුවේ නිර්දේශ ලැබීමෙන් පසු, නියාමන සභාව විසින් බලපත්‍රය අවලංගු කළ හැකි ය: නැතහොත් අත්හිටුවීම ඉවත්කර නිෂ්පාදනාගාරයේ වැඩ නැවත ආරම්භ කිරීමට අවසර ලබා දිය හැකි ය.

## III වන කොටස

### ආයුර්වේද නිෂ්පාදන ලියාපදිංචි කිරීම

35. (1) සෑම ආයුර්වේද නිෂ්පාදනයක් ම මිනිස් පරිභෝජනයට සූදානම් අයිතමයක් ලෙස වෙළඳපොළට නිකුත් කිරීමට පෙර, මෙම කොටසේ විධිවිධාන යටතේ නියාමන සභාවේ ලියාපදිංචි කළ යුතු ය.

(2) ආයුර්වේද නිෂ්පාදනයක් නියාමන සභාවේ ලියාපදිංචි කිරීමට අදහස් කරන සෑම ඉල්ලුම්කරුවකු ම -

(අ) බලපත්‍රලාභී නිෂ්පාදනාගාරයක් එකී කාර්යය සඳහා ලියාපදිංචිකර තිබිය යුතු ය;

(ආ) මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති B ආකෘති පත්‍රයෙන් නියාමන සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(ඇ) නියාමන සභාව විසින් කලින් කලට නිශ්චය කරනු ලබන සියලු තොරතුරු නියාමන සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඈ) නියාමන සභාව නියම කරනු ලබන ආයුර්වේද නිෂ්පාදනයේ සාම්පල ලබා දිය යුතු ය; සහ

(ඉ) නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන පිරිසැකසුම් ගාස්තුවක් ගෙවිය යුතු ය.

(3) ආනයනය කරන ලද ආයුර්වේද නිෂ්පාදනයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය මෙහි IV වන කොටසේ දක්වා ඇති පරිදි විය යුතු ය.

(4) ලියාපදිංචි කිරීමට අදහස් කරනු ලබන එක් එක් ආයුර්වේද නිෂ්පාදනයක් සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

36. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන ආයුර්වේද නිෂ්පාදනයක් -

(අ) (i) ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් වරින්වර ප්‍රකාශයට පත් කරන ලද ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ;

(ii) ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් වරින් වර ප්‍රකාශයට පත් කරන ලද සිද්ධ ඖෂධ සංග්‍රහයේ;

(iii) ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් වරින්වර ප්‍රකාශයට පත් කරන ලද යුනානි ඖෂධ සංග්‍රහයේ;

(iv) ඉන්දියානු රජය විසින් අනුමත කරන ලද ආයුර්වේද, සිද්ධ සහ යුනානි ඖෂධ සංග්‍රහයේ; හෝ

(v) වෙනත් රටවල ආණ්ඩු විසින් අනුමත කරන ලද ඒ ඒ රටවල ඖෂධ සංග්‍රහවල,

අන්තර්ගත සංරචක හෝ ඖෂධීය ද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් භාවිතයෙන් සංස්කරණය කරන ලද්දක්;

(ආ) ශ්‍රී ලංකාවේ දේශිය චිකිත්සාවේ පාරම්පරිකව භාවිතවන උද්භිද, ඛනිජ හෝ සත්ත්ව විද්‍යාත්මක ලෙස සැලකෙන ඖෂධ වර්ග එකක් හෝ කිහිපයක් භාවිතයෙන් සංස්කරණය කරන ලද්දක්; හෝ

(ඇ) ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා යන වෛද්‍ය ක්‍රමවල පිළිගත් හෝ සම්භාව්‍ය ග්‍රන්ථවල සඳහන් කරන ලද්දක්,

විය යුතු ය.

37. ආයුර්වේද නිෂ්පාදනයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් ලද පසු, එම ඉල්ලීම ලද දින සිට දින තිහක කාලයක් ඇතුළත නියාමන සභාව විසින් ඒ සම්බන්ධයෙන් නිර්දේශ සහ වාර්තාව ලබා ගැනීම සඳහා එම කාරණාව තාක්ෂණික කමිටුව වෙත යොමු කළ යුතුය.

38. එවැනි ඉල්ලීමක අන්තර්ගත තොරතුරු සලකා බැලීමෙන් පසු තාක්ෂණික කමිටුව විසින්, එම අයදුම්පත ලැබීමෙන් දින තිහක කාලයක් ඇතුළත, කමිටුවේ නිර්දේශය නියාමන සභාවට දැනුම් දිය යුතු ය.

39. එවැනි නිර්දේශයක් ලැබීමෙන් පසු, නියාමන සභාව මගින් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ගාස්තුව ගෙවීම මත, මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීම, හෝ නියාමන සභාව විසින් වාර්තා කළ යුතු හේතු මත ඉල්ලුම්කරු වෙත ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ හැකි ය.

40. සෑම ලියාපදිංචි සහතිකයක් ම, එය කලින් අත්හිටුවා හෝ අවලංගු කර නැත්නම් මිස, දේශීය නිෂ්පාදනයක් සම්බන්ධයෙන් වසර තුනක කාලයක් සඳහා සහ ආනයනික භාණ්ඩයක් සම්බන්ධයෙන් වසරක කාලයක් සඳහා වලංගු විය යුතු අතර එකී සහතිකයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

41. ලියාපදිංචි සහතිකය දරන්නා විසින් පනතේ විධිවිධානවල හෝ, ඒ යටතේ සාදන ලද නියෝගවල හෝ රීතිවල හෝ එම ලියාපදිංචි සහතිකයේ යම් නියම සහ කොන්දේසි කිසිවක් උල්ලංඝනයකර ඇති බවට නියාමන සභාව සෑහීමකට පත්වන්නේ නම්, 39 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට නියාමන සභාවට හැකි ය.

42. (1) 39 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක වලංගු කාලය ඉකුත්වීමට දින අනූවකට පෙර, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති B ආකෘති පත්‍රයෙන් ඉල්ලීමක් නියාමන සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් සහ මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ අලුත් කිරීමේ ගාස්තුව ගෙවීම මත ලියාපදිංචිය අලුත් කළ හැකි ය.

(2) එවැනි ලියාපදිංචි සහතිකයක් දරන්නකු පනතේ ඒ යටතේ සාදන ලද නියෝගයක සහ විධිවිධානයක රීති සහ ලියාපදිංචි සහතිකයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇති බවට නියාමන සභාව සෑහීමකට පත්වන්නේ නම්, නියාමන සභාව විසින් 39 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය අලුත් කළ යුතු ය.

43. ඇසුරුම් කිරීම, ලේබල් කිරීම සහ ආයුර්වේද නිෂ්පාදනයක් සමඟ ලබාදිය යුතු අත් පත්‍රිකාවේ අන්තර්ගතය මෙහි V වන උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු ය.

## IV වන කොටස

## ආනයනික ආයුර්වේද නිෂ්පාදනයක් ලියාපදිංචි කිරීම

44. ආනයනය කරනු ලබන සෑම ආයුර්වේද නිෂ්පාදනයක් ම මෙම කොටසේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කළ යුතු ය.

45. (1) ආනයනය කරනු ලබන සෑම ආයුර්වේද නිෂ්පාදනයක්ම අදාළ රටෙහි බලපත්‍රලාභී නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කළ යුතු අතර එකී නිෂ්පාදනයේ තත්ත්වය නිශ්චය කිරීමට බලය ඇති අදාළ රටෙහි නියාමන අධිකාරිය විසින් වලංගු කාලසීමාව සඳහා අනුමතකර තිබිය යුතු ය.

(2) (1) වන අනුනියෝගයෙහි සඳහන් නිෂ්පාදනාගාරයේ නිෂ්පාදකයා විසින් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතනයක් එහි දේශීය බලයලත් නියෝජිතයා ලෙස පත් කළ යුතු ය.

(3) යම් බලයලත් නියෝජිතයකු ශ්‍රී ලංකාවට ආයුර්වේද නිෂ්පාදනයක් ආනයනය කිරීමට අදහස් කරන අවස්ථාවක දී, ඔහු විසින් ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකු මාර්ගයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති C ආකෘති පත්‍රයෙන් නියාමන සභාව වෙත -

(අ) නියාමන සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ලේඛන සහ තොරතුරු;

(ආ) 53 වන නියෝගය අනුව ලබාගත් ආයුර්වේද නිෂ්පාදනයේ සාම්පල සහ අදාළ වේ නම් තොරතුරු ලේඛනය; සහ

(ඇ) මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ ගාස්තුව ගෙවා,

එම ආනයනය සඳහා බලපත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කළ යුතු ය.

(4) ආනයනය කිරීමට අදහස් කරන එක් එක් ආයුර්වේද නිෂ්පාදනයක් සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

46. නියාමන සභාව, ආනයනය කිරීමට අදහස් කරනු ලබන ආයුර්වේද නිෂ්පාදනයක් ලියාපදිංචිය සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක්ම වාර්තාගත කළ යුතු ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය. එකී ලේඛනයට නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන තොරතුරු ඇතුළත් කළ යුතු ය.

47. (1) ආයුර්වේද නිෂ්පාදනයක් ආනයනය කිරීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක් ම පහත සඳහන් ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතු යː-

(i) අදාළ රටේ අදාළ නියාමන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන නිදහස් විකුණුම් සහතිකයක් (Free Sale Certificate);

(ii) පූර්ව විකුණුම් ඉන්වොයිසිය (Performa Invoice);

(iii) වාණිජ හුවමාරු පත්‍ර (Fund Transfer Document);

(iv) වාණිජ විකුණුම් ඉන්වොයිසිය (Commercial Invoice);

(v) ඇසුරුම් ලැයිස්තුව;

(vi) නෞභාර පතේ හෝ ගුවන් භාර පත්‍රයේ පිටපතක් ;

(vii) නිෂ්පාදිත මුල් රට පිළිබඳ සහතිකය;

(viii) ද්‍රව්‍ය ආරක්ෂණ දත්ත පත්‍රිකාව;

(ix) අදාළ විශ්ලේෂණ සහ නිරුපද්‍රිතතා වාර්තා;

(x) ආයුර්වේද නිෂ්පාදනය ආනයනය කිරීමට අවශ්‍ය වෙනත් ලේඛන හෝ නියාමන සභාව විසින් පරිචය කරනු ලබන වෙනත් ලේඛන.

(2) අදාළ නිෂ්පාදනයේ පහත සඳහන් සංඝටකවල පිළිගත් ප්‍රතිශත අඩංගු බව පෙන්වීමට ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු යඃ-

(අ) (i) නිෂ්පාදිතය ආහාර ද්‍රව්‍යයක් නම් සහ කිසිදු ඖෂධ සංග්‍රහයක හෝ පිළිගත් මූලග්‍රන්ථයක වට්ටෝරුවක් නොවන්නේ නම්, ශාකසාර, ඛනිජ හෝ සත්ත්වජ ද්‍රව්‍ය, නියාමන සභාව විසින් කලින් කලට නිශ්චය කළ හැකි ප්‍රතිශතයකින් සක්‍රීය සංරචකයක් ලෙස තිබීම;

(ii) නිෂ්පාදිතය ලාවන්‍ය සංයෝගයක් නම්, සහ කිසිදු ඖෂධ සංග්‍රහයක හෝ පිළිගත් මූලග්‍රන්ථයක වට්ටෝරුවක් නොවන්නේ නම්, ඛනිජ හෝ සත්ත්වජ ද්‍රව්‍ය, නියාමන සභාව විසින් කලින් කලට නිශ්චය කළ හැකි ප්‍රතිශතයකින් සක්‍රීය සංරචකයක් ලෙස තිබීම;

(ආ) පිටවැස්ම රසායනික නම්, එය ස්වභාවිකව නිස්සාරණය කර තිබීම;

(ඇ) එහි රසායනික ද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් අඩංගු වන විට, එය මිනිස් පරිභෝජනයට සුදුසු ගුණාත්මක බවින්, ක්‍රියාකාරීත්වයකින් සහ යෝග්‍යතාවයකින් යුතු බවට වෛද්‍ය වාර්තා හෝ පිළිගත් රාජ්‍ය ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් විසින් පිළිගත් ක්‍රමවේදයකට අනුව සිදු කරන ලද පර්යේෂණවලට අදාළව, නිෂ්පාදිත රටෙහි සම-සමාලෝචනය කරන්නා වූ, පිළිගත් ජර්නල් සඟරාවක ප්‍රකාශයට පත් කරන ලද, පිළිගත් පර්යේෂණ ලිපි දෙකක් මඟින් සනාථ කර තිබීම; සහ

(ඈ) විෂ ද්‍රව්‍ය අඩංගු නොවන බවට තහවුරු කර තිබීමෙන් මිනිස් පරිභෝජනය සඳහා සුදුසු බවට සනාථ කර තිබීම.

48. (1) ආයුර්වේද නිෂ්පාදනයක් ආනයනය කිරීම සඳහා ඉල්ලීම ලැබී දින තිහක් ඇතුළත නියාමන සභාව, නිර්දේශ ලබා ගැනීම සඳහා එම ඉල්ලීම තාක්ෂණික කමිටුව වෙත යොමු කළ යුතු ය.

(2) ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව විසින් යොමු කරනු ලබන එවැනි නිර්දේශ දින හැටක් ඇතුළත ලිඛිතව නියාමන සභාවට යොමු කළ යුතු ය.

(3) නියාමන සභාව, එවැනි නිර්දේශයක් ලැබීමෙන් පසු -

(අ) අදාළ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව අදාළ නිෂ්පාදනයේ නියැදියක් ආනයනය කිරීම සඳහා අනුමත කිරීම; හෝ

(ආ) ඒ සඳහා හේතු දක්වමින් එවැනි ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීම කළ යුතුය.

(4) නියාමන සභාව, බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර සහ අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක, ඉල්ලීම සමඟ ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අතිරේකව වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකි ය.

(5) නියාමන සභාව විසින් බලපත්‍රය නිකුත් කිරීමට පෙර, ආනයනය කිරීමට අදහස් කරන ආයුර්වේද නිෂ්පාදනය දේශීය නිෂ්පාදකයාට අහිතකර බලපෑමක් ඇති කළ හැකි ද යන්න සහ ඒවා නියාමන සභාවේ මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති අදාළ ප්‍රමිතිවලට අනුකූල ද යන්න සලකා බැලිය යුතු ය.

(6) ඉල්ලුම්පත්‍රයේ සඳහන් ආයුර්වේද නිෂ්පාදනය ආනයනය සඳහා අවශ්‍ය සියලු අවශ්‍යතා සපුරා ඇති බවට නියාමන සභාව, සෑහීමකට පත්වීමෙන්, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ ගාස්තුව ගෙවීමෙන් පසු, IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් ආයුර්වේද නිෂ්පාදිතය ආනයනය කිරීමට ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කිරීම නැතහොත් හේතු දක්වා බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ යුතු ය.

49. ආයුර්වේද නිෂ්පාදනයක් ආනයනය කිරීම සඳහා වන සෑම බලපත්‍රයක් ම, එය කලින් අත්හිටුවා හෝ අවලංගු කර ඇත්නම් මිස, වසරක කාලයක් සඳහා වලංගු වන අතර එහි දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

50. (1) යම් ආයුර්වේද නිෂ්පාදනයක් ආනයනය කිරීම සඳහා බලපත්‍රයක් දරන්නකු විසින් පනතේ හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග, රීති හෝ එම බලපත්‍රයේ යම් නියම සහ කොන්දේසි උල්ලංඝනය කර ඇත්නම්, නියාමන සභාව විසින් 48 වන නියෝගය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ යුතු අතර ආනයනකරු විසින් නියාමන සභාව මගින් නිශ්චය කරනු ලබන ක්‍රියා පටිපාටියට අනුකූලව බලපත්‍රය ප්‍රකාරව ආනයනය කරන ලද ආයුර්වේද නිෂ්පාදන තම වියදමින් වෙළඳපලින් ඉවත් කර ගත යුතු ය.

(2) මෙම නියෝග යටතේ ආනයනය කිරීමට ලියාපදිංචි වී ඇති යම් ආයුර්වේද නිෂ්පාදනයක්, එකී ආනයනය සඳහා ලියාපදිංචි වූ දින සිට වසරක් ඇතුළත ශ්‍රී ලංකාවට ආනයනය කර නොමැති නම්, නියාමන සභාවට, එම භාණ්ඩය සම්බන්ධයෙන් නිකුත්කර ඇති බලපත්‍රය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හැකි ය.

51. 48 වන නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, එම බලපත්‍රය කල් ඉකුත්වීමට දින අනූවකට පෙර නියාමන සභාව වෙත ඉල්ලීමක් කිරීමෙන් සහ මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති පරිදි අදාළ අලුත් කිරීමේ ගාස්තුව ගෙවීමෙන් පසුව ලියාපදිංචිය අලුත් කළ හැකි ය.

52. (1) ආයුර්වේද නිෂ්පාදනයක නියැදියක් ආනයනය කිරීම සඳහා වන ඉල්ලීමක් මෙහි II වන උපලේඛනයේ D ආකෘතියෙන් නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් තොරතුරු ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

(2) නියාමන සභාව විසින්, ආයුර්වේද නිෂ්පාදනයක නියැදියක් ආනයනය කිරීම සඳහා එවැනි ඉල්ලීමක් ලද දින සිට දින තිහක් ඇතුළත, එකී ඉල්ලීම නිර්දේශ සඳහා තාක්ෂණික කමිටුව වෙත යොමු කළ යුතු ය.

(3) එවැනි සඳහනක් සිදුකර දින හැටක කාලයක් ඇතුළත ආයුර්වේද ඖෂධ පිළිබඳ තාක්ෂණික කමිටුව විසින් එහි නිර්දේශ ලිඛිතව නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) නියාමන සභාව විසින්, එකී නිර්දේශ ලැබීමෙන් පසු -

(අ) අදාළ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව එවැනි නියැදියක් ආනයනය කිරීම අනුමත කිරීම; හෝ

(ආ) හේතු දක්වා එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම,

කළ හැකිය.

(5) නියාමන සභාව විසින් ඉල්ලුම්කරු වෙත -

(අ) නිෂ්පාදිතයේ නම සහ විස්තරය; සහ

(ආ) අවසර පත්‍රය වලංගු වන කාලසීමාව,

ඇතුළත් අදාළ නියැදිය සඳහා ආනයන අවසර පත්‍රයක් නිකුත් කළ යුතු ය.

53. (1) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ආනයනය කළ ආයුර්වේද නිෂ්පාදනයේ නියැදියක් කිසිදු ආකාරයකින් අලෙවි නොකළ යුතු අතර, එහිදී එම ආයුර්වේද නිෂ්පාදනය නියාමන සභාව වෙත ලියාපදිංචි කළ කාර්යය සඳහා පමණක් භාවිතා කළ යුතු ය.

(2) ඉහත නිශ්චිතව දක්වා ඇති ආයුර්වේද නිෂ්පාදනයේ ආනයනය කරන ලද සෑම නියැදියක් ම, නියාමන සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය.

(3) නියාමන සභාවේ පූර්ව අනුමැතියකින් තොරව ආනයනය කරන ලද එවැනි යම් නියැදියක්, සභාව විසින් විනාශ කරනු ලැබිය යුතු ය. නැතහොත් විනාශ කිරීමට සැලැස්විය යුතු ය. වලංගු බලපත්‍රයක් නොමැතිව එවැනි නියැදියක් ආනයනය කරන ඕනෑම තැනැත්තකු සම්බන්ධයෙන් (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(4) එවැනි ආයුර්වේද නිෂ්පාදනයක නියැදිය හෝ සම්පූර්ණ තොගය මිනිස් පරිභෝජනයට නුසුදුසු බව දැනගතහොත්, නියාමන සභාවට, එකී නියැදිය හෝ සම්පූර්ණ තොගය විනාශ කිරීමට නියෝග කිරීමේ බලය ඇත. එකී නියැදිය හෝ සම්පූර්ණ තොගය ම විනාශ කිරීම සඳහා වන සම්පූර්ණ වියදම ආනයනකරු විසින් දැරිය යුතු ය.

54. 53 වන නියෝගයේ සඳහන් ආනයනය කිරීමට අදහස් කරන්නා වූ නියැදිවල නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන තොරතුරු ඇතුළත් විය යුතු අතර එකී නියැදි සම්බන්ධයෙන් නියාමන සභාව විසින් බලය පවරමින් නිකුත් කළ ලිපිවල නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

55. ආයුර්වේද නිෂ්පාදනයන් ඇසුරුම්කරණයේ දී, ලේබල් කිරීමේ දී සහ එය සමග සැපයිය යුතු අත්පත්‍රිකාවේ අන්තර්ගතය මෙහි V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

## V වන කොටස

## ආයුර්වේද නිෂ්පාදන අපනයනය

56. සෑම ආයුර්වේද නිෂ්පාදනයක් ම අපනයනය කිරීමට පෙර මෙම සංග්‍රහයේ III වන කොටසේ නියෝගවල විධිවිධානවලට අනුකූලව නියාමන සභාවෙහි ලියාපදිංචි විය යුතු ය.

57. අපනයනය කිරීමට අදහස් කරන සෑම ආයුර්වේද නිෂ්පාදනයක් සඳහා ම, නියාමන සභාව විසින් විධිමත් සමාලෝචනයක් සිදුකර අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන බවට නියාමන සභාව විසින් නිශ්චය කරන්නා වූ යම් ලේඛන ද සමඟ වෙන් වෙන්ව ඉල්ලීම් වශයෙන් නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

58. නියාමන සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු ආයුර්වේද නිෂ්පාදනයක් අපනයනය කිරීමට අදහස් කරන තැනැත්තන් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 3 වැනි වගන්තිය යටතේ පිහිටුවා ඇති අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ඒ සඳහා ඉල්ලුම් කළ යුතු ය.

## VI වන කොටස

## ආයුර්වේද ඔසුසැල් සඳහා ප්‍රමිති

59. ආයුර්වේද ඔසුසලක් ලෙස එම කාර්යය සඳහා මෙම නියෝග යටතේ ලියාපදිංචිකර නොමැති කිසිදු ඔසුසැලක, යම් ආයුර්වේද ඖෂධයක් හෝ වෙනත් ආයුර්වේද නිෂ්පාදනයක් අලෙවි කිරීම නොකළ යුතු ය.

60. (1) ආයුර්වේද ඔසුසලක් ලියාපදිංචි කිරීම සඳහාවන සෑම ඉල්ලීමක් ම, අදාළ බලධාරියා වෙතින් ලබාගත් වලංගු ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයක් සතුවන්නා වූ සහ ආයුර්වේද ඔසුසලක් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාව වෙතින් ලියාපදිංචිය ලබා ඇති ආයුර්වේද ඖෂධවේදියකු සමඟ අවම වශයෙන් වසරක කාලයක් සඳහා වලංගු ගිවිසුමකට එළැඹ සිටින්නා වූ තැනැත්තකු විසින් ඉදිරිපත් කළ යුතු ය.

(2) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකුට ආයුර්වේද ඔසුසලක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් ඇත.

(3) ආයුර්වේද ඔසුසලක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති E ආකෘතියෙන්, නියාමන සභාව විසින් නිශ්චිතව දක්වා ඇති අනෙකුත් අවශ්‍ය ලිපිලේඛන ද සමඟ කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) ලියාපදිංචිය සඳහා ලිපිලේඛන ලැබීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔසුසල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානය පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කිරීමට සැලැස්වීම කළ යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා, ඉදිරිපත් කරන ලද අදාළ ලිපිලේඛන සහ ස්ථාන පරීක්ෂාවේ ප්‍රතිඵල පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම්, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව අයකර ගැනීමෙන් පසු, වසරක කාලයක් සඳහා එකී ඔසුසල ලියාපදිංචි කර ඉල්ලුම්කරුට ලියාපදිංචි අංකයක් නිකුත් කළ යුතු ය.

(6) ඔසුසලක් සඳහා වන සෑම ලියාපදිංචියක් ම නියාමන සභාව විසින් නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු අතර එකී ලියාපදිංචිය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මගින් අලුත් කළ හැකි ය. ලියාපදිංචිය අලුත් කිරීමේ දී, අලුත් කිරීමට අපේක්ෂා කරන කාල සීමාව සඳහා ඉල්ලුම්කරු නමට ව්‍යාපාර නාම ලියාපදිංචියක් තිබිය යුතු අතර ඉල්ලුම්කරු හා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි යම් ආයුර්වේද ඖෂධවේදියකු අතර එකී අලුත් කිරීම ඉල්ලා සිටින කාලසීමාව සඳහා වලංගු ගිවිසුමක් තිබිය යුතු ය.

(7) කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔසුසැල් හිමිකරුවන්ගේ නම්, ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ලිපිනය සහ ඔසුසැල පිහිටි ස්ථානයේ ලිපිනය සහ එම ඔසුසලේ ඇමතුම් තොරතුරු ඇතුළුව, සියලුම ලියාපදිංචි ඔසුසල්වල තොරතුරු ඇතුළත් ලේඛනයක් ද නියාමන සභාව විසින් නියම කරනු ලබන ඔසුසලේ ලියාපදිංචි ආයුර්වේද ඖෂධවේදියාගේ යම් තොරතුරු ද ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

61. සෑම ලියාපදිංචි ආයුර්වේද ඔසුසලක් ම -

(අ) ''ආයුර්වේද ඔසුසල'' යන්න භාෂා තුනෙන් ම දක්වාලමින් සහ එම ඔසුසැලේ ලියාපදිංචි අංකය, ලියාපදිංචි ආයුර්වේද ඖෂධවේදියාගේ සුදුසුකම්, විකුණනු ලබන ආයුර්වේද නිෂ්පාදන, ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය, හෝ ඖෂධ හා සිල්ලර ඔසුසලක් ද තොග ඔසුසලක් ද හෝ එකී දෙයාකාරයේ ම වන ඔසුසලක් ද යන්න සඳහන් කරන ලද නාම පුවරුවක් ප්‍රදර්ශනය කළ යුතු ය;

(ආ) ආයුර්වේද භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ සහ ආයුර්වේද නිෂ්පාදන තොග වශයෙන් අලෙවි කරනු ලබන්නේ නම්, ආයුර්වේද ගබඩාවක් ලෙස ද ලියාපදිංචි කළ යුතු ය;

(ඇ) (i) එවැනි ඔසුසලක අලෙවි කරනු ලබන ආයුර්වේද නිෂ්පාදන නියාමන සභාවේ විධිමත් ලෙස ලියාපදිංචි කර ඇති බවට; සහ

(ii) මිශ්‍ර වීම වැළැක්වීම සඳහා එක් එක් ආයුර්වේද නිෂ්පාදන, භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ වෙන වෙනම ගබඩා කර ඇති බවට;

සහතික විය යුතු ය;

(ඈ) ආයුර්වේද ඖෂධවේදියාගේ ඡායාරූපය සහිත ආයුර්වේද ඔසුසලක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකය ද අදාළ ව්‍යාපාර ලියාපදිංචි සහතිකය ද පරිශ්‍රය තුළ පැහැදිලිව ප්‍රදර්ශනය කර තිබිය යුතු ය;

(ඉ) එහි අලෙවි කරනු ලබන යම් ඖෂධයක් හෝ නිෂ්පාදනයක් භාවිතා කිරීම සඳහා පාරිභෝගිකයන් පෙළඹවීමට ඉඩ ඇති කිසිදු ප්‍රවර්ධන ක්‍රියාකාරකමක හෝ ප්‍රචාරක කටයුතුවලට ආයුර්වේද ඖෂධවේදියා සම්බන්ධ නොවන බවට වග බලා ගත යුතු ය;

(ඊ) වෙළඳ දැන්වීම්, පෝස්ටර් සහ පත්‍රිකා පරිශ්‍රය තුළ පමණක් ප්‍රදර්ශනය කරන බවට සහ ආයුර්වේද ඖෂධවේදියා එහි කිසිදු ආකාරයක ප්‍රවර්ධන හෝ ප්‍රචාරණ කටයුතුවල නොයෙදෙන බවට වග බලා ගත යුතු ය;

(උ) යම් සුපිරි වෙළඳසැලක් තම ව්‍යාපාර පරිශ්‍රය තුළ ආයුර්වේද නිෂ්පාදන අලෙවි කිරීමට අදහස් කරන්නේ නම්, එවැනි සුපිරි වෙළඳසැලක් ආයුර්වේද ඔසුසැල් සම්බන්ධයෙන් බලාත්මක වන ප්‍රමිති සහ නියෝග වලට අනුකූල බවට සහතික විය යුතු ය;

62. ඕනෑම ලියාපදිංචි ආයුර්වේද ඔසුසැල් පරිශ්‍රයක -

(අ) එවැනි ආයුර්වේද ඔසුසලක ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව සහ විධිමත්ව අඛණ්ඩව පවත්වාගෙන යාමට සුදුසු සැලකිය යුතු ඉඩකඩක් පැවතිය යුතු ය;

(ආ) ඖෂධ මිශ්‍ර කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා ප්‍රමාණවත් ඉඩක් වෙන් කර තිබිය යුතු ය;

(ඇ) නිමි ඖෂධ නිෂ්පාදන සහ වියළි ඖෂධ සඳහා අංශ දෙකක් බෙදා වෙන් කර තිබිය යුතු ය;

(ඈ) ලාවන්‍ය සහ වෙනත් ඖෂධ නොවන ද්‍රව්‍ය තිබේ නම්, ඒවා වෙන වෙනම ගබඩා කිරීමට පහසුකම් තිබිය යුතු ය;

(ඉ) භූත විද්‍යාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ භාණ්ඩ අලෙවි කරන්නේ නම්, ඒ සඳහා වෙනම ඉඩක් වෙන් කිරීමෙන් පහසුකම් සැලසිය යුතු ය;

(ඊ) දූවිලි අංශු, දුම්, තියුණු හිරු කිරණ සහ අපිරිසිදු වාතයට නිරාවරණය නොවන පරිදි ඖෂධීය ද්‍රව්‍යයන් තැබීම සඳහා නම් කරන ලද රාක්ක තිබිය යුතු ය;

(උ) ඔසුසල් සඳහා නියමිත කොන්දේසිවලට අනුකූලව සුදුසු ආලෝකය, වාතාශ්‍රය, උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය තබා ගැනීමට පියවර ගත යුතු ය: වායු සමීකරණ පහසුකම් අවශ්‍ය ප්‍රදේශ සඳහා එවැනි පහසුකම් සැපයිය යුතු ය;

(ඌ) පාරිභෝගිකයන් සඳහා පොරොත්තු ඉඩ අවකාශය ලෙස අවම වශයෙන් වර්ග අඩි 25 ට නොඅඩු ඉඩ ප්‍රමාණයක් වෙන්කර තිබිය යුතු ය;

(එ) ඖෂධ සමඟ අනවශ්‍ය ද්‍රව්‍ය මිශ්‍ර වීමේ අවදානම වළක්වා ගැනීමට හෝ අවම කිරීමට හැකි වන පරිදි ගොඩනැගිලි ව්‍යුහය සැලසුම් කර තිබිය යුතු ය;

(ඒ) කල් ඉකුත් වූ හෝ හානි වූ ද්‍රව්‍ය හා ඖෂධීය ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වෙනම පහසුකම් තිබිය යුතු ය;

(ඔ) ඔසුසල් විසින් භාවිතා කරන පිරිසිදු කිරීමේ ක්‍රමවේදවලට අනුකූලව පිරිසිදු කිරීම සඳහා භෞතික පහසුකම් සැපයීම කළ යුතු ය;

(ඕ) වේයන්, කෘමීන්, කුරුල්ලන්, මීයන් සහ සුරතල් සතුන් ආදීන් ඇතුළු වීම වැළැක්වීම සඳහා සුදුසු පූර්වාරක්ෂක ක්‍රම අනුගමනය කිරීමට උපරිම විධිවිධාන සහිතව සැලසුම් කළ යුතු අතර ඔසුසැල සහ ගබඩා පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති සේදීමේ සහ සනීපාරක්ෂක පහසුකම් වෙත පහසුවෙන් ළඟා විය හැකි ආකාරයෙන් සම්මත සනීපාරක්ෂක ක්‍රමවේද භාවිතා කළ යුතු ය;

(ක) (i) බැර ලෝහ අඩංගු නොවන සහ ගැලවී නොයන තීන්ත වර්ගයකින් පින්තාරු කරන ලද බිත්ති සහ සිවිලිමකින් සමන්විත;

(ii) පිරිසිදු කිරීමට පහසු, ඖෂධවලට ප්‍රතික්‍රියාශීලී නොවන සහ ලිස්සන සුළු නොවන ද්‍රව්‍ය යෙදීමෙන් දෝෂ රහිතව නිසි ලෙස නිම කරන ලද බිමකින් සමන්විත;

(iii) ඔසුසැලකට සුදුසු දිගු කල් පවතින ද්‍රව්‍ය සෙවිලි කරන ලද ස්ථිර වහලක් සහිත;

(iv) වහල ආවරණය සහ බිත්ති අතර විවර රහිත;

(v) ඇතුළත උෂ්ණත්වය පාලනය කිරීම සඳහා වහලයට සවි කරන ලද තාප ප්‍රතිරෝධකයක් සහිත;

(vi) පහසුවෙන් පිරිසිදු කළ හැකි සහ අලෙවි කරනු ලබන ආයුර්වේද නිෂ්පාදනවලට අහිතකර බලපෑමක් නොමැති සිවිලිමකින් සමන්විත උස අඩි 10කට වඩා වැඩි,

ගොඩනැගිල්ලක් තිබිය යුතු ය; සහ

(ග) ගිනි නිවන උපකරණවලින් සමන්විත විය යුතු ය.

63. සෑම ලියාපදිංචි ආයුර්වේද ඔසුසලක ම පූර්ණකාලීනව සේවය කරනු ලබන ආයුර්වේද ඖෂධවේදීන්ගෙන් සහ එම ඖෂධවේදීන්ගේ අධීක්ෂණය යටතේ සේවය කරනු ලබන සහායක කාර්ය මණ්ඩලයකින් යුතු ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටිය යුතු ය.

64. (1) ලියාපදිංචි ඔසුසලක බෙහෙත් වට්ටෝරුවක් මත ඖෂධ නිකුත් කිරීමේ වගකීම දරන කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම-

(අ) හොඳ ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය;

(ආ) ප්‍රියමනාප, නම්‍යශීලි සහ මිත්‍රශීලී සේවාවක් සැපයීමට කැප විය යුතු ය;

(ඇ) අනන්‍යතාව දැක්වීම සඳහා සුදුසු නිල ඇඳුමක් සහ හැඳුනුම්පතක් පැළඳිය යුතු ය; සහ

(ඈ) රාජකාරි කාලය තුළ මත්පැන්, දුම්වැටි, බුලත් විට හෝ මත්ද්‍රව්‍ය පරිභෝජනය නොකළ යුතු ය.

(2) රෝගියකුට ආයුර්වේද ඖෂධ නිකුත් කිරීමට පෙර බෙහෙත් වට්ටෝරුව පරීක්ෂා කිරීම (1) වන අනු-නියෝගයේ සඳහන් සෑම සාමාජිකයකුගේ ම යුතුකම වන්නේ ය.

65. (1) ආයුර්වේද ඖෂධ මත අහිතකර බලපෑම් ඇති කළ හැකි ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වීම වැළැක්වීම සඳහා උපරිම සැලකිල්ල යොමු කළ යුතු ය.

(2) අභ්‍යන්තරිකව සහ බාහිරව භාවිත කෙරෙන ආයුර්වේද ඖෂධ එකිනෙකින් පැහැදිලිව වෙන් කර තැබිය යුතු අතර බාහිරව භාවිත කෙරෙන ඖෂධ විකිණීම සඳහා ප්‍රදර්ශනය කෙරෙන කොටසේ ''බාහිරව භාවිත කෙරෙන ආයුර්වේද ඖෂධ සඳහා පමණි'' යන්න පැහැදිලිව පෙනෙන ආකාරයට රතු පැහැයෙන් ලියා තිබිය යුතු ය.

(3) ආයුර්වේද ඖෂධ ඒවායේ ව්‍යවහාරය අනුව ප්‍රදර්ශන රාක්කවල පිළිවෙලට සකස් කර තැබිය යුතු අතර විවිධ ප්‍රමාණයෙන් ඇසුරුම් කර ඇති එකම ආයුර්වේද නිෂ්පාදන එකම ස්ථානයක, ඇසුරුම්වල ප්‍රමාණය අනුව පැහැදිලිවම එකිනෙකින් වෙන් වන සේ තැබිය යුතු ය.

(4) ආයුර්වේද ඖෂධයක අවසන් නිෂ්පාදනයේ ඇසුරුම්වල හෝ ලේබලයේ සලකුණු කර ඇති මිල විකෘති කිරීම හෝ වෙනස් කිරීම, ලේබල් හඳුනා ගත නොහැකි ලෙස විකෘති වී ඇති හෝ ඉරී ඇති හෝ ඇසුරුම්වලට හානි වී ඇති හෝ කල් ඉකුත්වන දිනය පසු වූ ආයුර්වේද ඖෂධ අලෙවිය සඳහා නොතැබිය යුතු ය.

(5) අලෙවිසලක විකිණීමට තබා ඇති සියලුම වියළි, අමු හෝ ශුද්ධ නොකළ ආයුර්වේද ඖෂධ සඳහා සිල්ලර මිල දර්ශකයක් ප්‍රදර්ශනය කළ යුතු ය.

(6) නියාමන සභාවෙහි ලියාපදිංචි කර ඇති ආයුර්වේද ඖෂධවල නිමි ඖෂධ නිෂ්පාදන පමණක් ගබඩා කිරීම හෝ අලෙවි කිරීම කළ යුතු ය.

(7) ආයුර්වේද ඖෂධ අලෙවිය සඳහා සපයා ගැනීම කළ යුත්තේ නියාමන සභාවෙහි ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් පමණි.

(8) කුඩා පරිමාණ හෝ ගෙවතු වගාකරුවන් ඇතුළුව වගාකරුවන්ගේ හෝ අමුද්‍රව්‍ය එකතු කරන්නන්ගේ තොරතුරු ඇතුළත් නාමලේඛනයක් ඔසුසැල් ලියාපදිංචිකරු විසින් යාවත්කාලීන කර තබා ගත යුතු ය.

(9) ස්වභාවික, පිරිසිදු සහ සෞඛ්‍යාරක්ෂිත වියළි, අමු හෝ ශුද්ධ නොකළ ද්‍රව්‍ය පමණක් අලෙවි කළ යුතු ය.

(10) ඖෂධ සංයෝග කිරීමේ දී, සෞඛ්‍යාරක්ෂිත සහ පිරිසිදු ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය.

(11) අලෙවිය සඳහා ආයුර්වේද භාණ්ඩ උපකරණ ද ඇතුළුව සපයා ගැනීම් කළ යුත්තේ නියාමන සභාවෙහි ලියාපදිංචි නිෂ්පාදකයන්ගෙන් පමණි.

66. ආයුර්වේද භාණ්ඩ හෝ ද්‍රව්‍ය හෝ ඖෂධ-

(අ) නිකුත් කළ යුත්තේ, වෛද්‍ය නිර්දේශ මත සහ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකුගේ (වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය ඇතුළත්) නිල මුද්‍රාව සහිත බෙහෙත් වට්ටෝරුවකට පමණි;

(ආ) විශේෂ සුදුසුකම් සහිත ආයුර්වේද වෛද්‍යවරයකු විසින් නියම කර ඇති අවස්ථාවක, එය නිකුත් කළ යුත්තේ, එවැනි වෛද්‍යවරයකුගේ බෙහෙත් වට්ටෝරුවක් මත පමණිඃ එවැනි ඖෂධ නිකුත් කිරීම පිළිබඳ වාර්තා තබා ගැනීම සඳහා වෙනම නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය;

(ඇ) නිකුත් කළ යුත්තේ, බෙහෙත් වට්ටෝරුවෙහි සඳහන් වන ද්‍රව්‍ය සහ එහි නියම කර ඇති ආකාරයට පමණි;

(ඈ) භාවිත කිරීමේ දී, අනුමත සෞඛ්‍යාරක්ෂක ක්‍රම අනුගමනය කළ යුතු ය;

(ඉ) නිකුත් කළ යුත්තේ, වෛද්‍යවරයා විසින් නිකුත් කරන ලද බෙහෙත් වට්ටෝරුවක ලබා දී ඇති නිර්දේශයන් උල්ලංඝනය නොවන ආකාරයෙන් පමණි;

(ඊ) ඇසුරුම් කිරීම සඳහා භාවිතා කළ යුත්තේ, ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීම සඳහා අනුමත ඇසුරුම් පමණිඃ ඒවා නැවත භාවිතා නොකළ යුතු ය;

(උ) වෛද්‍ය නිර්දේශය කියවීමේ අපහසුතාවයක් ඇති විට හෝ බෙහෙත් වට්ටෝරුව තේරුම් නොගත හැකි විට හෝ නියම කරන ලද ඖෂධ පිළිබඳ සැකයක් ඇති විට නිකුත් නොකළ යුතු ය;

(ඌ) තොග තිබේ නම් හෝ ආයුර්වේද වෛද්‍යවරයා විසින් තම බෙහෙත් වට්ටෝරුවෙහි යම් ඖෂධයක් යටින් ඉරි ඇඳ තිබුණේ නම්, වෙනත් ආදේශකයක් නිකුත් නොකළ යුතු ය;

(එ) අදාළ වෛද්‍ය නිර්දේශය සහිත බෙහෙත් වට්ටෝරුව අනුව භාවිතා කරන ආකාරය සහ මාත්‍රාව සඳහන් කරමින් ඖෂධ අඩංගු කවරයේ අවශ්‍ය උපදෙස් ලියා නිකුත් කළ යුතුය;

(ඒ) වෛද්‍යවරයා විසින් අදාළ ඖෂධ භාවිතා කිරීමේ දී අනුගමනය කළ යුතු විශේෂ උපදෙස් ලබා දී නොමැති නම්, ඖෂධ සංග්‍රහය අනුව සම්මත උපදෙස් නිකුත් කළ යුතු ය;

(ඔ) නිකුත් කිරීම නීතියෙන් සීමා කර ඇති අවස්ථාවක, බෙහෙත් වට්ටෝරුවක් මත නිකුත් නොකිරීම, සහ නිකුත් කරන සෑම අවස්ථාවකදී ම, නිකුත් කරන ලද ප්‍රමාණය, වෛද්‍යවරයාගේ නම, ලියාපදිංචි අංකය සහ රෝගියාගේ නම සහ වයස පිළිබඳ විස්තර ඇතුළත් වන පරිදි ලේඛනයක සටහන් කිරීම කළ යුතු ය; සහ

(ඕ) නිකුත් කළ යුත්තේ, නිකුත් කිරීම් පිළිබඳ සවිස්තරාත්මක බිල්පතක් සහිතව පමණි.

67. වෙනත් යම් නීතියකින් සීමා කර ඇති ද්‍රව්‍ය විකිණීමට, එකතු කිරීමට හෝ ගබඩා කිරීමට අදහස් කරන සෑම ඔසුසලක් ම එවැනි ක්‍රියාකාරකමක් හෝ ක්‍රියාකාරකම් කරගෙන යාමට අවශ්‍ය ලියාපදිංචිය, අනුමතිය, බලපත්‍ර, සහතිකපත්‍ර හෝ අවසරපත්‍ර ලබා ගත යුතු ය.

68. සෑම ලියාපදිංචි ආයුර්වේද ඔසුසලක ම පහත පරිදි අදාළ වාර්තා තබා ගැනීම සඳහා වෙන වෙනම නාමලේඛන පවත්වාගෙන යා යුතු ය-

(අ) කාර්ය මණ්ඩල කළමනාකරණය;
(ආ) බෙහෙත් වට්ටෝරු;
(ඇ) ඖෂධ තොග මිලදී ගැනීමේ දී ලැබුණු බිල්පත්;
(ඈ) රස ඖෂධ;
(ඉ) අලෙවි කරනු ලබන (රස ඖෂධ හැර) අනෙකුත් ඖෂධ, ආයුර්වේද නිෂ්පාදන;
(ඊ) අලෙවි කරනු ලබන විෂ සහ උපවිෂ;
(උ) ඖෂධ තොග මිලදී ගැනීමේ බිල්පත්;
(ඌ) අලෙවි කරනු ලබන ආනයනික ඖෂධ; සහ
(එ) වෙනත් යම් අදාළ ලිපිලේඛන.

69. (1) ඉල්ලා සිටිනු ලබන යම් ආයුර්වේද නිෂ්පාදනයක් නිකුත් කිරීමට පෙර, ලියාපදිංචි ආයුර්වේද ඔසුසලක සේවයේ නියුතු සෑම ආයුර්වේද ඖෂධවේදියකු විසින්, ඉල්ලා සිටින යම් ආයුර්වේද නිෂ්පාදනයක් -

(අ) (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත මඟින්;

(ආ) (183 වන අධිකාරය වූ) පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත මඟින්;

(ඇ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත මඟින්;

(ඈ) (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත මඟින්;

(ඉ) (469 වන අධිකාරය වූ) සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනත මඟින්; සහ

(ඊ) (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය මඟින්,

සීමා කර ඇති ද්‍රව්‍ය අඩංගු හෝ අඩංගු නොවන බවට වගබලා ගත යුතු ය.

(2) සෑම ආයුර්වේද ඖෂධවේදියෙක් ම, (1) වන අනු නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති අදාළ නීතිවල විධිවිධාන මඟින් නියම කර ඇති පරිදි එවැනි යම් සීමා කිරීම් සහිත ද්‍රව්‍යයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් සෑම පූර්වාරක්ෂක පියවරක් ම ගත යුතු ය.

## VII වන කොටස

### ආයුර්වේද ගබඩා

70. (1) සෑම ආයුර්වේද ගබඩාවක් ම කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ පවත්වාගෙන යා යුතු ය.

(2) පහත සඳහන් ආයතන හෝ පුද්ගලයන්, එනම් -

(අ) ඖෂධ නිෂ්පාදනාගාරයක්;

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි රෝහලක්;

(ඇ) ඖෂධ අලෙවිසැලක්;

(ඈ) අවස්ථානුකූලව, ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධවල නිමි නිෂ්පාදන හෝ වියළි නිෂ්පාදන හෝ ආයුර්වේද නිෂ්පාදන සපයන්නන්;

(ඉ) ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි ඖෂධ ආනයනකරුවකු හෝ අපනයනකරුවකු හෝ බෙදාහරින්නකු;

(ඊ) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයකු; හෝ

(උ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හෝ වෙනත් අදාළ අධිකාරියක් යටතේ ලියාපදිංචි ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සමාගමක්,

ආයුර්වේද ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය.

71. (1) ආයුර්වේද ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට අදහස් කරන සෑම ඉල්ලුම්කරුවකු ම -

(අ) ඉල්ලුම්කරුගේ නමින් අදාළ කාර්යය සඳහා ව්‍යාපාර ලියාපදිංචියක් ලබා ගෙන තිබිය යුතු ය; සහ

(ආ) ඉල්ලුම්කරු, ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද ඖෂධවේදියකු සමග වසරකට නොඅඩු කාලයක් සඳහා ගිවිසුම් ගතව සිටිය යුතු ය.

(2) ආයුර්වේද ගබඩාවක කටයුතු ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද ඖෂධවේදියකුගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය. ආයුර්වේද ඖෂධවේදියකු ගිවිසුම් ගත විය යුත්තේ එක් ආයුර්වේද ගබඩාවක් සම්බන්ධයෙන් පමණි.

72. (1) ආයුර්වේද ගබඩාවක් ලියාපදිංචි කිරීම සඳහා වන සෑම ඉල්ලීමක්ම අවශ්‍ය තොරතුරු ද සමඟ මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති F ආකෘතියෙන් නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් ලැබීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචිය ලබා දීමට පෙර ආයුර්වේද ගබඩාවේ ස්ථානය පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කිරීමට සැලැස්වීම කළ යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා, ඉදිරිපත් කරනු ලබන ලේඛන සහ ස්ථානීය පරීක්ෂාවේ ප්‍රතිඵල පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු මෙහි III වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ගාස්තුව ගෙවීම මත වසරක කාලයක් සඳහා එකී ආයුර්වේද ගබඩාව ලියාපදිංචි කර ඉල්ලුම්කරුට ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම කළ යුතු ය.

(4) සෑම ලියාපදිංචියක් ම නියාමන සභාව විසින් නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු අතර එකී ලියාපදිංචිය කල් ඉකුත් වීමට මාස තුනකට පෙර ඒ සඳහා කරනු ලබන ඉල්ලීමක් මත අලුත් කළ හැකි ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින්, ගබඩා හිමිකරුගේ නම, ලිපිනය සහ ආයුර්වේද ගබඩාවේ ඇමතුම් විස්තර ද ඇතුළු සියලු ලියාපදිංචි ආයුර්වේද ගබඩාවල තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

73. සෑම ආයුර්වේද ගබඩාවක ම-

(අ) ගබඩාවේ නම සහ ලියාපදිංචි අංකය භාෂා තුනෙන්ම ප්‍රකටව දක්වාලන නාමපුවරුවක් පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතු ය;

(ආ) නියාමන සභාව වෙත ලියාපදිංචි නිෂ්පාදනාගාරවලින් සහ ආනයනකරුවන්ගෙන් මිලදී ගත් හෝ ලබා ගත් භාණ්ඩ පමණක් ගබඩා කළ යුතුය;

(ඇ) භාණ්ඩ නිකුත් කළ යුත්තේ, ඒවා මිලදී ගන්නා හෝ ලබා ගන්නා ආයතනයේ අභ්‍යන්තර ලිඛිත නියෝග මත පමණක් වන අතර ඊට අදාළ තොරතුරු සියල්ල වාර්තාගත කරන ලද යාවත්කාලීන ලේඛනයක් එකී කාර්යය සඳහා ගබඩාව විසින් පවත්වාගෙන යා යුතු ය;

(ඈ) අනවසර පුද්ගලයින් ගබඩා පරිශ්‍රයට ඇතුළුවීම වැළැක්වීමට පූර්වාරක්ෂක පියවර ගත යුතු ය;

(ඉ) ගබඩා කිරීම සම්බන්ධයෙන් උපදෙස් නොමැති අවස්ථාවක, ආයුර්වේද සංග්‍රහය මගින් නියම කරන ලද අදාළ ප්‍රමිති අනුගමනය කිරීම හෝ නියාමන සභාවේ උපදෙස් ලබාගැනීම කළ යුතු ය.

74. (1) ආයුර්වේද ගබඩාවක් ආසන්නයේ -

(අ) කසළ බැහැර කිරීමේ අංගන;
(ආ) පොදු වැසිකිළි;
(ඇ) කෘෂිරසායන අලෙවිසැල්;
(ඈ) රසායනික ද්‍රව්‍ය මිශ්‍ර කරනු ලබන ආයතන;
(ඉ) අවමංගල්‍යාගාර සහ මෘත ශරීරාගාර;
(ඊ) වාහන සේවා ස්ථාන;
(උ) ආවරණ සහිත හෝ නිසි ලෙස මුද්‍රා කර නොමැති අවිධිමත් හෝ නොසැලකිලිමත් ලෙස දුම්, දූවිලි, කාබන් සහ තාපය විමෝචනය කරනු ලබන (උළු, ප්ලාස්ටික්, ඉන්ධන පිරිපහදු ආදී) කර්මාන්ත ශාලා; සහ
(ඌ) සත්ත්ව ගොවිපලවල්,

නොතිබිය යුතු අතර ගබඩාවක් ආශ්‍රිතව නොතිබිය යුතු බවට නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් ස්ථානයක් පිහිටා නොතිබිය යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් යම් ස්ථානයක් ආයුර්වේද ගබඩාවක් අසල පසුව ස්ථාපිත කරන ලද්දේ නම්, එවැනි ස්ථාන මඟින් එකී ගබඩාවෙහි ගබඩා කර ඇති අයිතමවලට ඇති කරනු ලබන බලපෑම අවම කිරීමට සියලු පූර්වාරක්ෂක පියවර එකී ගබඩාව විසින් ගත යුතු ය.

(3) ගංවතුර සහ අනෙකුත් ස්වභාවික විපත්වලට ගොදුරු විය හැකි ප්‍රදේශයක ආයුර්වේද ගබඩාවක් පිහිටා ඇති අවස්ථාවක, එවැනි ගබඩාවක ගබඩා කර ඇති අයිතමවල ආරක්ෂාව සඳහා එකී ගබඩා පරිශ්‍රය සම්බන්ධයෙන් පූර්වාරක්ෂක සහ වැළැක්වීමේ පියවරයන් අනුගමනය කර තිබිය යුතු ය.

75. ආයුර්වේද ගබඩාවක් ලෙස භාවිතා කරන සෑම පරිශ්‍රයක ම-

(අ) ප්‍රමාණවත් ඉඩකඩ සහිත විය යුතු ය;

(ආ) නියාමන සභාව විසින් නිර්දේශ කර ඇති පරිදි එකී පිවිසුම්වල දී ද්‍රව්‍ය පැටවීම සහ බෑම සඳහා ද්‍රව්‍ය ඇතුළු කිරීම් සහ පිටකිරීමට වෙන වෙනම ධාරිතාවයන් සහ පහසුකම් සහිත පිවිසුම් තිබිය යුතු ය;

(ඇ) නිරෝධායන ඒකක ගබඩා පරිශ්‍රයෙන් පිටත පිහිටුවා තිබිය යුතු ය;

(ඈ) මූලික ද්‍රව්‍යවල නියැදි වෙනත් පරිශ්‍රයක යෝග්‍ය තත්ත්ව යටතේ හෝ එම පරිශ්‍රය තුළ වෙනම තබා ගත යුතු ය;

(ඉ) නිමි ඖෂධ සහ වියළි ඖෂධ ගබඩා කිරීම සඳහා වෙන් කළ ප්‍රදේශ දෙකක් තිබිය යුතු ය: අමු ඖෂධ ගබඩා කළ යුතු අවස්ථාවක, යෝග්‍ය පාරිසරික තත්ත්ව යටතේ ඒ කාර්යය සඳහා වෙනම ප්‍රදේශයක් භාවිතා කළ යුතු ය. මෙම සියලු ප්‍රදේශවලට වෙන් වූ පිවිසුම් තිබිය යුතු අතර ඒවා අභ්‍යන්තරිකව එකිනෙකට සම්බන්ධ නොවිය යුතු ය;

(ඊ) (i) බැර ලෝහ අඩංගු නොවන සහ පතුරු ගැලවී නොයන තීන්ත වර්ගයකින් පින්තාරු කරන ලද බිත්ති සහ සිවිලිම සහිත;

(ii) පිරිසිදු කිරීමට පහසු, ඖෂධ සමඟ ප්‍රතික්‍රියා නොකරන සහ ලිස්සන සුළු නොවන ද්‍රව්‍ය යෙදීමෙන් දෝෂ රහිතව නිසි ලෙස නිම කරන ලද බිමක් සහිත; සහ

(iii) වහල ආවරණය සහ බිත්ති අතර විවර රහිත,

ගොඩනැගිල්ලකින් සමන්විත විය යුතු ය;

(උ) දූවිලි අංශු, දුම්, සෘජු හිරු කිරණ සහ අපිරිසිදු වාතයට නිරාවරණය නොවන පරිදි ඖෂධීය ද්‍රව්‍යයන් ස්ථානගත කළ යුතු ය;

(ඌ) ඖෂධ ගබඩා කරන ස්ථාන ආලෝකය, වාතාශ්‍රය, උෂ්ණත්ව සහ ආර්ද්‍රතා යෝග්‍ය තත්ත්වය පවත්වා ගැනීමට පියවර ගත යුතු අතර වායු සමීකරණ පහසුකම් අවශ්‍ය ප්‍රදේශ සඳහා එවැනි පහසුකම් සැපයිය යුතු ය;

(එ) අපද්‍රව්‍ය සමඟ ඖෂධ මිශ්‍ර වීමේ අවදානම වළක්වා ගැනීමට හෝ අවම කිරීමට හැකි වන පරිදි ගොඩනැගිලි ව්‍යුහය සැලසුම් කළ යුතු ය;

(ඒ) කල් ඉකුත් වූ හෝ හානි වූ ඖෂධ ගබඩා කිරීම සඳහා වෙනම පහසුකම් සැපයිය යුතු ය;

(ඔ) වේයන්, කෘමීන්, කුරුල්ලන්, මීයන් සහ සුරතල් සතුන් ආදීන් ඇතුළු වීම වැළැක්වීම සඳහා සුදුසු පූර්වාරක්ෂාවන් අනුගමනය කරමින් උපරිම ප්‍රතිපාදන සහිතව සැලසුම් කිරීම සහ ගබඩා පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති සේදීමේ සහ සනීපාරක්ෂක කටයුතු සඳහා පහසුවෙන් ළඟා විය හැකි ආකාරයෙන් සම්මත සනීපාරක්ෂක ක්‍රමවේද භාවිතා කළ යුතු ය;

(ඕ) අධි ක්‍රියාකාරී ද්‍රව්‍ය, විකිරණශීලී ද්‍රව්‍ය, අන්තරායකර ඖෂධ, අන්තරායකර ද්‍රව්‍ය, සංවේදී ද්‍රව්‍ය, අනිසි ලෙස භාවිතා කළ හැකි ද්‍රව්‍ය සහ වහා ගිනි ඇවිළෙන සුළු හා පුපුරන ද්‍රව්‍ය එකිනෙකින් වෙන් කර ගබඩා කිරීමට පහසුකම් සැලසිය යුතු ය.

76. ඖෂධ ගබඩා කිරීමේ දී, සියලුම ආයුර්වේද ඖෂධ (අමු ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය) ගබඩාවට මාරු කිරීමට පෙර නිරෝධායන කටයුතු කිරීම සඳහා නිරෝධායන ඒකකයක් ස්ථාපිත කළ යුතු ය.

77. (1) නිරෝධායන ඒකකය තුළ, ලියාපදිංචි ඖෂධවේදියකුගේ අධීක්ෂණය යටතේ සම්මත නිරෝධායන ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.

(2) ඖෂධ ගබඩා කළ යුත්තේ, ආහාර සහ ඖෂධ ද්‍රව්‍ය සඳහා අනුමත ඇසුරුම් සහිතව පමණි. ඖෂධ සැපයිය යුත්තේ, නියාමන සභාව විසින් සකස් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති සම්මත ආහාර හෝ ඖෂධ ප්‍රවාහන ක්‍රමවේද භාවිත කිරීමෙන් පමණි.

(3) සෑම ගබඩාවක ම, ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා සම්මත, සහතික කළ නියැදි එකතුවක් පවත්වාගෙන යා යුතු ය.

(4) අවිනිශ්චිත තත්ත්වයක දී ඖෂධ නිසි ලෙස හඳුනා ගැනීම සඳහා වැඩිදුර පරීක්ෂණ අවශ්‍ය වූ විට, නියාමන සභාව විසින් අනුමත කරන ලද රසායනාගාරයකට සාම්පල යොමු කිරීමෙන් නිර්දේශ ඉල්ලා සිටිය යුතු ය.

(5) ආයුර්වේද ඖෂධ නිරෝධායනය කරන තෙක්, තාවකාලිකව ගබඩා කිරීම සඳහා වෙන් වූ ගබඩාවක් තිබිය යුතු ය.

(6) නිරෝධායනය කරන ලද ඖෂධවල තොරතුරු ඇතුලත් නිරෝධායන කරන ලද ඖෂධ ගබඩාවට යැවිය යුත්තේ, නිසි ලෙස ලේබල් කර සහතික කිරීමෙන් පසුව පමණි.

(7) නිරෝධායනය කරන ලද ඖෂධවල තොරතුරු ඇතුළත් නිරෝධායන නාමලේඛන නිසි ලෙස නඩත්තු කළ යුතුය.

78. (1) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කරනු ලබන සෑම ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක්, අතරමැදි නිෂ්පාදන සහ නියාමන සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන්නා වූ ඖෂධ ඇසුරුම් ද්‍රව්‍ය, නියාමන සභාව විසින් සකස් කරන ලද මාර්ගෝපදේශවල නිශ්චිතව දක්වා ඇති ආයුර්වේද ගබඩා ආදර්ශ ප්‍රමිති අනුව, වෙන වෙනම ගබඩා කළ යුතු ය.

(2) යම් ආයුර්වේද ගබඩාවක, ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලැබුණු අමුද්‍රව්‍ය හෝ බලපත්‍රලාභී නිෂ්පාදනාගාරවල නිෂ්පාදිත ඖෂධවල නිමි නිෂ්පාදන හා භාණ්ඩ පමණක් ගබඩා කළ යුතු ය.

(3) ගබඩා කිරීම සඳහා හිතකර පාරිසරික තත්ත්ව පවත්වා ගත යුතු ය. වායු සමීකරණ හෝ ශීතකරණ යටතේ ගබඩා කිරීමට අවශ්‍ය ඖෂධ ගබඩා කිරීම සඳහා වායු සමීකරණ හෝ ශීතකරණ පහසුකම් සැලසිය යුතුය.

(4) ගබඩා කරන ලද ද්‍රව්‍ය තට්ටු සහිත රාක්කවල හෝ බිම සමඟ නොගැටෙන පරිදි වේදිකාවක් මත තැන්පත් කර තැබිය යුතු ය.

(5) ගබඩා පරිශ්‍රය පිරිසිදු විය යුතු අතර අපද්‍රව්‍ය හා පළිබෝධකයන්ගෙන් තොර විය යුතු ය. ගබඩා කිරීමේ දී පිරිසිදු කිරීම් සහ නිරීක්ෂණ කටයුතු සඳහා අවකාශ තිබිය යුතු අතර පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පැහැදිලි උපදෙස් සහිත සම්මත සෞඛ්‍යාරක්ෂක ක්‍රමවේදයක් තිබිය යුතු ය.

(6) අමුද්‍රව්‍ය ගබඩා කළ යුත්තේ ඒවායේ ස්වභාවික පිරිසිදු තත්ත්වයෙන් පමණි. විවිධ ඖෂධීය අමුද්‍රව්‍ය වර්ග ලේබල් කර වෙන වෙනම ගබඩා කළ යුතු ය.

(7) ආයුර්වේද ඖෂධවල සියලුම නිමි නිෂ්පාදන උද්භිද, ඛනිජ හෝ සත්ත්වජ හෝ ඒ හා සමාන ද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කර වෙන වෙනම ගබඩා කළ යුතු ය.

(8) අධි ක්‍රියාකාරී ද්‍රව්‍ය, විකිරණශීලී ද්‍රව්‍ය, මෙම නියෝගවල IX වන පරිච්ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති ඖෂධ, අන්තරායකර ද්‍රව්‍ය, සංවේදී ද්‍රව්‍ය, අනිසි ලෙස භාවිතා කළ හැකි ද්‍රව්‍ය සහ ගිනිගන්නා සුළු හා පුපුරන ද්‍රව්‍ය ඒ ඒ ද්‍රව්‍ය සඳහා වෙන් කර ඇති ප්‍රදේශවල ගබඩා කළ යුතු ය, අදාළ දේශීය හෝ ජාත්‍යන්තර නීති රීති සහ නියෝග අනුව අනතුරු ඇඟවීමේ සහ අන්තරාය නිවාරණ ක්‍රමවේදයන්ට යටත්ව පවත්වාගෙන යා යුතු ය.

(9) අමුද්‍රව්‍ය මිශ්‍ර වීම, එකිනෙක ගැටීම් සහ ඇතුළතින් නරක්වීම වළක්වන ආකාරයෙන් ගබඩා කළ යුතු ය.

(10) එකම ඖෂධය, ප්‍රමාණය අනුව වෙන් කළ විට, නියමිත වෙන්වීම් සලකුණු සහිතව ඒවා එකම ප්‍රදේශයේ ම ඇසිරිය යුතු ය.

(11) ගබඩාවෙහි, දෛනිකව තොග ගණනය කිරීම සිදු කළ යුතු ය.

(12) (අ) ආයුර්වේද ඖෂධ ලේබලයක තොරතුරු, ඖෂධයට අදාළ වන්නා වූ හා සත්‍ය තොරතුරුවලට වඩා වෙනස් වන්නා වූ අවස්ථාවක, ඖෂධ මිශ්‍ර වීමක් හෝ වැරදි නිකුත් කිරීමක් සිදුවී ඇත්දැයි පරීක්ෂා කිරීමට පියවර ගත යුතු ය.

(ආ) ලේබලයේ අඩංගු තොරතුරුවලට වඩා වෙනස් ආයුර්වේද ඖෂධයක් වේ නම්, නියාමන සභාව විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් හඳුනාගැනීම කළ යුතු ය.

(13) ඖෂධයක කොටසක් ශේෂ වන පරිද්දෙන්, ඖෂධයක් නිකුත් කිරීමෙන් පසු, ශේෂ වූ ඖෂධ කොටස නරක් වීම සහ වියෝජනය වීම සිදු නොවන පරිදි ආරක්ෂිතව ඇසුරුම් කර ලේබල් සහිතව ගබඩා කළ යුතු ය. අමුද්‍රව්‍ය භාවිතයේ දී, ශේෂව ඇති අමුද්‍රව්‍ය කොටස් ඊළඟ නිකුතුවේ දී පළමුව නිකුත් කළ යුතු ය.

(14) කිසිදු අවස්ථාවක හානියට පත් ඇසුරුම් සහිත කිසිදු ද්‍රව්‍යයක් නිකුත් නොකළ යුතු ය. අවශ්‍ය අවස්ථාවක දී, එම ද්‍රව්‍යයෙහි තත්ත්වය පිළිබඳ අවශ්‍ය පරීක්ෂණ සඳහා එය තත්ත්ව පාලන ඒකකය වෙත යොමු කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් ගනු ලබන සියලුම ක්‍රියාමාර්ග වාර්තා කර ලේඛනගත කළ යුතු ය.

(15) කල් ඉකුත් වූ ද්‍රව්‍ය නිකුත් කිරීම වැලැක්වීම සඳහා නිසි පූර්වාරක්ෂක පියවර ගත යුතු ය. කල් ඉකුත් වූ, හානියට පත් වූ, ප්‍රතික්ෂේප කරන ලද හෝ නැවත කැඳවන ලද ඖෂධ ගබඩාවෙහි තබා නොගත යුතු ය. එවැනි ද්‍රව්‍ය නිසි ක්‍රමවේදයකට අනුව බැහැර කරන තෙක් වෙනම ස්ථානයක ගබඩා කර තැබිය යුතු ය. ඒවා පිළිබඳ වාර්තා තබා ගැනීම සඳහා වෙනම නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර ඒවා සම්බන්ධයෙන් මාසික වාර්තාවක් නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. කල් ඉකුත් වූ හෝ හානියට පත් වූ ඖෂධ, නියාමන සභාවේ අනුමතයට යටත්ව නිවැරදි ක්‍රමවේදයන්ට අනුකූලව බැහැර කළ යුතු ය.

(16) ආයුර්වේද ඖෂධ සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු ප්‍රමිති ඉක්මවා නොයන පරිදි, පළමුව ගෙන්වූ දෙය පළමුව බැහැර කිරීමේ (First in First out (FIFO) න්‍යාය මත පදනම්ව ඖෂධ නිකුත් කිරීම සඳහා ක්‍රමානුකූල ක්‍රමවේදයක් සකස් කළ යුතු ය.

79. (1) සෑම ආයුර්වේද ගබඩාවක් විසින්-

(අ) පවතින උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය පිළිබඳ නැවත පරීක්ෂා කිරීමට හැකි වන සේ වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගත යුතු ය;

(ආ) සියලුම අදාළ උපකරණ නිසි කාල පරතරයක් සහිතව පරීක්ෂා කර ඒවායේ වාර්තා තබා ගත යුතු ය;

(ඇ) පහසුවෙන් නිරීක්ෂණය කිරීමට හැකි වන පරිදි, ගබඩාවෙහි උෂ්ණත්වය උච්චාවචනය වන ආකාරය ප්‍රස්ථාරගත කර ප්‍රදර්ශනය කළ යුතු ය; සහ

(ඈ) නියමිත කාල පරාසයන් තුළ මිනුම් උපකරණ ක්‍රමාංකනය කළ යුතු ය.

(2) (1) වන අනු නියෝගයෙහි සඳහන් සියලුම වාර්තා එම ඖෂධය කල් ඉකුත් වූ දින සිට වසරක කාලයක් හෝ පවත්නා රීති හා රෙගුලාසි මගින් සපයා ඇති වෙනත් කාල සීමාවක් දක්වා සුරක්ෂිතව තබා ගත යුතු ය.

80. (1) සෑම ආයුර්වේද ගබඩාවක්ම, 79 වන නියෝගයේ සඳහන් වාර්තාවලට අතිරේකව, -

(අ) පරිශ්‍රය තුළ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ ලිඛිත වාර්තා තබා ගත යුතු ය;

(ආ) නිර්දේශිත ගබඩා කිරීම් තත්ත්ව සම්බන්ධ උපදෙස්, පූර්වාරක්ෂක පියවර, නිරීක්ෂණ සහ නැවත පරීක්ෂා කිරීම් කළ යුතු දිනය ද ඇතුළුව ගබඩා කර ඇති සියලුම අයිතමවලට අදාළ වාර්තා ලිඛිත හා විද්‍යුත් ක්‍රමවේදයන්ගෙන් පවත්වා ගත යුතු ය; සහ

(ඇ) අයිතමයේ විස්තර, එහි තත්ත්වය, ප්‍රමාණය, සැපයුම්කරු, සැපයුම්කරුගේ කාණ්ඩ අංකය, ලද දිනය සහ කල් ඉකුත්වන දිනය ඇතුළුව සෑම නිකුත් කිරීමකම පවත්වා ගත යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් වාර්තා තබාගැනීමේ දී, කාණ්ඩ අංකනය හෝ ඒ හා සමාන ක්‍රියාපිළිවෙලක් අනුව, නිශ්චිත හඳුනාගැනීමේ පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය.

81. (1) අමුද්‍රව්‍ය සහ ආයුර්වේද ඖෂධ එකිනෙකට ප්‍රතික්‍රියා නොකරන සහ බාහිර අවදානම්වලින් ආරක්ෂා වන ආකාරයෙන් ඇසුරුම්කරණය කර ගබඩා කළ යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් සෑම ඇසුරුමක ම අයිතමයේ නම, කාණ්ඩ අංකය, කල් ඉකුත්වන දිනය සහ නැවත පරීක්ෂා කිරීම සඳහා දිනය, සහ ඖෂධයේ ලියාපදිංචි අංකය අනුව විශේෂ ඇසුරුම් සඳහා කොන්දේසි පැහැදිලිව සඳහන් ලේබල තිබිය යුතු ය. නියාමන සභාව විසින් අනුමත කර නොමැති කෙටි යෙදුම්, නම් හෝ කේත ලේබලවල භාවිතා නොකළ යුතු ය.

(3) අමුද්‍රව්‍ය සහ ඖෂධ සම්බන්ධයෙන් ලද සෑම ඇණවුමකදී ම, අමුද්‍රව්‍ය සහ ඖෂධ ඇණවුම් සම්බන්ධයෙන් ලැබුණු රිසිට්පත් පරීක්ෂා කර තහවුරු කර ගත යුතු ය.

(4) සෑම ඇණවුමක් සම්බන්ධයෙන් ම අමුද්‍රව්‍ය සහ නිෂ්පාදනවල ඇසුරුම් භෞතිකව පරීක්ෂා කර තහවුරු කළ යුතු ය.

(5) ඕනෑම තොගයක සමරූපතාවය පරීක්ෂා කර තහවුරු කළ යුතු ය. යම් තොගයක් කාණ්ඩ අංක කිහිපයකට අයත් නිෂ්පාදන වලින් සමන්විත නම්, ඒවා නිසි ලෙස වෙන් කළ යුතු ය.

(6) සියලුම බහාලුම් ඒවායේ පවිත්‍රතාවය සම්බන්ධයෙන් හොඳින් පරීක්ෂා කළ යුතු අතර යම් තොගයක කැඩුණු හෝ හානි වූ බහාලුමක් හෝ අවශ්‍ය ප්‍රමිතීන්ට වඩා අඩු බහාලුමක් පැවති අවස්ථාවක, වැඩිදුර පරීක්ෂණ සඳහා සම්පූර්ණ තොගය නිරෝධායන පරිශ්‍රයේ තබා ගත යුතු ය.

(7) (අ) සුදුසුකම්ලත් සහ පුහුණු කාර්ය මණ්ඩලය විසින් අවශ්‍ය අවස්ථාවලදී තොගවල නියැදි ලබා ගත යුතු ය.

(ආ) නියාමන සභාව විසින් සපයනු ලබන ලිඛිත උපදෙස් අනුව නියැදි ගත යුතු අතර නියැදි සහිත බහාලුම් නිසි ලෙස ලේබල් කළ යුතු ය.

(ඇ) එසේ ලබා ගන්නා ලද නියැදි නිරෝධායනය කළ යුතුය. ගබඩා කිරීමේ ක්‍රියාවලියේ දී ද කාණ්ඩ වෙන් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව අනුගමනය කළ යුතු ය.

(8) බලයලත් නිලධාරියකු විසින් අනුමත හෝ ප්‍රතික්ෂේප කරන තෙක් අමුද්‍රව්‍ය හෝ ආයුර්වේද ඖෂධ නිරෝධායන ගබඩාවක තබා ගත යුතු ය.

82. (1) වේයන්, කෘමීන්, කුරුල්ලන් සහ මීයන් ආදී සතුන්ගෙන් සිදුවිය හැකි හානිය වළක්වා ගැනීම සඳහා සම්මත සෞඛ්‍යාරක්ෂක ක්‍රියා පටිපාටිවලට අනුව ගබඩා පරිශ්‍රය පිරිසිදු කළ යුතුය, එකී ක්‍රියා පටිපාටි සහ ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ ලිඛිත වාර්තා තබා ගත යුතු ය.

(2) සෑම ඇසුරුමක් බහාලුමක් ම ඒ සඳහා අදාළ වන සම්මත ක්‍රමවේදයන්ට අනුව සෑම භාවිතයකට ම පෙර සහ පසුව පිරිසිදු කළ යුතු ය.

(3) ඖෂධවලට ඇති කරන ක්ෂුද්‍ර ජීවී බලපෑම අවම කිරීම සඳහා, ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වීම වැළැක්වීමට සෑම පූර්වාරක්ෂක පියවරක් ම ගත යුතු ය.

83. (1) සෑම ආයුර්වේද ගබඩාවක් ම-

(අ) ගබඩා තුළ සිදු වන ක්‍රියාකාරකම් සඳහා වගකියනු ලබන, පහත යටතේ ලියාපදිංචි ආයුර්වේද ඖෂධවේදීන් විසින් අධීක්ෂණය කළ යුතු ය;

(ආ) ආයුර්වේද ඖෂධ පිළිබඳ දැනුමක් සහිත සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විත විය යුතු ය.

(2) කාර්යමණ්ඩලය -

(අ) වෙත ඖෂධ ගබඩා කිරීමේ ක්‍රමවේද, නියෝග සහ ආරක්ෂක ප්‍රමිති පිළිබඳ නිසි පුහුණුවක් ලබා දිය යුතුය;

(ආ) පෞද්ගලික සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳව දැනුවත් සහ පුහුණු කළ අය විය යුතු ය; සහ

(ඇ) වෙත තම රාජකාරි ඉටු කිරීමේ දී, භාවිත කිරීමට සුදුසු ආරක්ෂිත නිල ඇඳුමක් ලබා දිය යුතු ය.

84. පහත සඳහන් ලේඛන දෛනිකව යාවත්කාලීන කරමින් ගබඩා තුළ පවත්වාගෙන යා යුතුයः-

(අ) කාර්යමණ්ඩල කළමනාකරණ ලේඛනය;
(ආ) තොග නිකුත් කිරීමේ ලේඛනය;
(ඇ) ඖෂධ තොග සහ සිල්ලර මිලදී ගැනීමේ ලේඛනය සහ බිල්පත්;
(ඈ) රස ඖෂධ තොග සහ විකුණුම් ලේඛනය;
(ඉ) රස ඖෂධ හැර වෙනත් නිෂ්පාදන විකුණුම් ලේඛනය; සහ
(ඊ) ආනයනික ඖෂධ විකුණුම් ලේඛනය.

## VIII කොටස

### බෙදා හැරීම සඳහා ප්‍රමිති

85. මෙම පරිච්ඡේදයෙහි අරමුණු සඳහා-

'බෙදාහැරීම' යන්නෙන්, ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක්, ඖෂධයක් හෝ ආයුර්වේද නිෂ්පාදනයක් නිෂ්පාදනාගාරයේ සිට ප්‍රතිලාභියා වෙත ලබාදීම දක්වා සැපයුම, මිලදී ගැනීම, (වෙළඳසැලක හැර) තබා ගැනීම,

විකිණීම, ආනයනය, අපනයනය සහ ප්‍රවාහනය කිරීමේ ක්‍රියාවලිය මින් අදහස් කෙරේ. එනමුත්, එකී අයිතමය ප්‍රතිලාභියාට සෘජුවම භාර දීම මින් අදහස් නොකෙරේ.

86. ආයුර්වේද සංග්‍රහය යටතේ ප්‍රකාශිත යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක්, ඖෂධයක් හෝ ආයුර්වේද නිෂ්පාදනයක් බෙදා හැරීමේ යෙදී සිටින යම් (මින් මතු ''බෙදාහැරීමේ ලියාපදිංචිකරු'' ලෙස සඳහන් කරනු ලබන) තැනැත්තකු හෝ ආයතනයක් නියාමන සභාවේ ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කළ යුතු ය.

87. ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය, ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදන බෙදාහැරීම සඳහා ලියාපදිංචි වීමට ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන සෑම ලියාපදිංචි නිෂ්පාදනාගාරයක්ම, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි G ආකෘති පත්‍රයෙන් නියාමන සභාව වෙත ඉල්ලීමක් කළ යුතු ය.

88. 86 වන නියෝගයේ සඳහන් සෑම බෙදාහැරීමේ ලියාපදිංචිකරුවකු ම හෝ 87 වන නියෝගයේ සඳහන් ලියාපදිංචි නිෂ්පාදනාගාරයක් ම, බෙදාහැරීමේ ක්‍රියාවලියට අදාළව නියාමන සභාව වෙත ඉල්ලීමක් කළ යුතු ය.

89. සෑම බෙදාහැරීමේ මධ්‍යස්ථානයක ම-

(අ) ලියාපදිංචි ආයතනයේ නම සහ නියාමන සභාව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය සමග භාෂා තුනෙන් ම 'ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බෙදාහරින්නෙකි' යන පාඨය සහිත, අවස්ථාවෝචිත පරිදි, නාමපුවරුවක් හෝ නාමපුවරු, පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට ප්‍රධාන මාර්ගයට විවෘත වන ප්‍රධාන පිවිසුමෙහි, ප්‍රදර්ශනය කළ යුතුය;

(ආ) නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබිය යුතුය; සහ

(ඇ) නියාමන සභාව විසින් නිකුත් කරන ලද බෙදාහැරීම සඳහා වලංගු ලියාපදිංචි සහතිකයක් ආයතනයේ ප්‍රධාන කාර්යාලයෙහි සහ ප්‍රාදේශීය කාර්යාලවල පැහැදිලිව ප්‍රදර්ශනය කළ යුතු ය.

90. (1) බෙදාහැරීම සඳහා ලියාපදිංචි වී ඇති පුද්ගලයා හෝ ආයතනය විසින් භාවිතා කරනු ලබන බෙදාහැරීමේ ධාරිතාව, මාධ්‍ය සහ ප්‍රවාහන ක්‍රමවේද පිළිබඳ, නියාමන සභාව තෘප්තිමත් විය යුතු ය.

(2) ස්වභාවික විපත් හෝ ඒ හා සමාන අනපේක්ෂිත අවස්ථා හේතුවෙන් බෙදාහැරීමේ ක්‍රියාවලියට බාධා වන අවස්ථාවලදී, නියාමන සභාවේ උපදෙස් අනුගමනය කළ යුතුය. හදිසි අවස්ථාවකදී, බෙදාහැරීමේ ක්‍රියාවලියට ඇති විය හැකි බලපෑම් වැළැක්වීම සඳහා පූර්වාරක්ෂක සහ නිරෝධායන පියවරයන් අනුගමනය කළ යුතු ය.

(3) බෙදාහැරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටින සියලුම පාර්ශ්ව, බෙදාහැරීමේ ක්‍රියාවලියට අදාළ සහ මෙම කොටසේ නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(4) ආපදාවලින් විපතට පත් ජනතාවට පරිත්‍යාග ප්‍රවාහනයේ දී සහ බෙදාහැරීමේ දී ද, බෙදාහැරීමේ ක්‍රියාවලියට අදාළ මෙම කොටසේ නියෝග පිළිපැදිය යුතු ය.

91. බෙදාහැරීමේ ලියාපදිංචිය වලංගු වන්නේ නියාමන සභාවෙහි ලියාපදිංචි අනුමත නිෂ්පාදන බෙදාහැරීම් සඳහා පමණක් විය යුතු ය.

92. ලියාපදිංචි බෙදාහරින්නකු නිෂ්පාදන බෙදාහැරීම සඳහා බාහිර පාර්ශ්වයක සහාය ලබාගන්නේ නම්, එකී කාර්යය සඳහා සුදුසු වාහනයක් භාවිතා කළ යුතු ය, බෙදාහැරීමේ ක්‍රියාවලියෙන් සහ ප්‍රවාහනය, ආර්ද්‍රතාවය, උෂ්ණත්වය, භෞතික ගැටීම්වලින් නිෂ්පාදනවල ගුණාත්මකභාවයට බලපෑමක් සිදු නොවන බවට වග බලා ගත යුතු ය.

93. මෙම කොටස යටතේ බෙදාහැරීම සඳහා ලියාපදිංචි වන අවස්ථාවේ සෑම බෙදාහරින්නකු ම, නියාමන සභාව වෙත-

(අ) බෙදාහරින්නාගේ පරමාර්ථ සහ යථා පරිදි සඳහන් සහ නියාමන සභාව මගින් අනුමත කළ ලිඛිත සටහනක්;

(ආ) සැක සහිත හෝ තහවුරු කරන ලද අනවසර බෙදාහැරීම් පිළිබඳව වහාම අදාළ නිෂ්පාදකයින් සහ නියාමන සභාව දැනුවත් කිරීම සඳහා වන ක්‍රමවේදය;

(ඇ) බලයලත් සැපයුම්කරුවන්ගෙන් ලබා ගනු ලබන නිෂ්පාදන ආයතනවලට, බෙදාහැරීම සහතික කිරීම සඳහා පරිපාලන හා තාක්ෂණික ක්‍රියාකාරකම් සඳහා වන අනුමත ක්‍රමවේදය;

(ඈ) බෙදාහැරීමේ දී වන හුවමාරු කිරීම්වල දී සහ හුවමාරු කරන දෑ බෙදාහැරීමේ දී අනුගමනය කළ යුතු යාන්ත්‍රණය;

(ඉ) අනවසර බෙදාහැරීම් හෝ එවැනි අනවසර බෙදාහැරීම් සම්බන්ධයෙන් සැක කෙරෙන ස්ථාන හඳුනාගැනීමේ ලිඛිත ක්‍රමවේදයක්; සහ

(ඊ) බෙදාහැරීම්වලට සිදු විය හැකි හානි පරීක්ෂා කිරීමට බෙදාහරින්නන් විසින් බෙදාහැරීමේ ගුණාත්මකභාවය මැනීමට, ක්‍රමවේදයක්,

ඉදිරිපත් කළ යුතුය.

94. (1) ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය, ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදන බෙදාහැරීම සම්බන්ධයෙන් ලියාපදිංචිය ඉල්ලා සිටින විට, භාණ්ඩ එකිනෙක මිශ්‍ර වීම වැළැක්වීම සඳහා වාහන තුළ සුදුසු වෙන් කිරීම් කළ යුතු ය: නැතහොත් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම වාහන භාවිතා කළ යුතුය.

(2) බෙදාහැරීම සඳහා භාවිතා කරන වාහන තුන්වන පාර්ශ්වයකට අයත් හෝ කුලී පදනම මත ලබාගෙන ඇත්නම්, ඉල්ලුම්කරු විසින් වාහන හිමිකරුගෙන් කැමැත්ත පළ කිරීමේ ලිපියක්, ඔහුගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්, වාහනයේ ආදායම් බලපත්‍රයෙහි පිටපතක් සහ ලියාපදිංචි සහතිකයෙහි සහතික කරන ලද පිටපතක් ඉල්ලුම්පත්‍රය සමග නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) මෙම කොටස යටතේ බෙදාහැරීම සඳහා නියාමන සභාව විසින් අනුමත කරන ලද වාහනයක හිමිකාරිත්වය වෙනස් වීමක දී හෝ නව වාහනයක් මිලදී ගැනීමක දී, එවැනි වෙනසක් සම්බන්ධයෙන් තොරතුරු එකී වෙනස සිදු වී දින දාහතරක් ඇතුළත නියාමන සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

95. ලියාපදිංචි බෙදාහරින්නකු -

(අ) මෙම කොටස යටතේ සිදු කරනු ලබන බෙදාහැරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා වගකිව යුතු ය;

(ආ) බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ පුද්ගලයන් වෙත ඒ පිළිබඳව පැහැදිලි ලිඛිත උපදෙස් ලබා දීම සහ දැනුවත් කිරීම කළ යුතු ය;

(ඇ) මෙම නියෝග ප්‍රකාරව බෙදාහැරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ එහි නඩත්තුව සහතික කිරීම සඳහා වගකිව යුතු සහ බලයලත්, තැනැත්තකු හෝ ආයතනයක් පත් කළ යුතු ය;

(ඈ) ප්‍රශස්ත ක්‍රියාවලියෙන් වෙනස් වන්නා වූ ක්‍රමවේදයන් හඳුනා ගැනීම සහ එය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය අධිකාරී බලය සහිත සහ පහසුකම් සහිත කළමනාකරුවන් සහ තාක්ෂණික නිලධාරීන් පත් කළ යුතු ය;

(ඉ) බෙදා හරින ලද භාණ්ඩයේ ගුණාත්මකභාවයට බලපාන ප්‍රමාණයට වඩා වැඩි වගකීමක් පුද්ගලයකුට නොපැවරීමට වගබලා ගත යුතු ය;

(ඊ) බෙදාහැරීමේ සේවාවේ හෝ බෙදා හරින ලද භාණ්ඩයේ ගුණාත්මකභාවයට අහිතකර බලපෑමක් ඇති කරනු ලැබිය හැකි තැනැත්තන් සහ කළමනාකාරිත්වයන් අතර ප්‍රතිවිරුද්ධ සම්බන්ධතා වැළැක්වීමට හෝ වාණිජ, දේශපාලන, මූල්‍ය හෝ වෙනත් බලපෑම් වළක්වා ගැනීමට පියවර ගත යුතු ය;

(උ) කාර්යමණ්ඩලයේ පුද්ගලික සෞඛ්‍යය සහ පිරිසිදුකම නිරීක්ෂණය කරන බවට සහතික විය යුතු ය;

(ඍ) පුද්ගලයන්ට, දේපළවලට හා පරිසරයට හානි නොවන අයුරින් ආරක්ෂක ක්‍රමෝපාය අනුගමනය කළ යුතු ය; සහ

(එ) පවත්නා නීති යටතේ සුදුසු පරාමිතීන් අනුගමනය කරමින් අනවසර ද්‍රව්‍ය බෙදාහැරීම, ආදේශ කිරීම, ප්‍රවාහනය කිරීම, හානි කිරීම හෝ විකෘති කිරීම වැනි අවස්ථා වැළැක්වීම සඳහා කටයුතු කළ යුතු ය.

96. (1) සෑම ලියාපදිංචි බෙදාහරින්නකු ම බෙදාහැරීමේ කටයුතු සිදු කිරීම සඳහා නිසි පුහුණුව සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් යෙදවිය යුතු ය.

(2) අන්තරායකර ද්‍රව්‍ය බෙදාහැරීමේ දී, බෙදාහරින්නන් හට විශේෂ පුහුණුවක් ලබා දිය යුතුය. එකී පුහුණුවීම් පිළිබඳව නියාමන සභාව වෙත වාර්තා කළ යුතු ය.

(3) ලියාපදිංචිය ලබා ඇති බෙදාහරින්නකුගේ බෙදාහැරීමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් රාජකාරි කාලය තුළ සුදුසු නිල ඇඳුමකින් සැරසී සිටිය යුතු ය.

(4) රාජකාරි කාලය තුළ දී, කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව නිසි ලෙස තහවුරු කළ යුතු ය.

97. (1) හදිසි පරීක්ෂාවක දී ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, බෙදාහැරීම සඳහා භාවිතා කරන සියලුම වාහනවලට නිකුත් කර ඇති බෙදාහැරීමේ බලපත්‍රය, සෑමවිටම වාහනය සන්තකයේ තබා ගත යුතු ය.

(2) ප්‍රවාහනය සඳහා භාවිතා කරන වාහන අදාළ බෙදාහැරීමේ කාර්යය සඳහා යෝග්‍ය විය යුතු ය.

(3) බෙදාහැරීම සඳහා භාවිතා කරන වාහනයෙහි ඇසුරුම් ප්‍රදේශ තුළ, අදාළ නිෂ්පාදන කාණ්ඩයට සුදුසු තත්ත්වයක, ගබඩා කිරීමේ පහසුකම් තිබිය යුතු ය.

(4) එකම පරිසරයක එකට තබා ඇති විට ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය, ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදන, එකිනෙකට අහිතකර බලපෑමක් ඇති නොවන සේ එක වාහනයක ප්‍රවාහනය කළ යුතු ය.

(5) නිෂ්පාදන කාණ්ඩ එකකට වඩා වැඩි සංඛ්‍යාවක් තනි වාහනයක් භාවිතයෙන් බෙදා හැරීමේ දී, එකිනෙකට වෙන් කරන ලද මැදිරි සහ දොරවල් සහිත එකී කාර්යය සඳහා ම වන වාහනයක් භාවිත කළ යුතු ය.

(6) මෙම සංග්‍රහයේ IX වන කොටසේ විධිවිධාන අනුව, අමු හෝ වියළි අබිං හෝ කංසා ප්‍රවාහනය කළ යුතු ය.

(7) කල් ඉකුත් වූ හෝ හානි වූ ආයුර්වේද නිෂ්පාදනයක්, ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඖෂධයක් ප්‍රවාහනය කිරීමේ දී වෙන වෙනම ගබඩා කළ යුතු ය.

(8) සක්‍රීය ද්‍රව්‍ය, විකිරණශීලී ද්‍රව්‍ය, අන්තරායකර ඖෂධ, අන්තරායකර ද්‍රව්‍ය, සංවේදී භාණ්ඩ, අනිසි ලෙස භාවිත කළ හැකි ද්‍රව්‍ය සහ වහා ගිනි ඇවිලෙන සුළු හා පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ දී එකිනෙකින් වෙන්ව ගබඩා කර තබා ගත යුතු ය.

(9) අවදානම් සහ වැරදි අවම වන පරිදි ප්‍රවාහනය සඳහා භාවිත කරන වාහනය ව්‍යුහාත්මකව සැකසිය යුතු ය. එය පිරිසිදු කිරීමට පහසු සහ පහසුවෙන් අපිරිසිදු නොවන තත්ත්වයක තිබිය යුතු ය. පිටතින් අපිරිසිදු වීම වැළැක්වීම සහ නිසි වාතාශ්‍රයක් පවත්වා ගැනීම සඳහා පෙරහන් සහිත විවරයක් ද එයට යෙදිය යුතු ය. දොරවල් තදින් වසා තිබිය යුතු ය.

(10) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියක් (GPS) හරහා ඉලෙක්ට්‍රොනික ලුහුබැඳීමේ උපකරණයක් සහ දුරස්ථ වාහන හඳුනාගැනීමේ පද්ධතියක් පවත්වා ගත යුතු ය.

(11) සෑම ලියාපදිංචි වාහනයක් ම අබලන් වූ පසු ඉක්මනින් ප්‍රවාහනයෙන් ඉවත් කළ යුතු ය. එවැනි වාහන ප්‍රමාණවත් ලෙස අලුත්වැඩියා නොකර නැවත භාවිත නොකළ යුතු ය. අබලන් වූ වාහනවල තොරතුරු නියාමන සභාව වෙත දැනුම් දිය යුතු ය.

(12) සෑම වාහනයක් ම සූර්ය කිරණවලින් රත් වීම වැළැක්වීම සඳහා තාප ප්‍රතිරෝධීව නිම කළ යුතු ය.

(13) වාහන ගබඩා කිරීම සඳහා විශේෂ පහසුකම් (ඒකාකාරී උෂ්ණත්වය, ආර්ද්‍රතාවය ආදිය) සහ අවශ්‍ය ද්‍රව්‍ය වර්ග ප්‍රවාහනයට අදාළ පහසුකම් තිබිය යුතු ය. එම තත්ත්වයන් මැනීම සඳහා මිනුම් උපකරණ තිබිය යුතු ය. සමාන කාල පරාසයන් තුළ අදාළ මිනුම් උපකරණ යාවත්කාලීන කළ යුතු ය.

(14) ද්‍රව්‍ය ප්‍රවාහනයේදී ශීතකරණ පහසුකම් අවශ්‍ය වූ විටෙක, සුදුසු උෂ්ණත්ව පාලක සහිත සහ ශීතාගාර සහිත වාහන භාවිත කළ යුතු ය.

(15) විවෘත කසළ බැහැර කරන ස්ථාන සහ පොදු වැසිකිළි ආසන්නයේ වාහන ගාල් කිරීම, බහාලුම් සහ මෙහෙයුම් උපකරණ තැබීම නොකළ යුතු ය. ඖෂධ නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාමට නුසුදුසු යැයි නියාමන සභාව විසින් තීරණය කර ඇති පරිදි කෘෂි රසායන අලෙවිසැල්, රසායනික මිශ්‍ර කිරීමේ ස්ථාන, අවමංගල්‍යාගාර සහ වාහන සේවා ස්ථාන වැනි වෙනත් සාධකවලින් බැහැර වූ ස්ථානයක වාහන ගාල් කර තැබිය යුතු ය.

(16) ප්‍රවාහනය සඳහා භාවිතා කරන වාහන සතුන්ගේ ආක්‍රමණයෙන් ඈත් කර තැබිය යුතු ය.

(17) වාහනය පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සහ විෂබීජ නාශක යෙදීමේදී, වාහනයේ ගබඩා කරන ද්‍රව්‍යවලට හානි නොවන පරිදි භාවිතා කළ යුතු ය.

(18) අනවසර පුද්ගලයින්ට වාහන නිදහස් නොකළ යුතු ය.

## IX වන කොටස

### අබිං සහ අන්තරායකර ඖෂධවලට අදාළ විධිවිධාන

98. (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනතේ III සහ IV වන පරිච්ඡේදවල කුමක් සඳහන් වුව ද, පනතේ 77 වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අධිකාරිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් මෙම නියෝග බලාත්මක කිරීමේ දී-

(අ) අමු හෝ සකස් කළ අබිං ආනයනය කිරීම;

(ආ) ඒ සඳහා අබිං නිලධාරීන් ලෙස ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යම් සංඛ්‍යාවක් පත් කිරීම;

(ඇ) අමු හෝ සකස් කළ අබිං යොදා ආයුර්වේද ඖෂධ සැකසීමට, ගබඩා කිරීමට, ප්‍රවාහනයට, බෙදා හැරීමට සහ නිකුත් කිරීමට බලපත්‍ර නිකුත් කිරීම; සහ

(ඈ) ආයුර්වේද වෛද්‍ය කර්මයේ සහ ශල්‍ය කර්මයේ කාර්ය සඳහා අවශ්‍ය පරිදි ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් මධ්‍යම අබිං සංචිතය පවත්වාගෙන යාම සහ අබිං සලාක සඳහා ප්‍රාදේශීය අබිං සංචිතයෙන් ලබාගෙන පවත්වාගෙන යාම කළ යුතු ය.

99. (1) 98 (ඈ) වන නියෝගයේ සඳහන් එවැනි ඕනෑම අබිං තැන්පතුවක් නියාමන සභාව විසින් සකස් කරන ලද අදාළ නිර්ණායක, මාර්ගෝපදේශ, අධීක්ෂණය සඳහා කොන්දේසි සහ නියෝගවල අඩංගු, ක්‍රියා පටිපාටියකට යටත්ව නියාමනය කළ යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) එකී තැන්පතුවට අබිං සැපයීමේ මූලාශ්‍ර සහ අබිං ප්‍රමාණ; සහ

(ආ) එවැනි තැන්පතු නිකුත් කරන ලද පාර්ශ්වයන් සහ එසේ නිකුත් කරන ලද ප්‍රමාණ,

ඇතුළත් නිවැරදි සහ පැහැදිලි සටහන් සහිත වාර්තා පවත්වාගෙන යා යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයාගේ විධානයට යටත්ව පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා, ප්‍රාදේශීය අබිං සංචිත නඩත්තු කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු ය.

(4) නියාමන සභාව විසින් සංචිතවලින් අබිං නිකුත් කිරීම සහ භාවිතය සම්බන්ධයෙන් නීති සම්පාදනය කළ යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින්, නියාමන සභාවෙහි නිර්දේශ මත, ප්‍රධාන ප්‍රාදේශීය අබිං නිලධාරියා ලෙස පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා පත් කළ යුතු ය.

(6) ප්‍රධාන ප්‍රාදේශීය අබිං නිලධාරියා විසින් අදාළ දිස්ත්‍රික්කය සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රාදේශීය අබිං මණ්ඩලය පිහිටුවිය යුතු ය:-

(අ) නිල සාමාජිකයන් වන -

(i) මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරනු ලබන දිස්ත්‍රික් ලේකම්වරයාගෙන්;
(ii) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාගෙන්;
(iii) දිස්ත්‍රික් ආයුර්වේද රෝහල් වෛද්‍ය අධිකාරිවරයාගෙන්;
(iv) පොලිස් අධිකාරිවරයාගෙන්;
(v) ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයාගෙන්;
(vi) සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද දිස්ත්‍රික් සුරාබදු නිලධාරියාගෙන්; සහ

(ආ) කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරනු ලබන පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් තිදෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(7) කොමසාරිස් ජනරාල්වරයා විසින් බලපත්‍රයක් නිකුත් කර ඇති ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් වෙත ප්‍රාදේශීය අබිං මණ්ඩලය විසින්, අබිං නිකුත් කළ යුතු ය.

100. (1) අබිං බලපත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන ඕනෑම ආයුර්වේද වෛද්‍යවරයකු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති H ආකෘතියෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුතු ය.

(2) ඉල්ලීමක් ලැබීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයාට, එකී ඉල්ලීම ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අමතරව, බලපත්‍රය නිකුත් කිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(3) බලපත්‍රය නිකුත් කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින් එකී ඉල්ලුම්පත නිර්දේශ සඳහා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය අබිං මණ්ඩලය වෙත යොමු කළ යුතු ය.

(4) ඉල්ලීමේ සඳහන් කරුණු, ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සහ අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය අබිං මණ්ඩලය විසින් යොමු කරන ලද නිර්දේශය නිසි ලෙස සලකා බැලීමෙන් පසුව, කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් ගෙවීමෙන් පසු අබිං මිලදී ගැනීම සඳහා මෙහි IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කිරීම; හෝ

(ආ) ඒ සඳහා සාධාරණ හේතු දක්වා ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම,

කළ යුතු ය.

(5) (4) (අ) වන අනු නියෝගය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, වසරක කාලයක් සඳහා වලංගු විය යුතු අතර එකී බලපත්‍රය කල් ඉකුත් වන දිනට මාස තුනකට පෙර, මෙහි II වන උපලේඛනයේ නිශ්චිත දක්වා ඇති H ආකෘතියෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලීමක් යොමු කිරීමෙන් ලියාපදිංචිය අලුත් කළ හැකි ය.

(6) බලපත්‍ර හිමියාගේ පෙර වාර්තා සැලකිල්ලට ගනිමින්, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් ගෙවීම මත තවත් වසරකට නොඅඩු කාලයක් සඳහා, කොමසාරිස් ජනරාල්වරයාට බලපත්‍රය අලුත් කළ හැකි ය. අලුත් කිරීම සඳහා වන ඉල්ලීම කල් ඉකුත්වන දිනට මාස තුනකට පෙර ඉදිරිපත් නොකළහොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාද ගාස්තුවකට ඉල්ලුම්කරු යටත් විය යුතු ය.

(7) බලපත්‍රයක් දරන්නකු එකී බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමට පෙර අබිං මිලදී ගත යුතු ය. වලංගු කාල සීමාව අවසන් වීමෙන් පසු, යම්හෙයකින් අබිං මිලදී ගතහොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන දඩයකට යටත් විය යුතු ය.

101. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් 100 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් සහිත බලපත්‍රලාභියකු-

(අ) පනත හෝ (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනත හෝ මෙම නියෝග හෝ අබිං බලපත්‍රයේ සඳහන් නියම සහ කොන්දේසිවලට අනුකූල වීම නොසලකා හැර ඇති විට; හෝ

(ආ) අබිං භාවිතයෙන් සිදු කරන ලද නිෂ්පාදන කටයුතු අවසන් කර ඇති විට; හෝ

(ඇ) එකී බලපත්‍රයට අදාළව නිෂ්පාදන ක්‍රියාවලියේ දී නිකුත් කරන ලද අබිං නිසි ලෙස භාවිත කර නොමැති විට,

එකී බලපත්‍රය අවලංගු කළ යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ (අ) හෝ (ඇ) ඡේදය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමට පෙර, බලපත්‍රලාභියා වෙත බලපත්‍රය අවලංගු නොකිරීමට හේතු වෙත් නම්, දින තිහක් ඇතුළත හේතු දැක්වීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් අවස්ථාව ලබා දිය යුතු ය.

(3) බලපත්‍රලාභියා-

(අ) 2 වන අනු නියෝගයේ සඳහන් පරිදි නියමිත කාල සීමාව තුළ පිළිතුරු දීමට අපොහොසත් වුවහොත්; හෝ

(ආ) කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන වලංගු පැහැදිලි කිරීමක් නොසැපයූ විටක දී, හෝ

කොමසාරිස් ජනරාල්වරයා විසින් බලපත්‍රය වහාම අවලංගු කර බලපත්‍රලාභියා වෙත දැනුම්දිය යුතු ය.

(4) බලපත්‍රයක් අවලංගු කිරීමේ දී, අවලංගු කරන ලද බලපත්‍රලාභියා යටතේ සහ ඔහුගේ භාරයේ තිබූ මිලදී ගත් අබිං වහාම ක්‍රියාත්මක වන පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත නැවත භාර දිය යුතු ය.

102. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කලට නියම කරන ලද කොන්දේසි වලට යටත්ව, 'බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරයා' ලෙස 103, 104 සහ 105 නියෝගවල සඳහන් අබිං බලපත්‍රයක් හිමි ආයුර්වේද වෛද්‍යවරයකුට අබිං ලබා ගැනීම, ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, නිෂ්පාදන සඳහා භාවිතා කිරීම සහ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා අවසර දිය හැකි ය.

(2) අබිං බලපත්‍රයක් හිමි සෑම ආයුර්වේද වෛද්‍යවරයකු ම -

(අ) ඔහු භාරයේ ඇති අබිං සඳහා වගකිව යුතු ය;

(ආ) අබිං ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ ඔහුට නිකුත් කරන ලද අබිං භාවිතයෙන් ඖෂධ නිෂ්පාදනය කිරීම අධීක්ෂණය කළ යුතු ය; සහ

(ඇ) ඔහුගේ අධීක්ෂණය සහ වගකීම යටතේ, අබිං භාවිතයෙන් නිපදවන ඖෂධ වර්ග සහ ප්‍රමාණයන් පිළිබඳ වාර්ෂික වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ,

යුතු ය.

(3) නියාමන සභාව විසින් කලින් කලට යාවත්කාලීන කරනු ලබන අබිං බලපත්‍ර හිමි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

103. බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරයකු, පනතේ හෝ මෙම නියෝගවල විධිවිධාන හෝ අබිං බලපත්‍රයේ දක්වා ඇති යම් කොන්දේසියක් උල්ලංඝනය කරන්නේ නම්, අබිං බලපත්‍රය හෝ ඊට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ඔහු අදාළ නීති යටතේ වරදකට වරදකරු වේ. මෙම නියෝග යටතේ අබිං සම්බන්ධ යම් වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලබන තැනැත්තකු කොමසාරිස් ජනරාල්වරයා විසින් අසාදු ලේඛනගත කළ යුතු ය.

104. (1) නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය අබිං ලබාගැනීමට, බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරයකු විසින් අදාළ ආකෘතියෙන් නියාමන සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරුන් වෙත නිකුත් කරනු ලබන අබිං සඳහා, නියාමන සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් අය කළ හැකි ය.

(3) මෙම නියෝගවල විධිවිධාන යටතේ අබිං සඳහා වන සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන්, නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන තොරතුරු ඇතුළත් නාම ලේඛනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

(4) (1) වන අනු නියෝගය යටතේ ඉල්ලීමක් කරන විට, අබිං යෙදීමට අදහස් කරනු ලබන නිෂ්පාදන වර්ග සහ නිෂ්පාදන ප්‍රමාණ පිළිබඳ තොරතුරු සහ නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් තොරතුරු නිශ්චිතව දක්වනු ලබන කාල සීමාවක් තුළ ලබා දිය යුතු ය.

105. (1) 104 වන නියෝග යටතේ ඉල්ලීමක් කළ විට, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එකී ඉල්ලීම ලැබුණු දින සිට දින හැටක කාලයක් ඇතුළත එම ඉල්ලීම පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ඉල්ලීම කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. ප්‍රතික්ෂේප කිරීමක් ලැබී දින තිහක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඉල්ලුම්කරුට ඇත.

(2) අභියාචනා මණ්ඩලය, තමා ඉදිරියේ තබා ඇති පැහැදිලි කිරීම් සලකා බැලීමෙන් පසු-

(අ) අභියාචනය පිළිගෙන අභියාචකට අබිං නිකුත් කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට නියෝග කළ හැකි ය; හෝ

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) අභියාචනා මණ්ඩලයේ තීරණය අවසාන තීරණය විය යුතු ය.

106. (1) ඖෂධ නිෂ්පාදනයේ දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරන ලද ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ අබිං සංයෝග කිරීම සිදු කළ යුතු ය.

(2) එකී ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නිෂ්පාදන වාර්තාවෙහි තම අත්සන යෙදිය යුතු ය.

107. යම් තැනැත්තෙක්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද කංසා බලපත්‍රයක් රහිතව කංසා වගා කිරීම, සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, ආයුර්වේද නිෂ්පාදන සිදු කිරීම, ප්‍රවාහනය කිරීම හෝ අපනයනය නොකළ යුතු ය.

108. (1) ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් වෙත කංසා නිකුත් කිරීමේ දී, සංග්‍රහයේ අරමුණු බලාත්මක කිරීම සඳහා මෙහි IV වන උපලේඛනයෙහි බලපත්‍ර නිකුත් කිරීම සහ අවශ්‍ය ප්‍රමාණයට සන්තකයේ තබාගැනීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වගකිව යුතු ය.

(2) නියාමන සභාවේ නිර්දේශ අනුව, කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රාජ්‍ය ආයතන;
(ආ) අර්ධ රාජ්‍ය ආයතන; සහ
(ඇ) පුද්ගලික ආයතන,

විසින් කරනු ලබන ඉල්ලීම අනුව, කංසා භාවිතයෙන් ආයුර්වේද නිෂ්පාදන සිදු කිරීම, එකී කාර්යය සඳහා කංසා වගා කිරීම, ලබා ගැනීම, සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, විකිණීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම හෝ කංසා භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ සහ ආයුර්වේද නිෂ්පාදන අපනයනය කිරීමට බලපත්‍ර නිකුත් කළ යුතු ය.

109. නියාමන සභාවේ නිර්දේශ අනුව, කංසා ලැබීමට සුදුසුකම් ලත් ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් කාණ්ඩ කිරීම සහ ඔවුන්ට නිකුත් කළ යුතු කංසා ප්‍රමාණය නිශ්චය කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

110. (1) රෝගීන්ට ප්‍රතිකාර කිරීමේ අරමුණින්, ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකු ඖෂධ නිෂ්පාදනය සඳහා කංසා ලබා ගැනීමේ දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුන්වා දෙනු ලබන කංසා ඉල්ලුම් කිරීමේ ආකෘතියෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින් කලින් කලට තීරණය කරනු ලබන පිරිසැකසුම් ගාස්තුවක් සමග කංසා භාවිතයෙන් නිෂ්පාදනය කිරීමට අදහස් කරනු ලබන ඖෂධ සහ ආයුර්වේද නිෂ්පාදන සහ ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඇතුළත් එකී ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

(3) කංසා ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන් ම කංසා භාවිතයෙන් නිෂ්පාදනය කිරීමට අදහස් කරන ඖෂධ වර්ග, ආයුර්වේද නිෂ්පාදන, අවශ්‍ය ප්‍රමාණ සහ එම ඉල්ලීමේ සඳහන් අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත් සවිස්තරාත්මක නාමලේඛනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

(4) නියාමන සභාව -

(අ) එය වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සහ සපයා ඇති අනෙකුත් අදාළ සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින් සාධාරණ කාල සීමාවක් තුළ එකී ඉල්ලීම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හැකි ය.

(ආ) එකී ඉල්ලීම පිළිගන්නේ නම්, ඒ පිළිබඳව ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම්දිය යුතු ය.

111. (1) නියාමන සභාව විසින් එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම්, ප්‍රතික්ෂේප කළ දින සිට දින තිහක කාලයක් ඇතුළත හේතු දක්වා ඉල්ලුම්කරු දැනුවත් කළ යුතු ය. ප්‍රතික්ෂේප කිරීමක් ලැබී දින තිහක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඉල්ලුම්කරුට ඇත.

(2) (1) වන අනු නියෝගය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් හඳුන්වා දෙන ලද ආකෘතියකින්, කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා වාචික පැහැදිලි කිරීමක් අවශ්‍ය වූ විට, ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයා නියාමන සභාව හමුවේ පෙනී සිට පැහැදිලි කිරීම කළ යුතු ය. එකී අභියාචනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන කොන්දේසිවලට යටත්ව නියාමන සභාවෙහි සාමාජිකයින් අතරින් අවම වශයෙන් තිදෙනකුගෙන් සමන්විත අනු කමිටුවක් පත් කළ හැකි ය.

(3) නියාමන සභාවෙහි තීරණයෙන් අගතියට පත් වූ යම් ඉල්ලුම්කරුවකු වේ නම්, මෙම සංග්‍රහයේ X වන පරිච්ඡේදයෙහි සඳහන් අභියාචනා මණ්ඩලයක් වෙත අභියාචනා කළ හැකි ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියක් හෝ කොන්දේසි කිහිපයක් හෝ උල්ලංඝනය වී ඇත්නම්, හෝ (2) වන අනු නියෝගය යටතේ හෝ අනුමත කිරීමෙන් පසුව සිදු කරනු ලබන කිසියම් විමර්ශනයක දී, නියාමන සභාවේ නිර්දේශය මත කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවීම සහ ඉල්ලුම්කරු අසාදු ලේඛනගත කළ යුතු ය.

112. (1) කංසා භාවිතයෙන් ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය හෝ ඖෂධ සහ ආයුර්වේද නිෂ්පාදන නිෂ්පාදනය කිරීමට හෝ ඒ සඳහා කංසා වගා කිරීමට, ලබා ගැනීමට, ළඟ තබා ගැනීමට, ගබඩා කිරීමට, බෙදා හැරීමට, ප්‍රවාහනය කිරීමට හෝ අපනයනය සහ දේශීය විකුණුම් යන දෙකටම හෝ කැමති රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක් විසින් අදාළ කාර්යය සඳහා බලපත්‍රයක් ලබාගැනීමට නියාමන සභාව වෙත ඉල්ලුම් කළ යුතු ය.

(2) නියාමන සභාව විසින් ඉඩ සලසන විට විවෘත ලංසු තැබීමේ අවස්ථාවක දී, ඒ සඳහා ශක්‍යතා වාර්තාවක් සහ ව්‍යාපෘති යෝජනාවක් සහිතව අභිලාෂ පත්‍රයක් මාර්ගයෙන් නියාමන සභාව වෙත ඉල්ලුම් කළ යුතු ය.

(3) නියාමන සභාව විසින් සිය තීරණය ගැනීමට පෙර, ව්‍යාපෘති යෝජනාව සහ ශක්‍යතා වාර්තාව ඇගයීම සඳහා ඖෂධීය පැළෑටි ඇගයීමේ කමිටුව වෙත සහ අවශ්‍ය වේ නම්, නිර්දේශ ලබා ගැනීම සඳහා වෙනත් අදාළ අධිකාරියක් වෙත යොමු කළ හැකි ය.

(4) බලපත්‍ර නිකුත් කිරීමට පෙර ව්‍යාපෘති යෝජනාව පිළිබඳ වැඩිදුර තොරතුරු අවශ්‍ය අවස්ථාවකදී, නියාමන සභාව විසින් ඉල්ලුම්කරුගෙන් අදාළ තොරතුරු ඉල්ලා සිටිය හැකිය.

113. (1) 110 (2) වන නියෝගය යටතේ අභිලාෂ පත්‍රයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත සෑම ඉල්ලුම්කරුවකු ම-

(අ) නෛතික පුද්ගලයෙක් විය යුතු ය;

(ආ) මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති I ආකෘතියෙන් එක් ලිඛිත ඉල්ලීමක් පමණක් ඉදිරිපත් කළ යුතු අතර එක් ඉල්ලුම්කරුවකු එකී ආකෘතිය ඉල්ලා ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(ඇ) වලංගු ලියාපදිංචි දේශීය ඖෂධ නිෂ්පාදනාගාරයක හෝ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යන ආයතනයක හිමිකරුවකු විය යුතු ය;

(2) නියමිත කාල සීමාව තුළ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(3) අදාළ සියලුම ලියකියවිලි ඉල්ලීම සමග ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතු ය.

(4) ඉල්ලීම සමග ව්‍යාපෘති යෝජනාව සහ ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(5) අභිලාෂ පත්‍රයෙහි (EOI) සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර අඛණ්ඩව පවත්වාගෙන යාමට ඉල්ලුම්කරුගේ කැමැත්ත ප්‍රකාශ කරන දිවුරුම් ප්‍රකාශයක් සහ ඉල්ලීම කරනු ලබන ආයතනයකට අදාළ අනුයාත ආසන්න වසර දෙකක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්තා සෑම ඉල්ලුම්පතක් සමගම ඉදිරිපත් කළ යුතු ය.

(6) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පතක පසුව කරනු ලබන යම් නිවැරදි කිරීමක් වේ නම්, එය නිල් තීන්ත භාවිතයෙන් අත් අකුරින් සටහන් කර ඉල්ලුම්කරුගේ අනුඅත්සන යෙදිය යුතු ය.

114. (1) 113 වන නියෝගය යටතේ කරනු ලබන ඉල්ලීම සලකා බැලීමෙන් පසු නියාමන සභාව විසින්, මෙහි ෂෂ වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආපසු ගෙවන තැන්පතුවක් අයකර ගැනීමෙන් පසු, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සකස් කිරීමේ කාර්යය සඳහා මාස හයක (6) කාලයකට තාවකාලික බලපත්‍රයක් නිකුත් කළ යුතු ය. කිසිඳු තැනැත්තකු තාවකාලික බලපත්‍රයක් යටතේ ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භ නොකළ යුතු ය.

(2) ආපසු ගෙවනු ලබන තැන්පතුව -

(අ) ඉල්ලීම භාර දෙනු ලැබූ දිනයේ පැවති එක්සත් ජනපද ඩොලර් වලට සමාන විනිමය අනුපාතිකයට අනුව, දේශීය මුදලින්;

(ආ) මාස හයක කාලයක් ඉකුත් වූ පසු, ඉල්ලුම්කරු ව්‍යාපෘතිය පවත්වාගෙන නොයන්නේ නම් එකී තැන්පතුවෙන් 10% ක් අය කර ගැනීමෙන් පසු;

(ඇ) ව්‍යාපෘතියේ වැඩ කටයුතු මගින් පරිසර හානියක් හෝ වෙනත් ඒ හා සමාන හානියක් සිදු වී ඇත්නම්, නියාමන සභාව විසින් තත්කාර්යය සඳහා පත් කරනු ලබන කමිටුවක් මගින් ඉදිරිපත් කරනු ලබන තක්සේරු වාර්තාවකට අනුව, නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන පාඩුව පියවා ගැනීමට ප්‍රමාණවත් වටිනාකම තැන්පතුවෙන් අය කර ගැනීමෙන් පසු;

(ඇ) 115 වන නියෝගයේ (2) වන අනු නියෝගය යටතේ සඳහන් කර ඇති තැන්පතුවක් කිරීමෙන් අනතුරුව ස්ථිර බලපත්‍රය ලැබීමෙන් පසු,

ව පමණක් ආපසු ගෙවිය යුතු ය.

(3) ස්ථිර බලපත්‍රයක් සඳහා ඉල්ලුම් නොකළ තාවකාලික බලපත්‍රලාභියකුට, තම ව්‍යාපෘති දේපල විකිණීමට හැකි ය. එසේ වුවත්, කිසිදු හේතුවක් මත තාවකාලික බලපත්‍රයක් වෙනත් අයකු නමට මාරු කළ නොහැකි ය.

115. (1) කංසා ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර තාවකාලික බලපත්‍රලාභියකු විසින් ස්ථිර බලපත්‍රයක් ලබා ගත යුතුය.

(2) ඖෂධීය පැළෑටි ඇගයීමේ කමිටුවෙහි නිර්දේශ ලැබීමෙන් පසු හා එම නිර්දේශ ඇගයීමට ලක් කිරීමෙන් පසු මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සහ තැන්පතුව ගෙවීමෙන් පසු, නියාමන සභාව විසින් ඉල්ලුම්කරුට ස්ථිර බලපත්‍රය නිකුත් කළ යුතු අතර ඉන් පසු මෙම සංග්‍රහයේ කාර්යය සඳහා ඉල්ලුම්කරු "කංසා බලපත්‍රලාභියකු" ලෙස හැඳින්විය යුතු ය.

(3) කංසා බලපත්‍රලාභියකු ස්ථිර බලපත්‍රයක් නිකුත් කළ දිනයේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භ කළ යුතු අතර සෑම මාසයකම තිස් වන දිනට හෝ ඊට පෙර ඊට පූර්වයෙන් වූ මාසය තුළ සිදු කරන ලද මෙහෙයුම් පිළිබඳ නියාමන සභාව වෙත සවිස්තර වාර්තාවක් සැපයිය යුතු ය. කංසා යොදා සාදන ලද ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය, ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදන අපනයනය කිරීමේ දී, එක් එක් නැව්ගත කිරීම්වලට අදාළ ලියකියවිලි පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර කොමසාරිස් ජනරාල්වරයාගෙන් විරෝධතා රහිත බවට, වන ලියවිල්ලක් ලබා ගත යුතු ය.

(4) සෑම කංසා බලපත්‍රලාභියකු ම, කංසා අඩංගු නිෂ්පාදන තොගයක් අපනයනය කිරීමට පෙර,

(අ) විද්‍යුත් ප්‍රේෂණ මාධ්‍යයෙන් (Telegraph Transfer); හෝ
(ආ) නැවත කැඳවිය නොහැකි ණයවර ලිපියක් (Letter of Credit).

මඟින්, මුදල් ලැබීම සහතික කර ගත යුතු ය.

(5) කංසා යොදා සාදන ලද ප්‍රකාශිත භාණ්ඩ, ද්‍රව්‍ය, ඖෂධ හෝ ආයුර්වේද නිෂ්පාදන අපනයනය සම්බන්ධයෙන්, නැව්ගත කිරීමෙන් මාස තුනක් ඇතුළත හෝ ඊළඟ නැව්ගත කිරීමට පෙර යන දෙකෙන් පළමුව යෙදෙන දිනයට ප්‍රථම අපනයනකරු විසින් කලින් නැව්ගත කරන ලද තොගයට අදාළව ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් නිකුත් කළ මුදල් ලද බවට වන ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

(6) සියලුම බිල්පත් ප්‍රමාණාත්මකව අපේක්ෂිත තොගයේ වෙළඳපල වටිනාකමට අදාළ විය යුතු ය. එම වටිනාකම් අවතක්සේරු කිරීම, අධි තක්සේරු කිරීම හෝ ආනයන අපනයන නියෝග උල්ලංඝනය කිරීම, (2) වන අනු නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීමට හේතු විය යුතු ය.

(7) ඉහත නියම කරන ලද පරිදි සපයා ඇති තොරතුරු අසත්‍ය බව පෙනී ගිය විට, තාවකාලික බලපත්‍රය හෝ ස්ථිර බලපත්‍රය හේතු දැක්වීමකින් තොරව අවලංගු කළ හැකි ය.

(8) ව්‍යාපෘතියට අදාළ තොරතුරුවල යම් වෙනසක් වේ නම්, ඒ පිළිබඳ වහාම ලිඛිතව නියාමන සභාව වෙත දැනුම් දිය යුතු ය.

(9) බලයලත් නිලධාරියකුට හෝ නිලධාරීන්ට දවසේ ඕනෑම වේලාවක කංසා ව්‍යාපෘතියට අදාළ පරිශ්‍ර, නිෂ්පාදනාගාර, ක්ෂේත්‍ර, වගාව, අස්වැන්න හෝ ගබඩා පරීක්ෂා කිරීමට ඉඩ සැලසිය යුතු ය.

(10) කංසා බලපත්‍රලාභියකු, කංසා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී-

(අ) වගා කිරීමේ දී, නිෂ්පාදනයේ දී, ගබඩා කිරීමේ දී, ප්‍රවාහනයේ දී, අලෙවිකරණයේ දී සහ අපනයනයේ දී නිර්දේශිත ආකාරයෙන් නිසි අධීක්ෂණය, ප්‍රමාණවත් සැලකිල්ල සහ ආරක්ෂිත පියවර යෙදවිය යුතු අතර ඒ සම්බන්ධයෙන් වූ සියලුම ක්‍රියාමාර්ග සහ ශිල්පීය ක්‍රම කංසා බලපත්‍රලාභියා විසින් සපයා ගත යුතු ය;

(ආ) බාහිර සමාජයෙන් හුදකලා වූ කලාපයක් ලෙස ව්‍යාපෘති ප්‍රදේශ නඩත්තු කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කළ යුතුය;

(ඇ) ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි දැඩි ආරක්ෂිත වැටවල් සහ මායිම් තාප්ප ඉදි කළ යුතු ය;

(ඈ) මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි නිරීක්ෂණ මුරපොලවල් පිහිටුවා, සීමා වැටවල් සහ තාප්ප අසල මුර සංචාරයේ යෙදවීම සහ අඛණ්ඩ රාජකාරි සඳහා සන්නද්ධ ආරක්ෂක නිලධාරීන් යෙදවීමට කටයුතු සලසාගත යුතු ය.

(ඉ) සූර්ය බලශක්තියෙන් හෝ විකල්ප බලශක්තියෙන් හෝ ජාතික විදුලිබල පද්ධතියෙන් බල ගැන්වෙන අඛණ්ඩ ආලෝක පද්ධතියක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතු ය;

(ඊ) අඛණ්ඩ ආලෝක පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා, අවශ්‍ය මුළු ධාරිතාවෙන් 25%කට වඩා වැඩි ධාරිතාවක් උත්පාදනය කරන ස්වයංක්‍රීය විදුලි උත්පාදක යන්ත්‍ර, අතිරේකව ස්ථාපිත කළ යුතු ය;

(උ) පරිශ්‍රයට ඇතුළු වන සෑම පුද්ගලයකු ම හඳුනාගත හැකි වන පරිදි පරිශ්‍රය ආලෝකවත් කළ යුතු ය;

(ඌ) ව්‍යාපෘතියේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි අවම වශයෙන් පැයකට වරක්වත් දිවා රාත්‍රී අඛණ්ඩ මුර සංචාරයේ යෙදෙන සන්නද්ධ ආරක්ෂකයින් යොදවා ඒ පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය;

(එ) විද්‍යුත් නිරීක්ෂණ කැමරා පද්ධතියකින් සමන්විත විය යුතු අතර, අදාළ පරිශ්‍රයේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි නිරීක්ෂණ කටයුතු සඳහා පූර්ණ ආරක්ෂිත නිරීක්ෂණ කාමරයක් ස්ථාපිත කළ යුතු ය;

(ඒ) වාහන සහ පුද්ගල ප්‍රවේශ පාලනය සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කර එහි අඛණ්ඩතාව පවත්වා ගෙන යා යුතු ය;

(ඔ) අනවසර ඇතුල්වන්නන් හඳුනා ගැනීම සහ පාලනය කිරීම සඳහා විධිමත් පද්ධතියක් ස්ථාපනය කළ යුතු ය;

(ඕ) පරිශ්‍රයේ අභ්‍යන්තර හා බාහිර ආරක්ෂාව සහතික කිරීම සඳහා හදිසි ප්‍රතිචාර කණ්ඩායමක් සහ අදාළ ප්‍රදේශයේ අනතුරු ඇඟවීමේ සංඥා නිරීක්ෂණ ස්ථාන ස්ථාපිත කළ යුතු ය;

(ක) අනුමත බහාලුම් ක්‍රම යොදමින් කංසා නිෂ්පාදන සෞඛ්‍යාරක්ෂිතව ඇසුරුම් කළ යුතු ය;

(ග) කංසා අඩංගු අමුද්‍රව්‍ය හෝ නිෂ්පාදන ප්‍රවාහනය කිරීමේ දී සන්නද්ධ පිරිස් යෙදවිය යුතු ය;

(ච) කංසා අඩංගු අමුද්‍රව්‍ය හෝ නිෂ්පාදන ඇසුරුම් කිරීම, ප්‍රවාහනය, විකිණීම සහ අපනයනය කිරීමේ දී අධි ආරක්ෂිත මුද්‍රා තැබීමේ ක්‍රම එකක් හෝ කිහිපයක් භාවිතා කළ යුතු ය; සහ

(ජ) සෑම පරිශ්‍රයකම සේවයේ නියුතු සියලුම සේවකයන්ගේ පැමිණීමේ ලේඛනයක් නිවැරදිව හා අඛණ්ඩව නඩත්තු කළ යුතු ය.

116. මෙම සංග්‍රහය යටතේ නිකුත් කරනු ලබන සෑම කංසා බලපත්‍රයක් ම -

(අ) මෙහි IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් විය යුතු ය;

(ආ) එහි නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට සහ මෙම සංග්‍රහයේ අරමුණු සඳහා අවසර දී ඇති ප්‍රමාණයට වෙනත් ඕනෑම ලිඛිත නීතියක විධිවිධානවලට යටත් විය යුතු ය;

(ඇ) එය නිකුත් කර ඇති නිශ්චිත කාර්යය සම්බන්ධයෙන් පමණක් වලංගු වේ; සහ

(ඇ) වසරක කාලයක් සඳහා වලංගු වන අතර, බලපත්‍ර කාලය අවසන් වීමට දින අනූවකට පෙර නැවත ඉල්ලීමක් කිරීමෙන් අලුත් කළ හැකි ය.

117. (1) මෙම සංග්‍රහය යටතේ නිකුත් කරනු ලබන කංසා බලපත්‍රයක්, එහි වලංගු කාලය ඉකුත් වීමට දින අනූවකට පෙර මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි I ආකෘතියෙන් නියාමන සභාව වෙත නැවත ඉල්ලීමක් කිරීමෙන් අලුත් කළ හැකි ය.

(2) බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරයා හෝ කංසා බලපත්‍රලාභියා පනතේ වෙනත් යම් ලිඛිත නීතියක හෝ මෙම සංග්‍රහයේ විධිවිධානවලට සහ බලපත්‍රයේ දක්වා ඇති වෙනත් යම් නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇති බවට සෑහීමකට පත්වන්නේ නම් පමණක් නියාමන සභාව විසින් කංසා බලපත්‍රයක් අලුත් කරනු ලැබිය යුතු ය.

118. (1) 117 වන නියෝගයේ (1) වන අනු නියෝගය යටතේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් දින තිහක් තුළ, නියාමන සභාව විසින්-

(අ) නිර්දේශය සඳහා ඉල්ලීම ඖෂධීය පැළෑටි ඇගයීමේ කමිටුව වෙත හෝ වෙනත් අධිකාරියක් වෙත යොමු කිරීම; හෝ

(ආ) හේතු දක්වා ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කිරීම,

කළ හැකි ය.

(2) නිර්දේශවල නිශ්චිතව දක්වා ඇති කාරණාවක් හෝ කාරණා සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවක, නියාමන සභාව විසින් එකී තොරතුරු ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(3) නිර්දේශ ලැබීමෙන් පසු සහ ඉල්ලුම්කරු විසින් සපයා ඇති තොරතුරු සලකා බැලීමෙන් අනතුරුව හා බලපත්‍රයේ සියලුම නියම සහ කොන්දේසිවලට අනුකූල වී ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු, නියාමන සභාව විසින්-

(අ) මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ගාස්තුව ගෙවනු ලැබීම මත වසරක කාලයක් සඳහා එකී බලපත්‍රය අලුත් කිරීම; හෝ

(ආ) හේතු දක්වා බලපත්‍රය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම,

කළ යුතු ය.

119. බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක, නියාමන සභාව විසින් -

(අ) එවැනි බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරයකුගේ හෝ කංසා බලපත්‍රලාභියාගේ නම අදාළ ලේඛනයෙන් ඉවත් කිරීම; සහ

(ආ) දැනටමත් නිෂ්පාදනය කර ඇති නමුත් වෙළඳපොළට නිකුත් නොකළ භාණ්ඩ, තවමත් නිෂ්පාදනය කරමින් පවතින භාණ්ඩ, කංසා වගා ක්ෂේත්‍ර, බෝග සහ අස්වැන්න කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දීම සඳහා සුදුසු යැයි සැලකෙන ක්‍රියාමාර්ගයන් ගැනීම,

කළ යුතු ය.

120. බලපත්‍රය අවලංගු කළ විට, බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරයා හෝ කංසා බලපත්‍රලාභියා විසින් තමන් සන්තකයේ පවතින කංසා වගාව, අස්වැන්න, ඉතිරි තොග සහ ආයුර්වේද නිෂ්පාදන වහාම කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දිය යුතු ය. එවැනි තොරතුරු ලද වහාම කොමසාරිස් ජනරාල්වරයා විසින් එම පරිශ්‍රයන් තම භාරයට ගෙන මුද්‍රා තැබිය යුතු ය.

121. (1) මෙම සංග්‍රහය යටතේ, කංසා බලපත්‍රයක් ඇති සෑම ආයුර්වේද වෛද්‍යවරයෙක් ම තමන්ගේ අධීක්ෂණය යටතේ පවතින කංසා ප්‍රමාණයේ උපයෝගීතාව සහිතව කොමසාරිස් ජනරාල්වරයා විසින් දක්වා ඇති ආකෘතියකට අනුව සකසන ලද වාර්ෂික

වාර්තාවක් සහ විගණනය කරන ලද මූල්‍ය වාර්තාවක් ද කංසා සම්බන්ධයෙන් තමා වෙත පවත්නා වගකීමේ ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) කංසා බලපත්‍රලාභී සියලුම ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ක්‍රියාකාරකම් සහිත යාවත්කාලීන නාම ලේඛනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නඩත්තු කළ යුතු ය.

122. යම් ආයුර්වේද වෛද්‍යවරයකු හෝ කංසා බලපත්‍රලාභියකු හෝ වෙනත් යම් තැනැත්තෙක් මෙම සංග්‍රහයේ කාර්යය සඳහා මෙම කොටසේ විධිවිධාන මගින් අවසර දී ඇති ප්‍රමාණයට හැර, නියාමන සභාව විසින් නිශ්චිතව දක්වා ඇති යම් නියමයක්, කොන්දේසියක් සහ ඕනෑම ලිඛිත නීතියක කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කරනු ලැබුවහොත්, කංසා බලපත්‍රයට අදාළව, පනත හෝ වෙනත් නීතියක් යටතේ දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු විය යුතු අතර එකී විධිවිධානවලට අනුව එකී තැනැත්තා සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

123. (1) කංසා බලපත්‍රලාභියකු විසින් කංසාවල අවශේෂ පමණක් බැහැර කළ යුතු ය. ඒ සම්බන්ධයෙන් නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන ආරක්ෂක පරාමිතීන් යටතේ ගිවිසුමකට එළැඹ, කර්මාන්ත අමාත්‍යාංශයෙහි ලියාපදිංචි වෙනත් ඕනෑම කර්මාන්තායතනයකට කංසා අවශේෂ විකිණිය හැකි ය.

(2) කංසා බලපත්‍රලාභියා විසින් අවශේෂ කංසා තොග සම්බන්ධයෙන් නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

124. (1) ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයාගේ නිගමනය අනුව,

(අ) බලපත්‍රලාභී ආයුර්වේද වෛද්‍යවරයකු හෝ කංසා බලපත්‍රලාභියකු විසින් කිසියම් කංසා බලපත්‍රයක් නිකුත් කරන ලද යම් නියමයකට, කොන්දේසියකට අනුකූල වීම නොසලකා හැර ඇති විට;

(ආ) අබිං භාවිතයෙන් සිදු කරන ලද නිෂ්පාදන කටයුතු අවසන් කර ඇති විට;

(ඇ) ලියාපදිංචි නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සඳහා නිකුත් කරන ලද අබිං නිසි ලෙස භාවිතා කර නොමැති විට;

(ඈ) මෙම කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නකු නියාමන සභාව විසින් පනවා ඇති යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූල වීම නොසලකා හැර ඇති විට; හෝ

(ඉ) මෙම කොටස යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරන්නා විසින් පනතේ හෝ මෙම සංග්‍රහයේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ මාර්ගෝපදේශයක් උල්ලංඝනය කර ඇති විට;

ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා විසින් අදාළ බලපත්‍රය තාවකාලිකව අත්හිටුවා, නියාමන සභාව වෙත තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර නියාමන සභාවේ නිර්දේශ සහිතව බලපත්‍රය අත්හිටුවීමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය. එකී කරුණු සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශනය කිරීමට අවශ්‍ය වේ නම්, ඒ සඳහා නියාමන සභාවේ සාමාජිකයින් අතරින් අවම වශයෙන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ හැකි ය.

(2) එවැනි අත්හිටුවීමක දී, නියාමන සභාව විසින් අත්හිටුවීමේ නිවේදනයක් නිකුත් කළ යුතු ය.

(3) එකී නිවේදනයේ අදාළ බලපත්‍රය සහ අත්හිටුවීමට හේතු ද එකී බලපත්‍රය අවලංගු නොකර සිටීමට එකී නිවේදනය නිකුත් කිරීමෙන් දින දාහතරක් ඇතුළත ලිඛිතව හේතු ඉදිරිපත් කරන ලෙසට නියම කිරීමක් ද අන්තර්ගත විය යුතු ය.

(4) (3) වන අනුනියෝගය යටතේ නියම කර ඇති කාල සීමාව තුළ කංසා බලපත්‍රලාභියා විසින් හේතු ඉදිරිපත් කිරීම නොසලකා හැරි අවස්ථාවක දී හෝ ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම් සලකා බැලීමෙන් පසුව, නියාමන සභාවේ තීරණය වහාම එකී කංසා බලපත්‍රලාභියා වෙත දැනුම් දිය යුතු ය.

(5) බලපත්‍රයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට නියාමන සභාව විසින් තීරණය කරනු ලබන්නේ නම්, අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ නියෝගවලට අවනත වීම බලපත්‍රලාභියාගේ වගකීම වේ. ඊට අවනත නොවීම මෙම සංග්‍රහයේ විධිවිධානයන් උල්ලංඝනය කිරීමක් වේ.

(6) (අ) කංසා බලපත්‍රලාභියකු බලපත්‍රයේ වලංගු කාලය ඉකුත්වීමට පෙර, එකී බලපත්‍රයට අදාළ කාර්යයන් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ආ) එකී බලපත්‍රයේ වලංගු කාලය අවසන් වන දිනට, කිසියම් කංසා ප්‍රමාණයක් භාවිතයට නොගෙන ඉතිරිව තිබේ නම්, ඒවා නියමිත පරිදි අදාළ බලධාරියා වෙත භාර දිය යුතු ය.

125. (1) මෙම සංග්‍රහයෙහි කොන්දේසිවලට අනුව, කොමසාරිස් ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කංසා තැන්පතුවක් නඩත්තු කළ යුතු ය. නියාමන සභාව විසින් සකස් කරනු ලබන ක්‍රියා පටිපාටියක් මඟින් එහි සියලුම ක්‍රියාකාරකම් නියාමනය කළ යුතු ය.

(2) කංසා තැන්පතුවක් නඩත්තු කිරීමට අදාළව, සපුරාලිය යුතු අවශ්‍යතා, අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ, නියම කළ යුතු කොන්දේසි සහ එම තැන්පතුවට කංසා ලැබීමේ මූලාශ්‍ර සහ බෙදා හැරීමේ ක්‍රමවේදවලට අදාළ පැහැදිලි නිර්ණායක එම ක්‍රියා පටිපාටියට අඩංගු විය යුතු ය.

(3) මෙම සංග්‍රහයට අනුව බැහැර කිරීම සඳහා නිකුත් කිරීමේ බලධාරියා වෙත භාර දෙනු ලබන කංසා ගබඩා කිරීම සඳහා බැහැර කිරීමේ ගබඩාවක් පවත්වාගෙන යා යුතු ය. නියාමන සභාව විසින් සකස් කරනු ලබන ක්‍රියා පටිපාටියක් මඟින් බැහැර කිරීමේ ගබඩාවෙහි සියලුම ක්‍රියාකාරකම් නියාමනය කළ යුතු ය.

126. (1) ඖෂධීය කංසා ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ දිරිමත් කිරීම සහ එම නිෂ්පාදන භාවිතයෙන් ලැබෙන ප්‍රතිඵල මත පදනම්ව ඒවායේ බුද්ධිමය භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ සහ නියාමන සභාවෙහි නිර්දේශ සමාලෝචනය කිරීම කොමසාරිස් ජනරාල්වරයාට සිදු කළ හැකි ය.

(2) නියාමන සභාවෙහි නිර්දේශ සහ මෙම සංග්‍රහයෙහි කොන්දේසිවලට යටත්ව, ඖෂධීය කංසාවලින් ලබාගත් කිසියම් සංඝටකයක් හෝ කිසියම් ව්‍යුත්පන්නයක්, අපනයනය කිරීම, ගබඩා කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ විකිණීම සඳහා අවසරය ලබා දීමට කොමසාරිස් ජනරාල්වරයාට හැකි ය.

127. (1) විෂ, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව කංසා අඩංගු ඕනෑම ඖෂධයක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත හැක්කේ, මෙම සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට සාක්ෂි සහිතව ඔප්පු කර ඇත්නම් පමණි.

(2) කංසා වගා කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ කංසා භාවිතයෙන් සිදු කරනු ලබන ඖෂධීය නිෂ්පාදන අපනයනය කිරීම සහ එකී ඖෂධ ගබඩා කිරීම සහ අලෙවි කිරීමට අදාළ, මෙම සංග්‍රහය යටතේ නියාමන සභාව විසින් ලියාපදිංචි කරන ලද ඕනෑම පරිශ්‍රයක්, ඕනෑම වේලාවක, නියාමන සභාව හෝ කොමසාරිස් ජනරාල්වරයා හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක කාර්යය සඳහා යම් බලපත්‍රලත් නිලධරයකු මේ සංග්‍රහය යටතේ ලියාපදිංචි වී ඇති ඕනෑම පරිශ්‍රයකට ඇතුළු වීමේ දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු සමඟ යා යුතු ය.

## X වන කොටස

### අභියාචනා මණ්ඩලය

128. (1) මෙම සංග්‍රහය යටතේ යම් කාරණාවක් සම්බන්ධයෙන් නියාමන සභාවෙහි තීරණයකින් අතෘප්තියට පත් වූ තැනැත්තන්ගේ අභියාචනා විභාග කර නිශ්චය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් එක් එක් කාරණාවක් සම්බන්ධයෙන් වන (මින් මතු "අභියාචනා මණ්ඩලය" ලෙසින් හඳුන්වනු ලබන) අභියාචනා මණ්ඩල යම් සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන අනුනියෝගය යටතේ පත්කරනු ලබන අභියාචනා මණ්ඩලයක් විෂය මූලික විය යුතු අතර -

(අ) සභාපති වශයෙන් කටයුතු කළ යුතු විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරුවරයකු; සහ

(ආ) අභියාචනාවට අදාළ කාරණාව පිළිබඳ පළපුරුද්ද සහ විශිෂ්ටත්වයක් දක්වන තැනැත්තන් දෙදෙනකු,

ගෙන් සමන්විත විය යුතුය.

(3) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් අදාළ කාරණාව සඳහා වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර එකී සාමාජිකයන් අනුගාමී හෝ නොවන තවත් එක් වාරයක් සඳහා, පත් කරනු ලැබිය හැකි ය.

(4) අභියාචනා මණ්ඩලයකට කරනු ලබන සෑම පත්කිරීමක් ම යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය.

(5) අභියාචනා මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රීති පනවනු ලැබිය යුතු ය.

(6) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් අභියාචනා මණ්ඩල සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

129. (අ) නියාමන සභාවේ තීරණයකින් අගතියට පත් වූ පුද්ගලයන්ගේ අභියාචනා විභාග කර තීන්දු ලබා දීමට;

(ආ) එකී අභියාචනා මණ්ඩලයට නියම කළ හැකි විශේෂඥ මතය කැඳවීමට සහ අභියාචකයාට හෝ වෙනත් පාර්ශවයකට වැඩිදුර තොරතුරු සහ විස්තර ලබා දෙන ලෙසට නියෝග කිරීමට,

අභියාචනා මණ්ඩලයට බලය තිබිය යුතු ය.

## XI වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

130. (1) සෑම තොගයක් ම, එනම් -

(අ) අමු කංසා හෝ අබිං;
(ආ) කංසා හෝ අබිං භාවිතයෙන් සාදන ලද ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක්, ඖෂධයක් හෝ ආයුර්වේද නිෂ්පාදනයක්;
(ඇ) නියාමන සභාව විසින් නිශ්චය කරනු ලබන ප්‍රකාශිත ඖෂධීය පැළෑටියක්;
(ඈ) ඛනිජ, සත්ත්වජ ද්‍රව්‍ය, භාණ්ඩ; හෝ
(ඉ) නියාමන සභාව විසින් තීරණය කරනු ලබන විෂ වර්ග හෝ ඕනෑම අන්තරායකර ඖෂධයක්,

ප්‍රවාහනය කිරීමේ දී, කොමසාරිස් ජනරාල්වරයාගෙන් තත් කාර්යය සඳහා ලබාගත් අවසර පත්‍රයක අධිකාරය යටතේ එය සිදු කළ යුතු ය.

(2) ඉහත (1) වන අනු නියෝගයෙහි සඳහන් කර ඇති තොගයක ප්‍රමාණය, නියාමන සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කළ යුතු ය.

(3) (අ) අමු කංසා හෝ අබිං;
(ආ) කංසා හෝ අබිං භාවිතයෙන් සාදන ලද ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක්, ඖෂධයක් හෝ ආයුර්වේද නිෂ්පාදනයක්;
(ඇ) නියාමන සභාව විසින් නිශ්චිත කරනු ලබන ප්‍රකාශිත ඖෂධීය පැළෑටියක්;
(ඈ) ඛනිජ, සත්ත්වජ ද්‍රව්‍ය, භාණ්ඩ; හෝ
(ඉ) නියාමන සභාව විසින් තීරණය කරනු ලබන විෂ වර්ග හෝ ඕනෑම අන්තරායකර ඖෂධයක්,

මිලදී ගැනීමේ දී, කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලබාගත් අවසර පත්‍රයක අධිකාරය යටතේ සිදු කළ යුතු ය.

(4) මේ සංග්‍රහය යටතේ වූ යම් -

(අ) ප්‍රකාශිත භාණ්ඩයක්, ද්‍රව්‍යයක්, ඖෂධයක් හෝ ආයුර්වේද නිෂ්පාදනයක්;
(ආ) ක්‍රියාකාරකමක්; හෝ
(ඇ) ව්‍යාපාරික ස්ථානයක්,

පිළිබඳ සමාජ මාධ්‍ය ඇතුළු යම් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයක් හරහා දැන්වීම් ප්‍රචාරණය, ප්‍රවර්ධනය හෝ ප්‍රචාරයක්, සෘජුව හෝ වක්‍රව කිරීම නියාමන සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශයන්ට අනුකූලව කොමසාරිස් ජනරාල්වරයාගේ අවසර පත්‍රයක අධිකාරය යටතේ සිදු කළ යුතු ය.

(5) (1), (3) සහ (4) වන අනු නියෝග යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් සඳහා ගාස්තු, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කළ යුතු ය.

131. රාජ්‍ය ආයතනයක් විසින් කරනු ලබන ලියාපදිංචි කිරීමක්, (4) වන අනු නියෝගයේ (අ) ඡේදයේ සඳහන් කරුණක් සම්බන්ධයෙන් -

(අ) යම් ආරක්ෂණ හිමිකමක් හෝ චිකිත්සීය හිමිකමක් සහිත;
(ආ) මිනිසුන් හෝ සතුන් ආදර්ශ ලෙස භාවිතා කර;
(ඇ) ශ්‍රී ලාංකීය සමාජය තුළ පවතින සදාචාරයේ හෝ විනීතභාවයේ ප්‍රමිතියට අහිතකර ඕනෑම රූපයක් සහිත;
(ඈ) වෘත්තීය හෝ විද්‍යාත්මක උපදෙස්, නිර්දේශ හෝ සහතික කිරීම් වැනි හැඟීමක් ලබා දෙන ඕනෑම ආයුර්වේද වෛද්‍යවරයකුගේ කිසියම් දෘශ්‍ය හෝ ශ්‍රව්‍ය ඉදිරිපත් කිරීමක්; හෝ
(ඉ) නියාමන සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් සහිත,

ඕනෑම දැන්වීමක්, ප්‍රවර්ධනයක් හෝ ප්‍රචාරණයක් නොකළ යුතු ය.

132. (1) මෙම නියෝග යටතේ නිශ්චිතව දක්වා ඇති -

(අ) ඔසුසල;
(ආ) නිෂ්පාදනාගාරය;
(ඇ) ගබඩාව;
(ඈ) විකුණුම් අලෙවිසැල;
(ඉ) බෙදාහැරීමේ යෙදී සිටින වාහනය; හෝ
(ඊ) ඖෂධීය පැළෑටි වගා ක්ෂේත්‍රය,

සඳහා අවම වශයෙන් තුන්වන පාර්ශවයක් ආවරණය කරනු ලබන සාමාන්‍ය රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු ය.

(2) මෙම නියෝග යටතේ නිශ්චිතව දක්වා ඇති සෑම කංසා ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ම නියාමන සභාව විසින් තීරණය කරනු ලබන විශේෂ රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු ය.

## XII වන කොටස

### අන්තර්කාලීන විධිවිධාන

133. (1) 1973 සැප්තැම්බර් මස 6 වැනි දින අංක 229/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද 1973 ආයුර්වේද නිෂ්පාදනාගාර නියෝග මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

(2) ඉහත නියෝග අවලංගු කළ ද, ඒ යටතේ කලින් කරන ලද සෑම ක්‍රියාවක් ම හෝ කටයුත්තක් ම වලංගු සහ බලාත්මක යැයි සලකනු ලැබිය යුතු ය.

(3) ඉහත නියෝග යටතේ ලියාපදිංචි වී ඇති සෑම ආයුර්වේද නිෂ්පාදනාගාරයක් ම, මෙම නියෝගවල විධිවිධාන යටතේ, නියමිත දින සිට මාස හය (6) ක කාලයක් ඇතුළත හෝ පෙර නිකුත් කරන ලද බලපත්‍රයේ කල් ඉකුත්වීමේ දිනය යන දෙකෙන්, පළමුව එළඹෙන දිනයට පෙර නැවත ලියාපදිංචි කිරීම කළ යුතුය.

134. (1) සැක දුරු කිරීමේ කාර්ය සඳහා, මෙම නියෝගවල විධිවිධාන මඟින්,-

(අ) පනත යටතේ කිසියම් ලියාපදිංචියක්, බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් ලබා ගැනීමේ කාර්යය සඳහා නියමිත දිනට පෙර ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීම කෙරෙහි බලපෑමක් සිදු නොවිය යුතු ය;

(ආ) නියමිත දිනට පෙර පනත යටතේ නිකුත් කරන ලද හෝ ලියාපදිංචි කරන ලද බලපත්‍රයක හෝ අවසරපත්‍රයක වලංගු භාවය කෙරෙහි බලපෑමක් සිදු නොවිය යුතු ය;

(ඇ) මේ නියෝග යටතේ සිදු කරනු ලබන යම් කාර්යයක් සම්බන්ධයෙන් නියමිත දිනට අයවිය යුතු කිසියම් ගාස්තුවක් හෝ වියදමක් කිරීමට, පැනවීමට හෝ අයකර ගැනීමට ආයුර්වේද දෙපාර්තමේන්තුව හෝ කොමසාරිස් ජනරාල්වරයා සතු බලතල උල්ලංඝනය වීමක් සිදු නොවිය යුතු ය; හෝ

(ඈ) අධිකරණයක් ඉදිරියේ විභාග වෙමින් පවතින කිසිදු ක්‍රියාවකට හෝ නඩුවකට හෝ පත්වීම් දිනට පෙර ලබා දුන් අධිකරණ තීන්දුවකට බලපෑමක් සිදු නොවිය යුතු ය.

(2) පනත යටතේ නියමිත දිනට පෙර නිකුත් කරන ලද සෑම ලියාපදිංචියක හෝ බලපත්‍රයක හෝ අවසරපත්‍රයක වලංගු කාලය අදාළ කාලසීමාව දක්වා වලංගුව පැවතිය යුතු ය.

135. මෙම නියෝගවල අරමුණු වෙනුවෙන්-

''පනත'' යනුවෙන් 1961 අංක 31 දරන ආයුර්වේද පනත අදහස් වේ;

"ආයුර්වේද" යන්නට, 1961 අංක 31 දරන අයුර්වේද පනතේ 89 වන වගන්තියෙන් එයට හිමි අර්ථයම තිබිය යුතු ය;

''ආයුර්වේද නිෂ්පාදනයක්'' යන්නට, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 89 වන වගන්තියෙන් එයට හිමි අර්ථයම තිබිය යුතු ය ;

"ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන්, මහජනතාවට ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණය සලසා දීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් පත් කරන ලද වෛද්‍යවරයකු අදහස් වේ;

"යටින් ඉරි අඳින ලද ඖෂධයක්" යන්නෙන්, ආදේශකයක් නිකුත් නොකළ යුතු ඖෂධයක් අදහස් වේ;

"කංසා" යන්නෙන්, *Cannabis Sativa L.* ඇතුළු සියලුම කංසා වර්ග අදහස් වේ;

''ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා'' යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව පත් කරන ලද ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"ආයුර්වේද දෙපාර්තමේන්තුව" යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 2 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද ආයුර්වේද දෙපාර්තමේන්තුව අදහස් වේ;

"දිස්ත්‍රික් ලේකම්" යන්නෙන්, 1992 අංක 58 දරන බලතල පැවරීමේ (දිස්ත්‍රික් ලේකම්වරු) පනත යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"පාරිසරික බලපෑම් තක්සේරුව" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ IVඇ කොටස යටතේ

සිදුකරනු ලබන පාරිසරික බලපෑම් තක්සේරුවක් අදහස් වේ;

"මූලික පාරිසරික පරීක්ෂණය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ IVඇ කොටස යටතේ සිදු කරනු ලබන මූලික පාරිසරික පරීක්ෂණයක් අදහස් වේ;

"පාරිසරික ආරක්ෂණ බලපත්‍රය" යන්නෙන්, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ IVඅ කොටස යටතේ ලබා ගනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් අදහස් වේ;

"ඖෂධීය සාර" යන්නෙන්, මෙම සංග්‍රහයේ කාර්යයන් සඳහා, ඖෂධීය වටිනාකමකින් භාවිත කරනු ලබන ස්වභාවිකව ව්‍යුත්පන්න වූ ශාකමය හෝ ඛනිජමය හෝ සත්ත්වජ ද්‍රව්‍යයක් හෝ එහි කොටසක් හෝ නිස්සාරණයක් අදහස් කෙරේ;

"පර්යේෂණය සහ ව්‍යාප්තිය සඳහා වූ ඔසු උයන් " යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 89 වන වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 89 වන වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ඖෂධ පැළෑටි" යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 89 වන වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"පළාත් ආයුර්වේද කොමසාරිස්" යන්නෙන්, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය යටතේ පත් කරන ලද අදාළ පළාත සඳහා වන පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා අදහස් වේ;

"රස ඖෂධ" යන්නෙන්, චිකිත්සක කාර්ය සඳහා ආයුර්වේද ඖෂධ සංග්‍රහයට අනුකූලව ඛණිජ යොදා නිෂ්පාදනය කරන යම් ඖෂධයක් අදහස් වේ;

"ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයා" යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතෙහි 89 වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ලියාපදිංචි ආයුර්වේද ඔසුසල" යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 89 වැනි වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ලියාපදිංචි ගබඩා" යන්නෙන්, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 89 වැනි වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"කංසාවල අවශේෂ" යන්නෙන්, යම් ආකාරයක සක්‍රීය අමුද්‍රව්‍ය හෝ සංයෝගවලින් තොර කංසා ශාකයේ යම් කොටසක් අදහස් වේ;

"රාජ්‍ය විශ්වවිද්‍යාල" යන්නට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ හෝ පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කළ විශ්වවිද්‍යාලයක් ද ඇතුළත් වේ.

## උපලේඛනය I

[රෙගු. 2]

### I කොටස

**ප්‍රකාශිත ඖෂධීය ශාක**

ආයුර්වේද, සිද්ධ, යුනානි, පාරම්පරික හෝ දේශීය චිකිත්සාවෙහි ඇතුලත් ඖෂධීය ශාක සහ වෙනත් රටවල භාවිතා කරන පහත සඳහන් ඖෂධීය ශාකවලට සමාන ඒවා විය යුතුය.

**ශාක ඖෂධ නාමලේඛනය / List of Herbal Medicines / மூலிகை மருந்துகளின் பட்டியல;**

| *අංක/ No/ இல* | *සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர்* | *දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர்* | *ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர்* | *විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர்* |
|---|---|---|---|---|
| 1 | අංකෙන්ද | விடுகனலை/முட்டநாரி | Claw Flowered Laurel | *Acronychia Pedunculata* |
| 2 | අක්කපාන | ருணக்கள்ளி/சொடக்கு | cathedral bells | *Kalanchoe pinnata* |
| 3 | අක්කරපට්ට | | | |
| 4 | අක්මැල්ල | | Toothache Plant | *Acmella oleracea* |
| 5 | අක්ෂොට | நாட்டு அகரெட்டு | Candle Nut Tree | *Aleurites moluccanus* |
| 6 | අගිල් | செம்புளிச்சான் | | *Erythroxylum indicum* |
| | | செம்மணத்தி | | *Erythroxylum sideroxyloides* |
| 7 | අට්ටික්කා | அத்தி | Cluster fig | *Ficus racemosa* |
| 8 | අඬනහිරිය | கிலுகிலுப்பை | Rattleweed | *Crotalaria atusia* |
| | | | | *Crotalaria cuneifolia* |
| 9 | අත්තන | கருஊமத்தை | Thorn Apple | *Datura metel* |
| | | | | *Brugmansia suaveolens* |
| | | வெள்ளை ஊமத்தை | | *Brugmansia chlorantha* |
| 10 | අතසි | ஆளிவிதை | Flaxseed. | *Linum usitatissimum* |
| 11 | අතිවිඩයම් | அதிவிடயம் | Aconites, | *Aconitum heterophyllum* |
| 12 | අන්දර | விடத்தலை | Sickle Bush | *Acacia cinerea* |
| | | | | *Acacia dalea* |
| 13 | අන්නාසි | அன்னாசி | pineapple | *Ananas comosus* |
| 14 | අනෝදා | வட்டத்துத்தி | country mallow | *Abutilon indicum* |
| 15 | අබ | கடுகு | black mustard | *Brassica nigra* |
| 16 | අබිං | அபின் | opium poppy | *Papaver somniferum* |
| 17 | අමු | வரகு | kodo millet | *Paspalum scrobiculatum* |
| 18 | අමුක්කරා | அமுக்கரா | Indian Winter Cherry | *Withania somnifera* |
| 19 | අයිසගුල් | | | |
| 20 | අරත්ත | பேரரத்தை | Lesser galangal Snap Ginger | *Alpinia calcarata* |
| 21 | අරලිය | அலரி | temple tree | *Plumeria apiculata* |
| | | | | *Plumeria bahamensis* |
| | | | | *Plumeria obtusa* |
| 22 | අරළු | கடுக்காய் | Chebulic Myrobalan | *Buceras chebula* |

| අංක/ **No/** இல | සිංහල නම/ **Sinhala name/** சிங்களப்பெயர் | දෙමළ නම/ **Tamil name** / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ **English name** / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ **Scientific name** /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Bucida comintana Blanco* |
| | | | | *Terminalia chebula* |
| 23 | අරළුප්පිටි | | | |
| 24 | අවරිය (නිල්) | அவுரி | Indigo Blue | *Anil tinctoria* |
| | | | | *Anil tinctoria* |
| | | | | *Indigofera tinctoria* |
| 25 | අශෝක | அசோகமரம் | Asoka Tree | *Jonesia asoca* |
| | | | | *Jonesia confusa* |
| | | | | *Saraca asoca* |
| 26 | අෂ්ටවර්ගය | | | |
| 27 | අස්වැන්න | பெரும்புலர்த்தி | Alyce Clover | *Alysicarpus cylindricus* |
| | | | | *Alysicarpus diversifolius* |
| | | | | *Alysicarpus vaginalis* |
| 28 | අසමෝදගම් | ஓமம் | | *Brachyapium involucratum* |
| | | | | *Stoibrax involucratum* |
| | | | | *Trachyspermum involucratum* |
| 29 | අහු | நுணா | Noni | *Morinda angustifolia* |
| | | | | *Morinda aspera* |
| | | | | *Morinda citrifolia* |
| 30 | ආඩතෝඩා | ஆடாதோடை | Malabar Nut | *Adeloda serrata* |
| | | | | *Adhatoda adhatoda* |
| | | | | *Justicia adhathoda* |
| 31 | ඇට්ටේරිය | வெங்காரை | orange Jasmine | *Chalcas cammuneng* |
| | | | | *Chalcas intermedia* |
| | | | | *Murraya paniculata* |
| 32 | ඇටඹ | மா | Sri Lankan mango | *Buchanania zeylanica Blume* |
| | | | | *Mangifera zeylanica* |
| 33 | ඇත්තෝර | வண்டுகொல்லி | Ringworm bush | *Cassia alataL* |
| | | | | *Cassia alata* |
| | | | | *Cassia alata* |
| 34 | ඇත්සොඩ | தேள்கொடுக்கு | Indian Heliotrope | *Eliopia riparia* |
| | | | | *Eliopia serrata* |
| | | | | *Heliotropium indicum* |
| 35 | ඇත්දෙමට | குமிழ் | Comb Tree | *Gmelina arborea* |
| | | | | *Gmelina arborea* |
| | | | | *Gmelina arborea* |
| 36 | ඇපල් | | | |
| 37 | ඇඹරැල්ලා | அம்பரல்லா | golden apple | *Chrysomelon pomiferum* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Cytheraea dulcis* |
| | | | | *Spondias dulcis* |
| 38 | ඇඹුල් ඇඹිලිය | பளியாரை | creeping woodsorrel. | *Acetosella corniculata* |
| | | | | *Acetosella corniculata* |
| | | | | *Oxalis corniculata* |
| 39 | ඇඹුල් දොඩම් | புளித்தோடை/நாரத்தை | sour orange | *Aurantium ×acre* |
| | | | | *Citrus aurantium* |
| 40 | ඇල් | ஆல் | | |
| 41 | ඇසතු | அரசு | Sacred Fig Tree | *Ficus religiosa* |
| 42 | ඇසළ (ඇහැළ) | | Golden Shower Tree | *Bactyrilobium fistula* |
| | | | | *Cassia bonplandiana* |
| | | சரக்கொன்றை | | *Cassia fistula* |
| 43 | ඉකිරි | ஆறுமுள்ளி | holly-leaved acanthus | *Acanthus doloarin* |
| | | | | *Acanthus ebracteatus* |
| | | | | *Acanthus ilicifolius* |
| 44 | ඉඟිනි ඇට | தேற்றா | Clearing Nut Tree | *Strychnos heterodoxa* |
| | | | | *Strychnos monosperma* |
| | | | | *Strychnos potatorum* |
| 45 | ඉඟුරු | இஞ்சி | Ginger | *Amomum angustifolium* |
| | | | | *Amomum zingiber* |
| | | | | *Zingiber officinale* |
| 46 | වල් ඉඟුරු | | Cylindric Ginger | *Zingiber cylindricum* |
| 47 | ඉංගුදි | நஞ்சுண்டான் | Desert date' | *Balanites aegyptiaca* |
| 48 | ඉද්ද | குடசப்பாலை | Artic Snow | *Echites antidysentericus* |
| | | | | *Nerium antidysentericum* |
| | | | | *Walidda antidysenterica* |
| 49 | ඉපිකාත් | | | |
| 50 | ඉඳි | ஈஞ்சு | Ceylon date palm | *Phoenix pusilla* |
| 51 | ඉඹුල් | மலை இலவம் | Silk Cotton Tree | *Bombacopsis quinata* |
| | | | | *Bombax aculeatum* |
| | | | | *Bombax ceiba* |
| 52 | ඉරමුසු | நன்னாரி | Indian sarsparilla | *Hemidesmus indicus* |
| | | | | *Hemidesmus pubescens* |
| | | | | *Hemidesmus indicus* |
| 53 | කළු ඉරමුසු | | | |
| 54 | ඉරිමේදා | வேல் | sweet acacia | *Acacia farnesiana* |
| 55 | ඉරිවේරිය | இருவேலி | | *Coleus forskalae* |
| | | | | *Coleus personatus* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Plectranthus zatarhendi* |
| 56 | ඉලුක් | நாணல் | Spear Grass | *Arundo epigeios* |
| | | | Cogon Grass | *Calamagrostis lagurus* |
| | | | | *Imperata cylindrica* |
| 57 | ඊතණ | | Spear grass | *Andropogon allionii* |
| | | | | *Andropogon austrocaledonicus* |
| | | | | *Heteropogon contortus* |
| 58 | ඊල්ල | பத்தடி | African Tulip Tree, | *Bignonia tulipifera* |
| | | | | *Spathodea danckelmaniana* |
| | | | | *Spathodea campanulata* |
| 59 | උක් | கரும்பு | Sugarcane | *Saccharum officinarum* |
| 60 | උගුරැස්ස | | governor's plum | *Flacourtia afra* |
| | | | | *Flacourtia balansae* |
| | | கருமுறுக்கி | | *Flacourtia indica* |
| 61 | උඩංගන බීජ (සාමදාන) | நேத்திர புண்டு | Narrow-Leaf Blepharis | *Acanthus integrifolius* |
| | | | | *Acanthus repens* |
| | | | | *Blepharis integrifolia* |
| 62 | උඩක්තා/උදක්තා | | | |
| 63 | උඳු | | black gram | *Azukia muogo* |
| | | | | *Phaseolus aureus* |
| | | உளுந்து | | *Vigna mungo* |
| 64 | උඳුපියලි | | Three flower beggarweed | *Aeschynomene triflora* |
| | | | | *Desmodium bullamense* |
| | | சிறுபுள்ளடி | | *Desmodium triflorum* |
| 65 | උදුම්බර | | cluster fig | *Ficus racemosa* |
| 66 | උණ | மூங்கில் | bamboo | *Bambusa vulgaris* |
| 67 | උණකපුරු | இலவங்கம் | Camphor Cinnamon | *Cinnamomum capparu* |
| 68 | උණගොබ | மூங்கில் | bamboo | *Bambusa vulgaris* |
| 69 | උලාඅරිසි/උළුහාල් | வெந்தயம் | Fenugreek | *Trigonella foenum* |
| 70 | එඬරු/එරඬු | | Castor bean | *Cataputia major* |
| | | | | *Cataputia minor* |
| | | ஆமணக்கு | | *Ricinus communis* |
| 71 | එනසාල් | ஏலம் | cardamom | *Elettaria cardemomum* |
| 72 | එල්වළු | | Sour cherry | *Prunus cerasus* |
| 73 | එලඉඹුල් | | red silk-cotton tree | *Bombacopsis quinata* |
| | | | | *Bombax aculeatum* |
| | | இலவ மரம் | | *Bombax ceiba* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 74 | එලපිටවක්කා | கீழ்காய் நெல்லி | Stone Breaker | *Diasperus debilis* |
| | | | | *Phyllanthus boninsimae* |
| | | | | *Phyllanthus debilis* |
| 75 | එරබදු | முள்முருக்கு | Variegated Coral Tree | *Chirocalyx candolleanus* |
| | | | | *Chirocalyx divaricatus* |
| | | | | *Erythrina variegata* |
| 76 | එලබටු | | Eggplant | *Melongena esculenta* |
| | | | | *Melongena incurva* |
| | | கத்தரி | | *Solanum melongena* |
| 77 | එලබින්තඹුරු | அடப்பங்கொடி | Beach Morning Glory, | *Ipomoea pes-caprae* |
| 78 | ඒකාවේරිය | பாம்புக்களா | Indian Snakeroot | *Ophioxylon album* |
| | | | | *Ophioxylon obversum* |
| | | | | *Rauvolfia serpentina* |
| 79 | ඔලිඳ | குன்றிமணி | rosary pea | *Abrus precatorius* |
| 80 | ඔලිව් | | olive tree | *Olea europaea* |
| 81 | ඕල්ලු/ඕලු | அல்லி/வெள்ளாம்பல் | pink water-lily | *Castalia pubescens* |
| | | | | *Nymphaea devoniensis* |
| | | | | *Nymphaea pubescens* |
| 82 | කසද්වට | | | |
| 83 | කංසා | கஞ்சா | Hemp Marihuana Marijuana Soft hemp True hemp | *Cannabis sativa* |
| | | | | *Cannabis indica* |
| | | | | *Cannabis ruderalis* |
| | | | | *Cannabis hybrids* |
| 84 | කන්කෝල | வால்மிளகு | Java pepper | *Piper cubeba* |
| 85 | කකුළුසුඟු | கர்கடகசிஞ்கி | zebrawood | *Pistacia integerrima* |
| 86 | කට්ඵල | | bayberry | *Myrica nagi* |
| 87 | කටරොඩු/කටරොදු | | blue pea | *Clitoria albiflora* |
| | | | | *Clitoria bracteata* |
| | | கன்னிக்கொடி | | *Clitoria ternatea* |
| 88 | කටුකරඬු | செம்முள்ளி | hophead Philippine violet | *Barleria macrostachya* |
| | | | | *Barleria monostachya* |
| | | | | *Barleria lupulina* |
| 89 | කටුකරෝසන | கடுகுரோகினி | Picrorhiza | *Picrorhiza scrophulariiflora* |
| 90 | කටුපෙඳ | | Spiny Naiad. | *Najas marina* |
| 91 | කටුවැල්බටු | கண்டங்கத்தி | Thorny night shade, | *Solanum arabicum* |
| | | | | *Solanum armatum* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Solanum virginianum* |
| 92 | කතුරුමුරුංගා | அகத்தி | Scarlet Wistaria Tree | *Aeschynomene grandiflora* |
| | | | | *Agati grandiflora* |
| | | | | *Sesbania grandiflora* |
| 93 | කනේරු | அரளி | Oleander | *Nerion oleandrum* |
| | | | | *Nerium carneum* |
| | | | | *Nerium oleander* |
| 94 | කප්පරවල්ලිය | கற்பூரவல்லி | Indian borage | *Coleus amboinicus* |
| | | | | *Coleus aromaticus* |
| | | | | *Plectranthus amboinicus* |
| 95 | කපු | கற்புரம் | tree cotton | *Camphor Cinnamon* |
| | | | | *Gossypium anomalum* |
| | | | | *Gossypium arboreum* |
| 96 | කපුකිනිස්ස | | musk mallow | *Abelmoschus abelmoschus* |
| | | வெண்டி | | *Abelmoschus betulifolia* |
| | | | | *Abelmoschus moschatus* |
| 97 | කපුරු | | camphor | *Camphor Cinnamon* |
| 98 | කබරස | மலைத்தாமரை | | *Smilax ceylanica Oken* |
| | | | | *Smilax collina Kunth* |
| 99 | කම්පිල්ල | கபில | kumkum tree | *Mallotus philippensis* |
| 100 | කරඳ | | Indian beech | *Cajum pinnatum* |
| | | | | *Cytisus pinnatus* |
| | | புங்கு | | *Pongamia pinnata* |
| 101 | කරපිංච | கறிவேப்பிலை | curry leaf | *Bergera koenigii* |
| | | | | *Camunium koenigii* |
| | | | | *Murraya koenigii* |
| 102 | කරඹ | சிறுகிளாய் | Conkerberry | *Antura edulis* |
| | | | | *Antura hadiensis* |
| | | | | *Carissa spinarum* |
| 103 | කරල්සැබෝ | நாயுருவி | Devil's horsewhip | *Achyranthes acuminata* |
| | | | | *Achyranthes aspera* |
| | | | | *Achyranthes aspera* |
| 104 | කරවිල | பாகல் | Bitter gourd, | *Cucumis argyi* |
| | | | | *Cucumis intermedius* |
| | | | | *Momordica charantia* |
| 105 | කරාබු | கராம்பு | Clove | *Caryophyllus aromaticus* |
| | | | | *Caryophyllus hortensis* |
| | | | | *Syzygium aromaticum* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 106 | කලාඳුරු | கோரை | Coco Grass | *Chlorocyperus rotundus* |
| | | | | *Chlorocyperus salaamensis* |
| | | | | *Cyperus rotundus* |
| 107 | කළුකැම්මේරිය | மணல் தக்காளி | American Black Nightshade | *Solanum amarantoides* |
| | | | | *Solanum americanum* |
| | | | | *Solanum americanum* |
| 108 | කලුදුරු | கருஞ்சீரகம் | Black cumin | *Nigella sativa* |
| 109 | කලුවා | | | |
| 110 | කසඹිලියා | பெரும் காஞ்சொரி | Hawaii Woodnettle | *Boehmeria interrupta* |
| | | | | *Boehmeria javanica* |
| | | | | *Laportea interrupta* |
| 111 | කසේරුක/කසේරු | | greater club rush | *Scirpus grossus* |
| 112 | කහ/අත්කහ | | turmeric | *Amomum curcuma* |
| | | | | *Curcuma brog* |
| | | மஞ்சள் | | *Curcuma longa* |
| 113 | කහට/වගපුල් | | wild guava | *Barringtonia arborea* |
| | | | | *Careya orbiculata* |
| | | | | *Careya arborea* |
| 114 | කාකෝලි | | Hardy Ginger | *Roscoea purpurea* |
| 115 | කාමරංගා | | star fruit | *Averrhoa acutangula* |
| | | தாமரத்தை | | *Averrhoa pentandra* |
| | | | | *Averrhoa carambola* |
| 116 | කාලමේස | சிறியாள்நஞ்கை | green chiretta | *Andrographis paniculata* |
| 117 | කාලදාතා | | | |
| 118 | කැකිරි | தும்மட்டி | Muskmelon | *Bryonia collosa* |
| | | | | *Bryonia collosa* |
| | | | | *Cucumis melo* |
| 119 | කැකුණ | நாட்டு அகரோட்டு | the candlenut | *Aleurites ambinux* |
| | | | | *Aleurites angustifolius* |
| | | | | *Aleurites moluccana* |
| 120 | කැහිපිත්තන් | பொன் முசும்டை | Indian moon-seed | *Clypea burmanni* |
| | | | | *Cocculus burmanni .* |
| | | | | *Cyclea peltata* |
| 121 | කැල | பலாசு | flame-of-the-forest | *Butea monosperma* |
| 122 | කිඩාරං | கருணைக்கிழங்கு | Elephant Foot Yam | *Amorphophallus campanulatus* |
| | | | | *Amorphophallus campanulatus* |
| | | | | *Amorphophallus paeoniifolius* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 123 | කිතුල් | கித்துள் | jaggery palm | *Caryota urens* |
| 124 | කිණිහිරි | காட்டு பருத்தி | Buttercup Tree, | *Bombax gossypium* |
| | | | | *Bombax religiosum* |
| | | | | *Cochlospermum religiosum* |
| 125 | කිරිඅගුණ | குறிஞ்சா | Green Milkweed Climber | *Apocynum tiliifolium* |
| | | | | *Asclepias viridiflora* |
| | | | | *Wattakaka volubilis* |
| 126 | කිරිබදු | நிலப்பூசணி | Railway Creeper | *Apopleumon bignonioides* |
| | | | | *Batatas bignonioides* |
| | | | | *Ipomoea mauritiana* |
| 127 | කීකිරිඳිය | | False daisy | *Abasoloa taboada* |
| | | | | *Acmella lanceolata* |
| | | கரிசிலாங்கண்ணி | | *Eclipta prostrata* |
| 128 | කුංකුමප්පු | | | |
| 129 | කුකුරුමාන් | மதுக்காரை | Emetic nut | *Randia dumetorum* |
| 130 | කුඩුමිරිස | | orange climber. | *Cranzia aculeata* |
| | | | | *Cranzia asiatica* |
| | | | | *Toddalia asiatica* |
| 131 | කුන්දුරුක්කන් | | 'Indian frankincense | *Boswellia serrata* |
| 132 | කුප්පමේනිය | குப்பைமேனி | Indian mercury | *Acalypha canescens* |
| | | | | *Acalypha caroliniana* |
| | | | | *Acalypha indica* |
| 133 | කුඹුක් | | Arjun tree | *Myrobalanus cuneata* |
| | | | | *Pentaptera angustifolia* |
| | | மருது | | *Terminalia arjuna* |
| 134 | කුඹුරු | கழற்சி | Grey Nicker | *Bonduc canadense* |
| | | | | *Bonduc minus* |
| | | | | *Caesalpinia bonduc* |
| 135 | කුරුඳු | | Ceylon cinnamon | *Camphora mauritiana* |
| | | | | *Camphorina cinnamomum* |
| | | கறுவா | | *Cinnamomum verum* |
| 136 | කුශතණ | தர்ப்பை | Halfa grass | *Desmostachya Bipinnata* |
| 137 | කුර | அறக்கீரை | Slender amaranth | *Albersia caudata* |
| | | | | *Albersia gracilis* |
| | | | | *Amaranthus viridis* |
| 138 | කෙකටිය | | Wavy-edged Aponogeton | *Aponogeton echinatus* |
| | | | | *Spathium crispum* |
| | | | | *Aponogeton crispus* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 139 | කෘමිශස්තෘ | | | |
| 140 | කෙළිඳ | குடசப்பாலை | Tellicherry bark | *Holarrhena antidysenterica* |
| 141 | කෙළිඳහාල් | | Tellicherry bark | *Holarrhena antidysenterica* |
| 142 | කෙසෙල් | வாழை | Bananas | *Musa paradisiaca* |
| 143 | කොකුම්පොතු | | Red mango | *Trigonocarpus littoralis* |
| | | | | *Kokoona zeylanica* |
| 144 | කොට්ටම් | கோஸ்டம் | Costus root. It | *Saussurea lappa* |
| 145 | කොට්ටම්බා | | Sea Almond | *Badamia commersonii* |
| | | | | *Buceras catappa* |
| | | | | *Terminalia catappa* |
| 146 | කොටදිඹුලා | | Hairy Fig | *Covellia assamica* |
| | | | | *Covellia courtallensis* |
| | | பேயத்தி | | *Ficus hispida* |
| 147 | කොත්තමල්ලි | கொத்தமல்லி | coriander | *Coriandrum sativum* |
| 148 | කොතලහිඹුටු | | Salacia | *Salacia reticulata* |
| 149 | කෝවක්කා | கொவ்வை | Ivy Gourd | *Bryonia acerifolia* |
| | | | | *Bryonia alceifolia* |
| | | | | *Coccinia grandis* |
| 150 | කොහිල | | Spiny Lasia | *Dracontium spinosum* |
| | | | | *Lasia aculeata* |
| | | கொகில | | *Lasia spinosa* |
| 151 | කොහොඹ | வேம்பு | Neem | *Antelaea azadirachta* |
| | | | | *Antelaea canescens* |
| | | | | *Azadirachta indica* |
| 152 | කොබෝලීල | வெள்ளை மந்தாரை | White orchid-tree | *Bauhinia linnaei* |
| | | | | *Casparia acuminata* |
| | | | | *Bauhinia acuminata* |
| 153 | කොරාසානි | | | |
| 154 | කොල්ලම් | கதிர்பச்சை | Indian patchouli | *Pogostemon heyneanus* |
| 155 | කොල්லු | கொள்ளு | Horse gram | *Dolichos uniflorus* |
| | | | | *Glycine uniflora* |
| | | | | *Macrotyloma uniflorum* |
| 156 | කොළොම් | மஞ்சக் கடம்பு | Yellow teak | *Haldina cordifolia* |
| | | | | *Nauclea cordifolia* |
| | | | | *Haldina cordifolia* |
| 157 | කෝන්තාලම් | கடம்பம் | Common Putat | *Barringtonia racemosa* |
| 158 | කෝමාරිකා | கற்றாளை | Medicinal Aloe | *Aloe barbadensis* |
| | | | | *Aloe barbadensis* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Aloe vera* |
| 159 | ක්ෂවක/විෂ්ඩූලි | | Spreading Sneeze Weed | *Artemisia minima* |
| | | | | *Artemisia orbicularis* |
| | | மரிக்கொழுந்து | | *Centipeda minima* |
| 160 | ක්ෂීර කාකෝලි | | white Himalayan lily | *Lilium polyphyllum* |
| 161 | ගංසූරිය | | portia tree | *Bupariti altissima* |
| | | | | *Bupariti populnea* |
| | | புவரசு | | *Thespesia populnea* |
| 162 | ගජතිප්පිලි | ஆனைத்திப்பலி | | *Scindapsus officinalis* |
| 163 | ගම්මාලු/අසන | வேங்கை | Malabar kino | *Lingoum marsupium* |
| | | | | *Pterocarpos marsupius* |
| | | | | *Pterocarpus marsupium* |
| 164 | ගම්මිරිස් | மிளகு | black pepper, | *Muldera multinervis* |
| | | | | *Piper aromaticum* |
| | | | | *Piper nigrum* |
| 165 | ගල්කුර | பிண்ணாக்கக் கீரை | the chocolateweed | *Geruma subtriloba* |
| | | | | *Hibiscus donii* |
| | | | | *Melochia corchorifolia* |
| 166 | ගලිස් | | | *Gardenia crameri* |
| 167 | ගස්කැප්පෙට්ටිය | தெப்படி | | *Croton laccifer* |
| 168 | ගස්පෙනෙල | பணலை | three-leaf soapberry, | *Sapindus abstergens* |
| | | | | *Sapindus acutus* |
| | | | | *Sapindus trifoliata* |
| 169 | ගැටනෙටුල් | பிராய் | Siamese rough bush | *Achymus pallens* |
| | | | | *Achymus patens* |
| | | | | *Streblus asper* |
| 170 | ගිරිතිල්ල | சமுத்திரப்பாலை | Elephant creeper | *Argyreia populifolia* |
| | | | | *Argyreia populifolia* |
| | | | | *Argyreia populiolia* |
| 171 | ගුගුල් | குக்குலு | Indian bdellium-tree | *Commiphora wightii* |
| 172 | ගුරුන්ද | | stinkwood | *Celtis cinnamomea* |
| | | | | *Celtis crenatoserrata* |
| | | | | *Celtis timorensis* |
| 173 | ගොංකැකිරි | மொசுமொசுக்கை | Madras pea pumpkin | *Bryonia cordifolia* |
| | | | | *Bryonia gracilis* |
| | | | | *Mukia maderaspatana* |
| 174 | ගොටුකොළ | வல்லாரை | Asiatic pennywort | *Centella asiatica* |
| | | | | *Centella boninensis* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Centella asiatica* |
| 175 | ගොඩකදුරු | எட்டி | poison nut, | *Strychnos nux-vomica* |
| | | | | *Strychnos ovalifolia Stokes* |
| | | | | *Strychnos nux-vomica* |
| 176 | ගොඩමානෙල් | விசமூங்கில் | Wild Onion Milk and Wine Lily | *Amaryllis insignis* |
| | | | | *Amaryllis littoralis* |
| | | | | *Crinum latifolium* |
| 177 | චාඋල්මුග්‍රා | | Janli Almond | *Hydnocarpus wightianus* |
| 178 | චීන අල | | China Root | *Cacalia bulbosa* |
| | | | | *Cacalia maculata* |
| | | | | *Gynura pseudo-china* |
| 179 | ජටාමාංස | ஜடாமாஞ்சில் | spikenard | *Nardostachys jatamansi* |
| 180 | ජයපාල | | purging croton | *Alchornea vaniotii* |
| | | | | *Alchornea vaniotii* |
| | | நேர்வாளம் | | *Croton tiglium* |
| 181 | ජලවේතස | | | |
| 182 | ජීවක | ஜீவகம் | Jeevak | *Microstylis wallichii* |
| | | | | *Malaxis acuminata* |
| 183 | ජීවන්ති | பாலைக்கொடி | Cork Swallow-Wort | *Leptadenia reticulata* |
| 184 | තණහාල් | தினை | Foxtail millet | *Alopecurus caudatus* |
| | | | | *Chaetochloa germanica* |
| | | | | *Setaria italica* |
| 185 | තඹල | | Fukien tea tree | *Carmona heterophylla* |
| | | குரங்கு வெற்றிலை | | *Carmona microphylla* |
| | | | | *Carmona retusa* |
| 186 | තල් | பனை | Palmyra Palm | *Borassus flabelliformis* |
| | | | | *Borassus sundaicus* |
| | | | | *Borassus flabellifer* |
| 187 | තල | | Sesame | *Anthadenia sesamoides* |
| | | | | *Sesamum africanum* |
| | | எள் | | *Sesamum indicum* |
| 188 | තලිස් | | Himalayan silver fir | *Abies webbiana* |
| 189 | තැල් | | Wild petunia | *Convolvulus obscurus* |
| | | சிறுதாளி | | *Ipomoea obscura* |
| 190 | තිත්තලබු | | bottle gourd | *Lagenaria siceraria* |
| 191 | තිත්ත වැටකොළු | பேய்பீர்க்கு | Bitter Sponge Gourd | *Luffa echinata* |
| 192 | තිත්තවැල් | | | |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 193 | තිප්පිලි | திப்பலி | Long pepper | *Chavica longa* |
| | | | | *Chavica roxburghii* |
| | | | | *Piper longum* |
| 194 | තිප්පිලි මුල් | திப்பலி வேர் | Long pepper | *Chavica longa* |
| | | | | *Chavica roxburghii* |
| | | | | *Piper longum* |
| 195 | තිබ්බටු | | turkey berry, | *Solanum acanthifolium* |
| | | | | *Solanum amoenum* |
| | | சுண்டை | | *Solanum torvum* |
| 196 | තිඹිරි | | Malabar Ebony, | *Diospyros biflora* |
| | | | | *Diospyros citrifolia* |
| | | | | *Diospyros malabarica* |
| 197 | තිරැස්ත්වාලු | சிவதை | turpeth | *Operculina turpethum* |
| 198 | තිරිඟු | கோதுமை | Common wheat | *Triticum aestivum* |
| 199 | තිලපුෂ්පී/ඩිජිටාලිස් | நரிப்புகையிலை | purple foxglove | *Digitalis purpurea* |
| 200 | තුන්පත් කුරුඳු | | Winged Naringi. | *Anisifolium alatum* |
| | | குருந்து | | *Hesperethusa alata* |
| | | | | *Pleiospermium alatum* |
| 201 | තුඹ | | Ceylon slitwort | *Leucasia zeylanica* |
| | | | | *Phlomis gracilis* |
| | | முடிதும்பை | | *Leucas zeylanica* |
| 202 | තුඹ කරවිල | மெழுகுப்பாகல் | spiny gourd | *Momordica dioeca* |
| | | | | *Momordica hamiltoniana* |
| | | | | *Momordica dioica* |
| 203 | තුවරලා | | Indian Valerian | *Valeriana harmsii* |
| | | | | *Valeriana hygrobia* |
| | | | | *Valleriana jatamansi* |
| 204 | තෙබු | கோட்டம் | Crepe Ginger | *Amomum arboreum* |
| | | | | *Amomum hirsutum* |
| | | | | *Costus speciosus* |
| 205 | තෙලකීරිය | | Milky Mangrove | *Commia cochinchinensis* |
| | | அகதி | | *Excoecaria affinis* |
| | | | | *Excoecaria agallocha* |
| 206 | තේක්ක | தேக்கு | teak | *Tectona grandis* |
| 207 | තේජපත්‍ර | தாளிசபத்திரி | Indian bay leaf | *Cinnamomum tamala* |
| 208 | තොට්ල | பாலையுடைச்சி | Midnight Horror | *Arthrophyllum ceylanicum* |
| | | | | *Arthrophyllum reticulatum* |
| | | | | *Oroxylum indicum* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 209 | ත්‍රායමාණා | கம்பந்திரை | Indian Gentian | *Gentian kurroa* |
| 210 | දදකිරිය | அம்மான்பச்சரிசி | Hairy Spurge | *Euphorbia Hirta* |
| 211 | දළුක් | சதுரக்கள்ளி | antique spurge | *Euphorbia antiquorum* |
| | | | | *Euphorbia arborescens* |
| | | | | *Euphorbia antiquorum* |
| 212 | දාරුහරිද්‍රා | | Indian barberry | *Berberis aristata* |
| 213 | වෙනිවැල් | மரமஞ்சள் | False Calumba | *Coscinium maingayi* |
| | | | | *Coscinium miosepalum* |
| | | | | *Coscinium fenestratum* |
| 214 | දැත්ත | பொடுதலை | Turkey Tangle Fogfruit | *Phyla nodiflora* |
| 215 | දැව | | | |
| 216 | දියපරඬැල් | | | |
| 217 | දැසමන් | சாதிமல்லிகை | Spanish Jasmine | *Jasminum grandiflorum* |
| 218 | දියමිත්ත | வட்டத்திருப்பி | Velvet Leaf | *Cissampelos acuminata* |
| | | | | *Cissampelos argentea* |
| | | | | *Cissampelos pareira* |
| 219 | දියමිදෙල්ල | | powder-puff tree | *Barringtonia apiculata* |
| | | | | *Barringtonia caffra* |
| | | கடம்பம் | | *Barringtonia racemosa* |
| 220 | දියලබු | சுரக்காய் | Bottle Gourd | *Adenopus abyssinicus* |
| | | | | *Cucumis bicirrha* |
| | | | | *Lagenaria siceraria* |
| 221 | දියහබරල | | hastate-leaved pondweed | *Calcarunia hastata* |
| | | | | *Carigola hastata* |
| | | கருங்குவளை | | *Monochoria hastata* |
| 222 | දුම්මැල්ල | புடோல் | Snake Gourd | *Trichosanthes cucumerina* |
| 223 | දිවුල් | விளா | wood-apple | *Anisifolium curvispina* |
| | | | | *Anisifolium limonia* |
| | | | | *Limonia acidissima* |
| 224 | දුහුඳු | | black oil plant | *Alsodeia glabra* |
| | | வாளுலுவை | | *Catha paniculata* |
| | | | | *Celastrus paniculatus* |
| 225 | දෙමට | | Asian Bushbeech | *Bignonia discolor* |
| | | குமிழ் | | *Bignonia moluccana* |
| | | | | *Gmelina asiatica* |
| 226 | දෙළුම් | | pomegranate | *Granatum punicum* |
| | | மாதுளை | | *Punica florida* |
| | | | | *Punica granatum* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 227 | දෙහි | எலுமிச்சை | West Indian lime, | *Citrus × acida* |
| | | | | *Citrus × aurantiifolia* |
| | | | | *Citrus aurantifolia* |
| 228 | දේවදාර | தேவதாறு | deodar cedar | *Cedrus Deodara* |
| 229 | දෙව්දුරු | | | |
| 230 | දොඹ | புன்னை | Alexandrian laurel balltree | *Balsamaria inophyllum* |
| | | | | *Calophyllum apetalum* |
| | | | | *Calophyllum inophyllum* |
| 231 | දේව්දාලි | பேய்ப்பீர்க்க | Bristly Luffa | *Luffa echinata* |
| 232 | ධන්වයාස | | | *Fagonia cretica* |
| 233 | නවහන්දි | கொம்புக்கள்ளி | Indian tree spurge | *Euphorbia tirucalli* |
| 234 | නස්නාරං | | Panama Orange | *Citrofortunella madurensis* |
| | | | | *Atalantia hindsii* |
| | | | | *Citrus madurensis* |
| 235 | නා | நாகமரம் | Ceylon Ironwood | *Calophyllum nagassarium* |
| | | | | *Mesua ferrea* |
| | | | | *Mesua ferrea* |
| 224 | නාපිරිත්තා | | Wild Hibiscus | *Furcaria furcellata* |
| | | | | *Furcaria roxburghii* |
| | | | | *Hibiscus furcatus* |
| 237 | නාරං | | Loose -skinned orange. | *Citrus crenatifolia* |
| 238 | නික | நொச்சி | Five-leaved Chaste Tree | *Agnus-castus negundo* |
| | | | | *Vitex agnus-castus* |
| | | | | *Vitex negundo* |
| 239 | නිදිකුම්බ | தொட்டால்சுரங்கி | sensitive plant | *Eburnax pudica* |
| | | | | *Mimosa pudica* |
| 240 | නුග | ஆல் | the banyan | *Ficus banyana* |
| | | | | *Ficus chauvieri* |
| | | | | *Ficus benghalensis* |
| 241 | නෙරිවිෂ | | | |
| 242 | නෙරෙංචි | சிறுநெருஞ்சில் | puncture vine | *Hedysarum uniflorum* |
| | | | | *Tribulus acanthococcus* |
| | | | | *Tribulus terrestris* |
| 243 | නෙල්ලි | நெல்லி | Indian gooseberry | *Cicca emblica* |
| | | | | *Cicca macrocarpa* |
| | | | | *Phyllanthus emblica* |
| 244 | නෙළුම් | செந்தாமரை | Indian lotus | *Nelumbium album* |
| | | | | *Nelumbium asiaticum* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Nelumbo nucifera* |
| 245 | ප්ත්පාඩගම් | பற்பாடகம் | Two-flowered Oldenlandia | *Gerontogea corymbosa* |
| | | | | *Hedyotis biflora* |
| | | | | *Oldenlandia corymbosa* |
| 246 | පතඟි | | sappanwood | *Caesalpinia angustifolia* |
| | | | | *Caesalpinia sapang* |
| | | பதம்கம் | | *Caesalpinia sappan* |
| 247 | පඹුරු | | Wild Manarine | *Atalantia missionis* |
| | | | | *Chilocalyx elliptica* |
| | | | | *Pamburus missionis* |
| 248 | පරිප්පු | துவரை | Pigeon pea, | *Cajanum thora* |
| | | | | *Cajanus bicolor* |
| | | | | *Cajanus cajan* |
| 249 | පරූෂක | | phalsa | *Grewia asiatica* |
| 250 | පලොල් | பாதிரி | Messenger of Spring | *Bignonia chelonoides* |
| | | | | *Bignonia gratis* |
| | | | | *Stereospermum suaveolens* |
| 251 | පැඟිරිමාන් | சித்திரனெல்லா | Citronella Grass | *Andropogon citrosus* |
| | | | | *Andropogon confertiflorus* |
| | | | | *Cymbopogon nardus* |
| 252 | පිල | அவுரி | Purple Tephrosia | *Cracca purpurea* |
| | | | | *Galega purpurea* |
| | | | | *Tephrosia purpurea* |
| 253 | පීතකරෝසන | | | |
| 254 | පුපුල | குப்பிளாய் | | *Cacalia zeylanica* |
| | | | | *Eupatorium zeylanicum* |
| | | | | *Vernonia zeylanica* |
| 255 | පුලිල | | South Indian Fig | *Ficus caulobotrya* |
| | | | | *Ficus infectoria* |
| | | கல்ஆல் | | *Ficus tsjahela* |
| 256 | පුවක් | கமுகு | Areca-nut | *Areca catechu* |
| | | | | *Areca catechu* |
| | | | | *Areca catechu* |
| 257 | පුස්වැල් | யானைக்கொழிஞ்சி | Sea-bean | *Adenanthera gogo Blanco* |
| | | | | *Entada cirrhosa* |
| | | | | *Entada pusaetha* |
| 258 | පුහුල් | நீற்றுப்பூசனி | ash-pumpkin | *Benincasa cerifera* |
| | | | | *Benincasa cylindrica* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| | | | | *Benincasa hispida* |
| 259 | පෙනෙල | | Balloon Vine | *Cardiospermum acuminatum* |
| | | முடக்கத்தான் | | *Cardiospermum corycodes* |
| | | | | *Cardiospermum halicacabum* |
| 260 | පෙරුම්කායම් | பெருங்காயம் | assa-foetida | *Ferula assa-foetida* |
| 261 | පේර | கொய்யா | Guava | *Guajava pumila* |
| 262 | පොල් | தேங்காய் | coconut | *Cocos nucifera* |
| 263 | පොල්පලා | தேங்காய்பூகீரை | mountain knotgrass | *Achyranthes lanata* |
| | | | | *Achyranthes lanata* |
| | | | | *Aerva lanata* |
| 264 | ප්‍රසාරණී | முதியார் கூந்தல் | skunkvine | *Apocynum foetidum* |
| | | | | *Gentiana scandens* |
| | | | | *Paederia foetida* |
| 265 | ප්‍රියංගු | காட்டுக்குமிழ் | Beauty berry | *Callicarpa macrophylla* |
| 266 | බබ්බුල | கருவேல் | Egyptian Thorn Babul tree | *Acacia arabica* |
| | | | | *Acacia nilotica* |
| | | | | *Acacia nilotica* |
| 267 | බ්‍රාහ්මී | பிரமி | water hyssop | *Bacopa monnieri* |
| 268 | බට | | Reed bamboo | *Bambusa stridula Moon* |
| | | இருள் | | *Beesha stridula Munro* |
| | | | | *Ochlandra stridula* |
| 269 | බාකුචි | கார்போக அரிசி | Purple Fleabane | *Psoralea corylifolia* |
| 270 | බදාම් | வாதுமை | The almond | *Prunus amygdalus Baill* |
| 271 | බැවිල | பழம்பாசி | common wireweed | *Sida resamosa* |
| | | | | *Sida arrudiana* |
| | | | | *Sida acuta* |
| 272 | බිංඋරු | | | |
| 273 | බිංකොහොඹ | நிலவேம்பு | Ground bitter | *Ebermaiera pulchella* |
| | | | | *Melia pumila Moon* |
| | | | | *Munronia pinnata* |
| 274 | බිංතල් | நிலப்பனை | golden eye-grass | *Curculigo brevifolia* |
| | | | | *Curculigo densa* |
| | | | | *Curculigo orchioides* |
| 275 | බිංනුග | நஞ்சறுப்பான் | Indian-Ipecacuanha | *Tylophora indica* |
| 276 | බුරුල්ල | | Bandicoot Berry Common Tree-Vine | *Aquilicia ottilis* |
| | | | | *Aquilicia sambucina* |
| | | | | *Leea indica* |

| අංක/ No/ இல | සිංහල නම/ Sinhala name/ சிங்களப்பெயர் | දෙමළ නම/ Tamil name / தமிழ்ப்பெயர் | ඉංග්‍රීසි නම/ English name / ஆங்கிலப்பெயர் | විද්‍යාත්මක නාමය/ Scientific name /அறிவியற்பெயர் |
|---|---|---|---|---|
| 277 | බුලත් | வெற்றிலை | Betel | *Piper betle* |
| 278 | බුළු | தான்றி | Bedda nut tree | *Buceras bellirica* |
| | | | | *Myrobalanus bellirica* |
| | | | | *Terminalia bellirica* |
| 279 | බෙලි | வில்வம் | bael | *Aegle marmelos* |
| | | | | *Belou marmelos* |
| | | | | *Aegle marmelos* |
| 280 | බේදනම් | | | |
| 281 | බෝල | | Myrrh | *Commiphora myrrha* |
| 282 | මදටිය | ஆனைக்குண்டுமணி | Red Bead Tree | *Adenanthera gersenii* |
| | | | | *Adenanthera polita* |
| | | | | *Adenanthera pavonina* |
| 283 | මදනකාම | | Portwine Magnolia | *Liriopsis fuscata* |
| | | | | *Magnolia annonifolia* |
| | | | | *Magnolia fuscata* |
| 284 | ගොටුකොළ | வல்லாரை | Asiatic pennywort | *Centella asiatica* |
| | | | | *Centella boninensis* |
| | | | | *Centella asiatica* |
| 285 | මදුරුතලා | துளசி | holy basil | *Geniosporum tenuiflorum* |
| | | | | *Lumnitzera tenuiflora* |
